# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,884 — 1969 දෙසැම්බර් 12 වැනි සිකුරාද — 1969.12.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1923 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1988 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1951 | ආණ්ඩුවේ නොවන දන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දන්වීම් ... ... ... | 1966 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1986 | විවිධ දන්වීම් ... ... ... | 1988 |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම් පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙසු යන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා වලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරී කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා එවිනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම් සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. සඳහන් නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයෙ.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

අංකය : ඒ.බී. 86/එක්ස්. 2148/69.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පර්යේෂණ ආධුනික/පර්යේෂණ නිලධාරි තනතුරු

අංක 14,871 හා 69.9.12 දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම හා සම්බන්ධයි. ඉහත සඳහන් තනතුරු සඳහා මෙරට සහ විදේශ ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1969 දෙසැම්බර් මස 26 වෙනි දිනතෙක් දීර්ඝ කර ඇති බව මෙයින් දන්වමි.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

12–466/2—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ.බී. 90/එක්ස්. 2155/69.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### රසඥ තනතුර

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රසඥ තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

(ඒ) මෙරට ඉල්ලුම් පත්—1970 ජනවාරි 9 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්—1970 ජනවාරි මස 16 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″×4″ ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූ ද මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැක. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය ප්‍රිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**—

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :

වසකට රු. 4,080—360×12 සහ 480×10, 13,200 වසකට. රු. 11,280 වැටුප් පියවරෙහි දෙවෙනියක නැවතීමක් ද, රු. 8,880 සහ රු. 11,760 වැටුප් පියවරවලට කලින් කාර්යක්ෂමතා කඩඉම් ද ඇත.

**සටහන.**—ඉහත දක්වූ වැටුප් ක්‍රමයෙහි වසකට රු. 8,400 වැටුප් පියවර ඉක්මවා යැමට නම් තෝරා ගනු ලබන අයදුම්කරු, පිළිගත් විශ්ව විද්‍යාලයයක පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමා සහතිකයක් භූගත ජල රසායන විද්‍යා ක්ෂෙත්‍රය සම්බන්ධයෙන් ලබාගත යුතු වන්නේ ය. සේවයට බැඳෙන විට මෙම සුදුසුකම් ලබා සිටින අයදුම්කරුවන් හට ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි රු. 5,160 වැටුප් පියවර ආරම්භක වැටුප් පියවර ලෙස ඇතිව, සේවයට බැඳීමට හිමිකම් ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1970.1.9 වැනි දිනදී වයස අවුරුදු විසි දෙකට නොඅඩු විය යුතුය. ඉහළ වයස් සීමාව මූලික උපාධියක් දරන්නන් සම්බන්ධයෙන් අවුරුදු තිහක් වන අතර, පිළිගත් පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරන්නන් සම්බන්ධයෙන් අවුරුදු තිස් පහක් වනු ඇත. (රජයේ සේවයේ හෝ සංස්ථාවන් හි හෝ දැනටමත් ස්ථිර තනතුරු උසුලන්නවුන් කෙරෙහි මෙම වයස් සීමාව බලපානු නොලැබේ.)

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයයක රසායන විද්‍යාව පිළිබඳව පළමු වැනි පෙළ හෝ දෙවැනි පෙළ විශේෂ උපාධියක්, එසේ නැත්නම් ඒ හා සමාන සුදුසුකම් ලබා ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ෆද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු. :**

(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිනිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද "අ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණකොට ආපසු එවිය යුතු ය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය නොපිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හෝ අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

12–466/3—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ. 92/එක්ස්. 2156/69.

## පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය

### ඉංජිනේරු (යාන්ත්‍රික) තනතුරු

පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ ඉංජිනේරු (යාන්ත්‍රික) තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්—1970 ජනවාරි 9 වැනිදා.

(බී) විදේශ ඉල්ලුම් පත්—1970 ජනවාරි මස 16 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත් ෆෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දින යන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැක. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි වී හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(ඒ) මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිනු ඇත.

(බී) පත්වීම් දෙනු ලබන්නේ අවුරුදු 3ක ආධුනික කාලයකට යටත්වය.

(සී) තෝරාගනු ලැබූ අයදුම්කරු රජයේ සේවකයෙක් නම් පළමු වෙන්ම පත්වීම දෙනු ලබන්නේ නියමිත කාලයක වැඩ බැලීමේ පදනම මතය.

(ඩී) පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නියම කරනු ලබන ප්‍රමාණයක ඇපයක් තැබීමට තෝරාගනු ලබන අයදුම්කරුට සිදුවිය හැක.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :

(ඒ) වසකට රු. 11,280 දී දෙවර්ෂයක නැවතීමක් හා වසකට රු. 6,960 හා රු. 11,280 වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව වර්ෂයකට රු. 5,160—360 × 3—6,240/6,960—360 × 4 සහ 480 × 10 වසකට රු. 13,200 දක්වා.

නිලධාරියා ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සහචර සාමාජිකත්වය සඳහා තෝරා ගනු ලැබූ විට ඔහුට ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වසකට රු. 7,320 වැටුප ගෙවනු ඇත.

(බී) තෝරාගනු ලබන අයදුම්කරු, ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සහචර සාමාජිකයකු නම් (ඒ. ඇම්. අයි. මෙක්. ඊ.) ඔහුට ඉහත කී වැටුප් පරිමාණයේ වසකට රු. 7,320 වැටුප ගෙවනු ඇත.

(සී) (i) ඉංජිනේරුවරුන් (යාන්ත්‍රික) හට සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් (එනම්, යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සහචර සාමාජිකත්වය (ඒ. එම්. අයි. මෙක්. ඊ.) නොමැතිව ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වසකට රු. 10,800 අභිබවා යාමට සුදුසුකමක් නොමැත.

(ii) වසකට රු. 6,960 වැටුප් පියවරට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉම පසු කිරීමට ඉංජිනේරුවන් (යාන්ත්‍රික) දෙපාර්තමේන්තු කාර්ය සංවිධානය, ගිණුම් යනාදිය පිළිබඳ නියමිත පරීක්ෂණයකින් සමත් විය යුතුය. එසේ සමත් වීමට අපොහොසත් වීම වැටුප් වැඩිවීම විලම්බනය කිරීමට හේතු වනු ඇත.

සැ. යු.—සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිතව සේවයට ඇතුළත් වන ඉංජිනේරුවරුන් පත්වීමේ දිනයෙහි සිට අවුරුදු දෙකක් ඇතුළතදී මෙම පරීක්ෂණයෙන් සමත් විය යුතුවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තවිය යුතුය.

(ආ) 1970.1.9 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු එමෙන්ම අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්තවූවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

(ඇ) (i) ලංකා විශ්ව විද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු විෂයයන් සහිත ඉංජිනේරු උපාධියක් හෝ ඒ හා සමාන වෙනත් පිළිගත් ඉංජිනේරු උපාධියක් තිබීම,

හෝ

(ii) ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ උපාධිධාරී සාමාජිකත්වය හෝ සමාන සුදුසුකමක් තිබීම,

හෝ

(iii) I ශ්‍රේණියේ යාන්ත්‍රික මූලක තනතුරට උසස් කරනු ලැබීමට සුදුසුකම් ලැබෙන විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන කණිෂ්ඨ ශ්‍රේණිවල කාර්මික නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් (ඉංජිනේරු) සමත්ව තිබීම සහ ඊට අමතරව යාන්ත්‍රික මූලක ශ්‍රේණියේ අවුරුදු 10 ට නොඅඩු සේවා කාලයක් ඇතිව තිබීම.

සැලකිය යුතුයි.—1961 අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනත යටතේ ඉංජිනේරු තනතුරුවලට පත් කරනු ලැබ ඇති ඉංජිනේරුවන් ද මේ තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුස්සෝ වෙත්.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුයි.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එවීමේ කවදදයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සමග භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් නැතට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද "අ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියොත් අයදුම්කරුවෙකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදිය.
තැ. පෙ. 500.

12–466/4—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ 44/එක්ස්. 2158/69.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### සිවිල් ඉංජිනේරු II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අම්පාරේ "හාඩි" ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ සිවිල් ඉංජිනේරු II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 9 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 16 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දා වූද, මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුයි ;

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය ;

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන ;

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීමට සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුරු සථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

වාර්ෂිකව රුපියල් 4,080—360—රු. 8,400.

**සටහන් :**

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිධරයින් හෝ එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. වැනි පශ්චාත් උපාධි ලබා ඇත්තාවූ අය වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් ලැබීමට හිමිකම් ලබති ;

(ii) ගුරු අභ්‍යාස විද්‍යාලයක හෝ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක හෝ ලංකා කාර්මික විද්‍යාලයේ හෝ එවැනි උසස් තත්වයකට සමාන හෝ උසස් පිළිගත් ආයතනයක අවුරුදු 3 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති උපාධිධරයින්ට ද වාර්ෂිකව රු. 5,160 ක ආරම්භක වැටුපක් නියම කරනු ලැබේ ;

(iii) ඒ. එම්. අයි. සී. ඊ., ඒ. එම්. අයි. ඊ. ඊ. හෝ ඒ. එම්. අයි. යාන්ත්‍රික ඉංජිනේරු (ලන්ඩන්) වැනි සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇත්නම්, ඔවුන්ටද වර්ෂයකට රු. 7,320 ක ආරම්භක වැටුපක් හිමි වේ.

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු උපාධි ලත් II වැනි ශ්‍රේණියේ කථිකාචාර්යවරුන් ඔවුන්ගේ වැටුප් ක්‍රමයේ උපරිමය වන වර්ෂයකට රු. 8,400 වැටුප් පියවරට පැමිණ එක් අවුරුද්දක් එම වැටුප් පියවරෙහි සේවය කරනු ලැබුවේ නම්, ඔවුහු රු 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් සහිතව, අවුරුද්දකට රු. 10,800 ක වැටුප් පියවර දක්වා වැටුප් ලැබීමට හිමිකම් ලබති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(බී) 1970.1.9 වැනිදා තමන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ) ;

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු විද්‍යා විෂයයන් සහිතව ශාස්ත්‍රවේදී ඉංජිනේරු උපාධියක් (බී.එස්.සී. ඉංජිනේරු) හෝ (ii) ඒ. ඇම්. අයි. සී. ඊ. I වැනි හා II වැනි කොටස්වලින් සමත්වීම, හෝ
(iii) සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම, සහ
(iv) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු 3 ක කාලයක් ඇතුළතදී සිංහල භාෂාවේ ප්‍රවීණත්වයක් ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.) :

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක නැතහොත් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය ;

(ඩී) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

12–466/5—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ බී. 95/එක්ස්. 2160/69

## කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

### ප්‍රවාසන ගබඩා අධිකාරි තනතුර

කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ ප්‍රවාසන ගබඩා අධිකාරි තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(ඒ) මෙරට අයදුම්පත් : 1970 ජනවාරි මස 6 වැනිදා.

(බී) විදේශීය අයදුම්පත් : 1970 ජනවාරි මස 16 වැනිදා.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝරම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුකරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයන් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවය නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(ඒ) මේ තනතුර තාවකාලික එකකි. කෙසේ වෙතත් ඊට පත් කරනු ලබන අයදුම්කරුට පහත (බී), (සී) හි සඳහන් පුහුණු වීමේ කාලසීමාව සතුටුදායක ලෙස සම්පූර්ණ කොට එහි සඳහන් පරීක්ෂණයන්ගෙන් සමත් වූ විට ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පදනම මත ඇති කරනු ලබන ගබඩා අධිකාරි තනතුරට පත්කිරීමට සුදුසුවේ.

(බී) තෝරා ගන්නා ලද අයදුම්කරුට වරාය කොමසාරිස් විසින් තීරණය කරනු ලබන පාඨමාලාවක් හැදෑරීමට නියම කරනු ලැබේ. ඒ පුහුණුවීමේ කාලසීමාවේදී ඔහු විසින් ගබඩාවක, ගුදමක හා ගබඩා කාර්යාලයක ගණන් තැබීමේ හා සාමාන්‍ය ගබඩා වැඩ කෙරෙහි මනා දැනුමක් ලබාගත යුතුය.

(සී) ඔහු විසින් දෙපාර්තමේන්තුවේ උපදෙස්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ව්‍යවස්ථා, කාර්ය විධාන සංග්‍රහයේ රෙගුලාසි, හා මුදල් රෙගුලාසිවලින් වරාය කොමිසමට අදාල වන්නාවූ කොටස් පිළිබඳව දැනීම පිරික්සීම පිණිස පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකින් ද තුන් අවුරුදු පුහුණුවීමේ කාලසීමාව තුළදී සම්මාන සහිතව සමත්විය යුතුය.

(ඩී) දෙපාර්තමේන්තු වැඩ පිළිබඳව පළ පුරුද්දක් සහ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට ඉවහල්වන කවර රාජකාරියක හෝ යෙදීමට ඔහු සමත් විය යුතුය.

(ඊ) තෝරා පත්කරගනු ලබන අපේක්ෂකයා කෙටි දැනුම් දීමකින් පසු තනතුර භාරගතයුතුවේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය. වර්ෂයකට රුපියල් 6,720—12×360—රු. 11,040.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970.1.9 දිනට අවුරුදු 21 ට නො අඩු හා 30 ට නො වැඩි බව. (දැනට රජයේ සේවයේ නියුක්ත අයට මේ වයස් සීමාව බල නොපායි.)

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු බව.

**සටහන.**—වර්ෂයකට රුපියල් 3,900—180×8 හා 240×4—රු. 6,300 වැටුප් ක්‍රමයට අඩු නොවන වැටුප් ක්‍රමයක් මත ගබඩා භාරකරුවෙකු වශයෙන් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට ඉහත (4සී) වෙනි ඡේදයේ සඳහන් සුදුසුකම් නැති වුවත්,

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ii) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් පොදු අධ්‍යාපනික සහතික පත්‍ර සාමාන්‍යපෙල) විභාගයෙන්, හෝ

(iii) ඊට සමාන හෝ උසස් විභාගයකින් හෝ සාමාර්ථයක් තිබේනම් මේ තනතුර සඳහා ඉල්ලුම් කිරීමට පුළුවන.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත ජාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂකතැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැලකිය යුතුයි :**

(1) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුයි.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්ත මේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත්, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම් කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ. පෙ. 500, කොළඹ 1,
1969 දෙසැම්බර් මස 4 වැනි දින.

12–466/6—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 67/එක්ස්.2161/69

## නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

**සහකාර නීති කෙටුම්පත් සම්පාදක (සිංහල පරිවර්තන) තනතුර**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක (සිංහල පරිවර්තන) තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි 9 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 16 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලි ව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියනු ලද්දා වූ ද මුද්දර නොගැසූවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුයි.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි ය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි විකල්ප ඇත.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

(ඒ) තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගනු ලැබූ අපේක්ෂකයා විසින් වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(බී) තෝරා ගනු ලැබූ අපේක්ෂකයා අවුරුදු තුනක කාලයක් සඳහා ආධුනිකයකු වශයෙන් පත් කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :

වර්ෂයකට රු. 11,520 න් පටන් ගෙන රු. 480 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 9 ක් සහ රු. 600 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 3 ක් මගින් රු. 17,640 තෙක් වැඩිවේ. (රු. 14,400 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද ඇත.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(බී) 1970.1.9 වැනි දිනට වයස අවුරුදු 45 කට නොවැඩි බව ; (රජයේ සේවයෙහි නියුක්ත වූවන්ට මේ වයස් සීමාව බල නොපානු ඇත.)

(සී) අවුරුදු පහකට අඩු නොවන කාලයක් වෘත්තියෙහි යෙදී සිටි අධිනීතිඥවරයකු බව ; හා

(ඩී) විෂයයක් වශයෙන් සිංහල ඇතුළත් ව, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු බව.

**සටහන.**—නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි, අවුරුදු පහක සේවයක් ඇති, නිලධාරීන්ට ඉහත සඳහන් (සී) හා (ඩී) උප ඡේදයන්හි දැක්වෙන අනිකුත් සුදුසුකම් ඇතහොත් අධිනීතිඥ වෘත්තියෙහි අවුරුදු පහක කාලයක් සේවයෙහි යෙදී නො සිටිය ද මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබෙනු ඇත.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු ය.

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතු ය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

**සැ.යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන තෙක් ඔහු වෙත කෙලින් ම ලියා එවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්ත මේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ඇපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 වැනි දින,
කොළඹ 1, ගාලුමුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
තැ. පෙ. 500,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

12–466/7—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ79/එක්ස්. 2162/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලයන්හි සංස්කාරක තනතුරු

අධ්‍යාපනික හා සංස්කෘතික අමාත්‍යාංශයේ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයන්හි සංස්කාරක තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන් ඉදිරිපත් කළ යුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(1) මෙරට අයදුම්පත් 1970 ජනවාරි 9 වැනි ද.

(2) පිටරට අයදුම්පත් 1970 ජනවාරි මස 16 වැනි ද.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නො ගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

**2. වැටුප් දීමනා හා සේවා කොන්දේසි :**

(1) මෙම තනතුර සඳහා රු. 6,720—12×360—රු. 11,040 වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිතය.

(2) තෝරාගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය. දැනට ඇබෑර්තු ඇත්තේ දෙහිවල, ගාල්ල, කුලියාපිටිය, කෑගල්ල, පොල්ගොල්ල සහ පලාලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලවලය. තෝරාගනු ලබන අපේක්ෂකයින් මේ විශ්ව විද්‍යාලවලට පත් කරනු ලැබේ.

**3. බඳවා ගැනීමේ කොන්දේසි :**

(1) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(2) මෙම පත්වීම ප්‍රථම කොට අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

**4. අවශ්‍ය සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1970.1.9 වැනි දිනට වයස අවුරුදු 24 ට නො අඩු බවට හා අවුරුදු 45 ට නො වැඩි බවට. (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරන අයගේ අයදුම්පත් උපරිම වයස් සීමාව ගැන නොතකා සලකා බලනු ඇත.)

(ආ) පහත දැක්වෙන සුදුසුකම් තිබෙන බවට :—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක සිංහල/දෙමළ විෂයයක් වශයෙන් ඇති උපාධියක් ;

සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙ.) හෝ ඊට උසස් ශාස්ත්‍රීය විභාගයකදී ඉංග්‍රීසි විෂයයෙන් සාමාර්ථයක්

හෝ

ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධියක් සමත් වී තිබීම

සහ

(iii) භාෂා පරිවර්තන වැඩ පිළිබඳ අවුරුදු 5 කට නො අඩු පළපුරුද්දක්.

(ඇ) දෙහිවල, ගාල්ල, කෑගල්ල, පොල්ගොල්ල හා කුලියාපිටිය කණිෂ්ඨ විශ්ව විද්‍යාලයන්හි තනතුරු සඳහා අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. පලාලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලයෙහි තනතුරු සඳහා අයදුම්කරුවන්ට දෙමළෙන් වැඩ කිරීමට මනා දැනීමක් තිබීම අවශ්‍ය ය. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාලපරිච්ඡේදයක් තුළදී සිංහල හෝ දෙමළ (අදාළ විය හැකි පරිදි) පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිදුර ප්‍රවීණතාවයක් ලබාගන්නා ලෙස පත්වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකි ය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරණ ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය සහ උසස්ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඉ) සිංහලෙන් සමත් වූ උසස්ම විභාගයේ සහතික පත්‍රය.

**සංලක්ෂ්‍යය :**

(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර සේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් නැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිද බලනු මැනවි.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් හෝ විය යුතුය.

(ඩී) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුනට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුනට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය,
තැ. පෙ. 500.

12–466/9—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

ඒබී. 103/එක්ස් 2164/68.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### ගණක ශාස්ත්‍ර I වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලංකා කාර්මික විද්‍යාලයේ ගණක ශාස්ත්‍ර I වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර: 1970 ජනවාරි මස 9 වැනි දා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර: 1970 ජනවාරි මස 16 වැනි දා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දා වූ ද, මුද්දර නො ගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයා ගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලතදී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි .**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය.

**නව ඒකාබද්ධ වැටුප් ක්‍රමය :**

වර්ෂයකට රු. 11,520—480—රු. 16,320

1969.10.1 වැනි දිනට පෙර මීට අනුරූප මූලික වැටුප් ක්‍රමය.

රු. 8,880—480—රු. 13,200

4. **අවශ්‍ය සුදුසුකම් :—**

සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටු දායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970. 1. 9 වැනිදා තමන්ගේ වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ( දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.

(සී) (i) එංගලන්තයේ සහ වේල්ස්හි හෝ ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ සහතික ලත් සහ අනුබද්ධිත ගණකාධිකාරීන්ගේ සමාගමේ සම්බන්ධිත හා සාමාජිකත්වයක් ලබා තිබීම (ඒ.සී.ඒ. හෝ ඒ.ඒ.සී.සී.ඒ.)

(ii) ගුරු අභ්‍යාස විද්‍යාලයක හෝ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක හෝ ලංකා කාර්මික විද්‍යාලක වැනි පිළිගත් උසස් තත්ත්වයේ ආයතනයක හෝ ඊට සමාන හෝ උසස් පිළිගත් ආයතනයක අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්ද ද හා/හෝ රජයේ හෝ වෙළෙඳ ආයතනයක ගණකාධිකරණය පිළිබඳ වගකිවයුතු තත්ත්වයක ප්‍රායෝගික පළපුරුද්ද.

(iii) සිංහලෙන් ඉගැන්වීමට හැකියාව හෝ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ඇතුළත සිංහලෙන් ඉගැන්වීමට හැකි ප්‍රවීණතාවය ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

සැ : යු :

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුන දරණ) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.
තැ. පෙ. 500.

12–466/10—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 104/එක්ස්. 2165/69

## රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය

### පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂක තනතුර

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂක තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1970 ජනවාරි මස 9 වැනිදා

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර—1970 ජනවාරි මස 16 වැනිදා.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝරම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දා වූ මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලතදී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරියෙක් ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔහු විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා සේවා කොන්දේසි :**

(ඒ) තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, පත්වීම අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් වේ. වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවනු ලැබේ.

(බී) තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීමෙන් අවුරුදු 3ක් ඇතුලත දී සිංහල/හා/හෝ දෙමළ හෝ පරීක්ෂණයෙකින් සමත් විය යුතුය. (එම පරීක්ෂණයේ තත්ත්වය, ලංකා පරිපාලන සේවයේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ තත්ත්වයට සමානය.)

3. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අදල වැටුප් ක්‍රමය මෙසේය :—

වර්ෂයකට රුපියල් 6,720—360×12—11,040. වර්ෂයකට රුපියල් 9,960 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ලබා ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) 1970 ජනවාරි මස 9 වැනි දිනට තමාගේ වයස අවුරුදු 20 ට නො අඩු බව හා අවුරුදු 30 ට නොවැඩි බව. (දැනට මත් රජයේ සේවයේ නියුක්තවූවන් කෙරෙහි මෙහි උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(බී) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු බව හා උපාධියට ගත් විෂයයන්ගෙන් එකක් රසායන විද්‍යාව බව, (ඉංජිනේරු විෂයයන් පිළිබඳව ඇති දැනීම අතිරේක සුදුසුකමක් වනවා ඇත.)

(සී) විශිෂ්ඨ චරිත ශුද්ධියක් ඇති බව හා

(ඩී) ශාරීරික නිරෝගී බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුයි.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 දින,
තැ. පෙ. 500,
කොළඹ 1, ගලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

12–466/11—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ ඒ. 101/එක්ස්. 2167/69.

## පළාත් පාලන අමාත්‍යාංශයේ, නගර හා ග්‍රාම නිර්මාන අංශයේ සහකාර ගෘහ නිර්මාන ශිල්පී

පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාන අංශයේ සහකාර ගෘහ නිර්මාන ශිල්පී තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1970 ජනවාරි මස 9 වැනිද.

(බී) විදේශ ඉල්ලුම් පත්‍ර—1970 ජනවාරි මස 16 වැනිද.

**සටහන :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත් පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූද, මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පුළුවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම දැරිය යුතු වෙයි.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරුගෙන් වැන්දඹු හා අනත්දරු අරමුදලට දායක මුදල් අඩුකර ගන්නවා ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය.

(i) රු. 12,000 හා රු. 14,880 (වාර්ෂික) වැටුප් පියවරවලට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව, රු. 7,800 න් පටන් ගෙන, රු. 360 වාර්ෂික වැටුප් වැඩිවීම 9 කින් හා රු. 480 (වාර්ෂික) වැටුප් වැඩිවීම් 10 කින් රු. 16,320 දක්වා වැඩිවේ.

(ii) රු. 11,520 (වාර්ෂික) වැටුප් පියවර ඉක්මවා යෑම සඳහා සම්පූර්ණ වෘත්තිය සුදුසුකම් ලබා ගත යුතුය.

(iii) සම්පූර්ණ වෘත්තිය සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් රු. 8,520 ආරම්භක වැටුප් පියවරේ පිහිටුවනවා ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයකින් සහ හොඳ ශාරීරික සනීපයකින් යුක්ත බව,

(බී) 1970 ජනවාරි මස 9 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 කට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙම වයස් සීමාව බලපවත්වන්නේ නැත,

(සී) (i) බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාන ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ සහාගි සාමාජිකයෙක් බව, හෝ

(ii) ඕස්ට්‍රේලියානු ගෘහ නිර්මාන ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ සහාගි සාමාජිකයෙක් බව, හෝ

(iii) බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාන ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ හෝ ඕස්ට්‍රේලියානු ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ හෝ අවසාන පරීක්ෂණයේ කොටස් I හා II සමත්වී ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාර ගනු නොලැබේ),

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය,

(ඩී) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැලකිය යුතුයි.**

(i) අයදුම්පතකට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමතමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සමග භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලිය කියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර, මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූද, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති 3 ක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුන බවට දැන්වීමක් නොලැබෙන්නා වූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බැලීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

සී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 වැනි දින,
කොළඹ 1,
තැ. පෙ. 500,
ගාලු මුවදොර මහලේකම් ගෙඩානැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

12–466/12—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 82/එක්ස්. 2168/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තනතුර (වාණිජ විද්‍යා) තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ.පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 9 වැනිදා.
(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 16 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කායඹාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්තිය හා කොන්දේසි :—**

(i) මෙම තනතුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ස්ත්‍රියක් මෙම තනතුරට පත් කළහොත් ඇයට අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභයක් හිමිවන අතර ඇය විසින් ස්වකීය වැටුපෙන් සියයට පහක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතුයි. තෝරාගනු ලබන අයදුම්කරු දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයෙහි යෙදී නොසිටින් නම් අවිස්ථාවෝචිත පරිදි අවුරුදු තුනක් ආධුනික හෝ පරීක්ෂා කාලයකට යටත්ව පත්කරනු ලබනවා ඇත. අවුරුදු 10 ක් සේවය සම්පූර්ණ කිරීමට මත්තෙන්, අර්ථ සාධක අරමුදලට තවදුරටත් දායකවීමේ හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරුවීමේ හෝ සිය මනාපය පරිදි ගැහැණු නිලධාරියෙකු විසින් කළ යුතුය. ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබිය හැකි ගුරුවරියක ලෙස හා/හෝ අර්ථ සාධක අරමුදල් හිමි තනතුරක ඇය දැනට අවුරුදු 10 ක් සේවය කර ඇත්නම් මෙම පත්වීම ලැබ මාස 6 ක් ඇතුලත ඇගේ මනාපය පරිදි තීරණයක් ගත යුතුයි.

3. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය. රු. 11,040 ක වාර්ෂික වැටුපකින් පටන්ගෙන රු. 480 වාර්ෂික වැටුප් වැඩිවීම් 11 කින් යුක්තව රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇතිව රු. 16,320 දක්වා.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970.1.9 වැනි දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපායි.

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ පළමුවැනි පෙළ හෝ II වන පෙළ ගෞරව උපාධි ධරයෙකු හෝ පුහුණු වාණිජ විද්‍යා හෝ ආර්ථික විද්‍යා උපාධිධාරියකු හෝ පශ්චාත් උපාධි සුදුසුකම් ඇති වාණිජ විද්‍යා හෝ ආර්ථික විද්‍යා උපාධිධාරියෙකු විය යුතුය.

(ඩී) ජ්‍යෙෂ්ඨ/අ. පො. ස. විභාගයේදී හෝ වෙනත් උසස් විභාගයක දී තමන් රාජකාරි කරන භාෂාවෙන් සාහිත්‍ය හෝ භාෂාව පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමර්ථ වී සිටිය යුතුය.

(ඊ) අධ්‍යාපන උපදේශක වරයෙකු වශයෙන් අවුරුදු 3 කට හෝ I ශ්‍රේණියේ විදුහල්පති වරයෙකු වශයෙන් අවුරුදු 5 කට හෝ, කණිෂ්ඨ කාර්මික ආයතනයක විදුහල්පති වරයෙකු වශයෙන් අවුරුදු 5 කට හෝ ගුරු විද්‍යාල කථිකාචාර්ය වරයෙකු වශයෙන් අවුරුදු 8 කට හෝ නොඅඩු සේවයක් ඇත්තෙකු විය යුතුය.

**සංලක්ෂ්‍යය :**

(i) එහෙත් අධ්‍යාපන සේවයෙහි අවුරුදු 10 කට අඩු සේවයක් ඇති අපේක්ෂකයෙකු මේ තනතුරු සඳහා සලකා නොබලනු ඇත.

(ii) අවුරුදු 15 ක සේවයක් ඇත්තාවූ ද, සියළුම කාර්යක්ෂමතා කඩඉම් සමත්වී ඇත්තාවූ ද, වාණිජ විද්‍යා හෝ ආර්ථික විද්‍යා උපාධිධාරී මාණ්ඩලික අධ්‍යාපන නිලධාරිවරයෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවයක් ඇත්තාවූ හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ විද්‍යා හෝ ආර්ථික විද්‍යා පශ්චාත් උපාධි සහතිකය ඇතිව මාණ්ඩලික අධ්‍යාපන නිලධාරිවරයෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 7 ක සේවයක් ඇත්තාවූ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීන්ට ද මේ තනතුර සඳහා ඉල්ලුම් කළ හැක.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ නා.නගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතිකය.

**සැළකිය යුතුයි :**

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලිය කියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට

පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලිය කියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුනට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය,
තැ. පෙ. 500.

12–466/13—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 98/එක්ස්. 2170/69.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 9 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 ජනවාරි මස 16 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමානයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවා වූද ලිපුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයා ගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**— මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම් ප්‍රථමයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3 ක ආධුනික කාලයක් මතය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :

(i) ලංකා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය උපාධිධාරීන්ට : ඒකාබද්ධ වැටුප් ක්‍රමය :—

රුපියල් 6,720 පටන්ගෙන වර්ෂයකට රු. 360 බැගින් වැටුප් වර්ධකයන් 12 ක් හා රු. 480 බැගින් වැටුප් වර්ධකයන් 5 ක් ලබා රු. 13,440 දක්වා.

(සටහන : 1969.10.1 පෙර මීට අනුරූප මූලික වැටුප් ක්‍රමය රු. 4,080—360×12 සහ 480×5—10,800 වර්ෂයකට)

සටහන : රු. 11,040 (1969.10.1 පෙර අනුරූප වැටුප් පියවර රු. 8,400) ඉක්මවා යෑමට, පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරූ හෝ නියමිත දෙපාර්තමේන්තු විභාගයකින් සමත් විය යුතුය.

(ii) වෙනත් විශ්ව විද්‍යාලවල පශු වෛද්‍ය උපාධිධරයන්ට :— භාණ්ඩාගාරයේ උපදෙස් අනුව වැටුප් ප්‍රමාණය නියම කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1970. 1. 9 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු බවත්, අවුරුදු 35 ට නොවැඩි බවටත් (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලද්දෙකු බවටත්.

**සැ. යු.**—ලංකාවේ විශ්ව විද්‍යාලවල අවසාන පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගෙන්ද අයදුම්පත් භාරගනු ලැබේ. එහෙත් විශ්ව විද්‍යාලයේ ප්‍රතිඵල නිකුත් කල වහාම එම පරීක්ෂණයෙන් තමා සමත්වී තිබේද යන වග ඔවුන් විසින් මා වෙත දැනුම් දිය යුතුය. නොඑසේ නම් ඔවුන්ගේ ඉල්ලුම් පත් සලකා බලනු නොලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු **නොලැබේ.)**

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ කුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ඇපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද අයදුම් කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 4 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දිය.
තැ. පෙ. 500.

12–466/14—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුද්ධ හමුදාවේ නීති නිලධාරි තනතුර

ලංකා යුද්ධ හමුදාවේ නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත් කරගනු ලබන අපේක්ෂකයා ඔහුගේ පළපුරුද්ද හා/හෝ ඔහුට සතු වෙනත් විශේෂ සුදුසුකම් අනුව ලංකා යුද්ධ හමුදාවේ ලුතිනන් හෝ කපිතාන් නිලයෙහි ස්ථිර අධිකාරී පත්වීමක් පිරිනමනු අතර ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායට ඇතුළත් කරනු ලැබේ.

3 (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත්කරගනු ලබන ඉල්ලුම්කරු, 1961 යුද හමුදා වැටුප් සංග්‍රහයෙහි නියම කර ඇති පරිදි ඔහුගේ නිලයට අනුකූල වූ වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. මේජර් නිලය දක්වා ගෙවනු ලබන මූලික වැටුප් ප්‍රමාණයන් පහත දක්වා ඇති පරිදි වේ :—

ලුතිනන්—වාර්ෂික වැටුප් රු. 4,860—රු 180 වැඩිවීම් 2 සහ රු. 360 වැඩිවීම් 1—රු. 5,580.

කපිතාන්—වාර්ෂික වැටුප රු. 6,660—රු. 180 වැඩිවීම් 6—රු. 7,740.
මේජර්—වාර්ෂික වැටුප රු. 8,820—රු. 180 වැඩිවීම් 6—රු 9,900.

(ආ) පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ :—

(i) නිලධාරීන් සඳහා වූ නේවාසිකාගාරයක නවාතැන් පහසුකම් සලසා නොමැති නිලධාරීන්ට, රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට අනුව, ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර නේවාසිකාගාරයක ඉඩකඩ පහසුකම් ලබා දී ඇති නිලධාරීන්ට යුද හමුදා වියදමෙන් කෑම් බීම් සපයනු ලබන අතර, ඔවුන්ට මෙම දීමනා අහිමි වේ.

(ii) සේවා හෝ රජයේ විවාහක නිවාසයක් ලබා දී නොමැති විවාහක නිලධාරියෙකුටත්, නේවාසිකාගාර ඉඩකඩ පහසුකම් හෝ ඔහුගේ පදවියට නියමිත විශේෂ නිවාසයක් ලබා දී නොමැති අවිවාහක නිලධාරියකුටත්, රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට අනුව සහ නියමිත කොන්දේසි උඩ ගෙවල් කුලී දීමනා.

(iii) නේවාසිකාගාරයක තුළ වාසය කිරීමට අණ ලැබූ, නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබ, යුද හමුදා වියදෙමන් කෑම් බීම් සපයනු ලබන කාල පරිච්ඡේදයන් තුළ සෑම සම්පූර්ණ පැය 24 කාලයක් වෙනුවෙන් විවාහක නිලධාරියෙකු දිනකට රු. 1.50 ගෙවීම් ප්‍රමාණය අනුව වෙන්වීමේ දීමනාවක් ගෙවනු ලැබේ. එවැනි කාලපරිච්ඡේදයන් තුළ ජීවනාධාර, විශේෂ ජීවනාධාර, යැපීම් සහ නවාතැන් ගාස්තු ගෙවනු නොලැබේ.

(iv) රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට සහ නියමිත කොන්දේසිවලට අනුව ගමන් වියදම් දීමනා (යැපීම්, නවාතැන්, සැතපුම් ගාස්තු, ස්ථාන මාරු දීමනා) ගෙවනු ලැබේ.

(v) 1961 යුද හමුදා වැටුප් සංග්‍රහයෙහි නියම කර ඇති පරිදි අනිකුත් දීමනා (ඇඳුම් පැළඳුම්, නිල ඇඳුම්, නඩත්තු හා මෙහෙකරු දීමනා) ගෙවනු ලැබේ.

(ඇ) නිලධාරීන්ගේ වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත :—

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

(ii) 1949 ඔක්තෝබර් මස 10 වන දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි.

(iii) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය,

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද්ධ හමුදා මූලස්ථානයෙන් ලබා ගත හැක.

4. අයදුම්කරුවන් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය :—

(අ) **ජාතිය.**—අපේක්ෂකයන් ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ආ) **වයස.**—අපේක්ෂකයන් 1969 දෙසැම්බර් 31 වැනි දිනට වයස අවුරුදු 28ට නොවැඩි විය යුතුය.

(ඇ) **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.**—අපේක්ෂකයන් අද්වකාත්වරුන් හෝ ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරුවරුන් විය යුතු අතර නීතිඥ මණ්ඩලයේ සාමාජිකයෙක් සේ අඩු වශයෙන් අවුරුදු 4ක කාලසීමාවක් යෙදී සිටි පළපුරුද්දක් ඇති අය විය යුතුය.

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය.**—යුද්ධ හමුදාවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වයක් අපේක්ෂකයන්ට තිබිය යුතුය.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම්පත් තම අත් අකුරින් විය යුතු අතර, 1969 දෙසැම්බර 31 වැනි දින දවල් 12ට හෝ ඊට පෙර ලැබෙන සේ යුද හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම් පත් බහාලන කවරයේ "යුද්ධ හමුදාවේ නීති නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ. අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

6. රාජකීය ලංකා නාවික හමුදාව හා රාජකීය ලංකා ගුවන් හමුදාව ඇතුළත්, රජයේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, යම්කිසි නිලධාරියෙකු තෝරා පත් කර ගනු ලැබුව හොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළ හොත්, රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුදා විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම්පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතික.

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්. මෙම සහතික පත් ඉල්ලුම්කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන්ගෙන් මෑත දී ලබා ගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා, අවශ්‍ය වුව හොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත් කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරා ගත් ඉල්ලුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරන ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවනට, එය පවත්වන ස්ථානය. දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු නොලබන ඉල්ලුම් කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9 තෝරා පත්කරගනු ලබන ඉල්ලුම්කරු විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

10. තෝරා පත් කර ගනු ලබන අයදුම්කරු හමුදා පුහුණුවක් ලබා ගැනීමට හා මොනයම් හමුදා ඒකකයක රීති සම්බන්ධ කටයුතු කිරීමට බැඳී සිටිය යුතු අතර දිවයිනේ මොනයම් පළාතක වූවත් සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය,

11. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදා ආඥාපති වෙනුවට.

1969 දෙසැම්බර් 4 දින.

**ලංකා යුද්ධ හමුදාවේ නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය (ලාංකිකයෙකු වූයේ පෙළපතින්ද ? නැතහොත් ලියා පදිංචි කිරීමෙන්ද ලියා පදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න) :————.

3. ලිපිනය :————.
කාර්යාලයේ :————.
වාසස්ථානයේ :————.

4. උපන් දිනය :—
1969 දෙසැම්බර 31 වැනි දිනට වයස :————.
අවුරුදු :——, මාස :——, දින :————.

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය සහ දැන් ලිපිනය :————.
මවගේ :————.
පියාගේ :————.

6. ඔබ විවාහකද ? අවිවාහකද ? :————.

7. පාසැලේදී හෝ විශ්වවිද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාල දක්ෂ ව්‍යාපාරයන් හී හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.

11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙළෙහිද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද ? :————.

12. ඔබගේ පාසැල් සමය විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—
පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.
ඇතුල් වූ දිනය :————.
අස්වූ දිනය :————.
සමර්ථ වූ ප්‍රසිද්ධ පරීක්ෂණ :————.

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස් වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—
ස්වාමි පක්ෂය :————.
රැකියාවේ ස්වභාවය :————.
සේවය කළ කාලය—— දින සිට ——දින දක්වා.

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12–465—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : එස්. බී/ඊ.

**අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව**

**නාරාහේන්පිට පිහිටි පළතුරු කම්හලේ ෆෝර්මන් තනතුර**

මෙම දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට පිහිටි පළතුරු කම්හලේ ෆෝර්මන් තනතුර සඳහා මෙහි පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් ම විසින් භාර ගනු ලැබේ.

2. වැටුප් **පරිමාණය.**—වර්ෂයකට රු. 5,736—144×6—180×8—8,040ක ඒකාබද්ධ වැටුප් ක්‍රමය මත වැටුපක් මේ තනතුර සඳහා හිමි වේ.

69.10.1 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,180—120×6—180×8—5,340 වේ.

3. **වයස් සීමාව.**—1969. 11. 1 දිනට අවුරුදු 20කට නොඅඩු හා 35කට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(1) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක්.

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය හෝ සමාන සහතිකයක්.

(ඇ) පළතුරු හා ආහාර සකස් කර ගැනීමේ කර්මාන්තයට සම්බන්ධ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳ අවුරුදු 8ක පළපුරුද්දක් තිබීම; හෝ

(2) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක්.

(ආ) රජයේ හෝ පෞද්ගලික අංශයේ කර්මාන්ත ශාලාවක යටත් පිරිසෙයින් අවුරුදු 3 ක් වත් ආධුනිකයෙකු වශයෙන් සේවය කර තිබීම.

(ඇ) පළතුරු හා ආහාර සකස් කර ගැනීමේ කර්මාන්තායතනයක යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳ අවුරුදු 10ක පළපුරුද්දක් තිබීම; හෝ

(3) මෙහි පහත සඳහන් සුදුසුකම් ඇති දෙපාර්තමේන්තු සේවකයින් මෙම තනතුර සඳහා තෝරා ගැනීමට සලකා බැලීම සඳහා සුදුස්සෝ වෙති.

(අ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටීම,

(ආ) පළතුරු හා එළවළු සකස් කර ගැනීමේ කර්මාන්තායතනයක යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳ අවුරුදු 12ක පළපුරුද්දක් තිබීම. මෙයින් යටත් පිරිසෙයින් අවුරුදු 5ක් වත් පරිපාලන තත්ත්වයක විය යුතුය.

**සටහන.**—ඉහත 1(ඇ), 2(ඇ) සහ 3(ආ) හි සඳහන් යන්ත්‍රෝපකරණ, අනිකුත් ඒවා අතර පිත් සලස්වා ගැනීම, ද්‍රව්‍ය සකස් කිරීම, කැපීම, කල්ක කිරීම, පෙරීම, සිල් තැබීම, දුම් බොයිලේරු හා විදුලි සෝධන යන්ත්‍ර ඇතුළත් විය යුතුය.

5. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහතිකය වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල පිටපත් (මුල් පිටපත් නොව) එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. බෞතීස්ම සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතික පත්‍ර හෝ භාර ගනු නොලැබේ.)

(ආ) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඇ) කාර්මික හා වෘත්තීය දැනුම පිළිබඳ සහතික පත්‍ර.

(ඈ) මෑතකදී ලබා ගත්තා ලද චරිත සහතික පත් 3ක්.

7. මෙම ගැසට් පත්‍රයේ පළමු වන කොටසේ දෙවන ඡේදයේ මුලින් දැක්වෙන රාජ්‍ය සේවයේ තනතුරු වලට පත් කිරීම පිළිබඳ සාමාන්‍ය කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කර ගත් අයදුම්පත්, ස්වකීය අත් අකුරින්ම සම්පූර්ණ කර 1969 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර අලෙවි කිරීමේ කොමසාරිස්, තැ. පෙ. 562, කොළඹ 1 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කේ. බී. දිසානායක,
අලෙවි කිරීමේ කොමසාරිස්.

1969. 12. 4 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

### ආදර්ශ අයදුම්පත් ආකෘතිය

1. සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නම :————.
   (ආ) වෙනත් නම් :————.

2. පෞද්ගලික ලිපිනය :————.

3. උපන් දිනය :————.
   69.11.1 දිනට වයස : අවු.——, මාස——, දින :————.

4. ජාතිය :————.

5. ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නෙහිද ? :————.
   එසේ නම් : (අ) උත්පත්තියෙන් ද :————.
   (ආ) ලියාපදිංචි වීමෙන් ද ? :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. කාර්මික සුදුසුකම් :————.

8. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර (දින සහිතව සත්‍ය හා නිවැරදි විස්තර දැක්විය යුතුය) :————.

9. දැනට රක්ෂාවක් කරයි නම් එය :————.

10. කලින් රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ රජයේ අර්ධපාලනය පිට පවත්නා කිසියම් ආයතනයක සේවය කර ඇත් නම් ඒ පිළිබඳ විස්තර :————.

11. නිවේදනයේ 6(ආ) අනුව චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරු :————.
   (1)
   (2)
   (3)

මෙම අයදුම් පතේ සඳහන් කොට තිබෙන සියලුම විස්තර නිවැරදි හා සත්‍ය බව මම සහතික කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතු වන බව ද මම හොඳාකාර දන්නා බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–391—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය 1 වන, II වන ශ්‍රේණිවල වැඩ උප පරීක්ෂක තනතුරු**

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ I වන ශ්‍රේණියේත්, II වන ශ්‍රේණියේත් වැඩ උප පරීක්ෂක තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි මතු දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුකරණයෙන් පිළියෙල කළ යුතු අයදුම් පත් 1969.12.31 වන දා හෝ ඊට කලින් හෝ කොළඹ 1, තැ. පෙ. අංක 500 හිමි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලැබිය යුතුය.

2. **වැටුප්, දීමනා සහ සේවා කොන්දේසි.**—මේ තනතුරුවලට අයත් වැටුප් ක්‍රම මෙසේ ය:—

I වන ශ්‍රේණිය—අවුරුද්දකට රු. 5,304 ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇතිව, අවුරුද්දකට රු. 4,152—16×144—රු. 6,456 කි.

II වන ශ්‍රේණිය—අවුරුද්දකට රු. 3,540—18×90—5,160 කි.

3. **සේවය නියුක්ත කරවීමේ වගන්ති** :—

(i) මේ තනතුරු විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරු වේ.

(ii) දැනුම් දී ඉතා කෙටි කාලයකින් පත්වීම් බාරගන්නා ලෙස, තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට නියම කරනු ඇත.

4. **තිබිය යුතු සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකු විසින් ම තමා—

(i) (අ) 1969.12.31 වනදාට වයසින් අවුරුදු 21 ට නො අඩු 30 ට නොවැඩි බවටත් (දෙපාර්තමේන්තු සේවකයින්ට මේ වයස් සීමාව නොයෙදේ.),

(ආ) යහපත් චරිතයකින් හා මනා කායික සෞඛ්‍යයෙන් හෙබි බවටත්,

(ii) කාර්මික විද්‍යාලයෙක සිවු අවුරුද්දකට නොඅඩු වෙන් අල්ලන, සිවිල් ඉංජිනේරු පාඨමාර්ගයක් සඵල ලෙස නිමවා ඇති බවටත්, නැතහොත්

(iii) උප පරීක්ෂක ශ්‍රේණියට පත් කරනු වස් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය ඉංජිනේරු වැඩ පිළිබඳ දෙපාර්තමේන්තු විභාගයෙන් එගොඩ වී, දිය සැපයුම් යෙදුම්, දිය බස්නා යෙදුම්, පල්දෝරු යෙදුම්, යන කිසිවකින් ඇවුරුදු පළපුරුද්දක් ලබා ඇති බවටත්, නැතහොත්

(iv) ඉංජිනේරු වැඩ සහ ගොඩනැගිලි වැඩ පිළිබඳ ඇවුරුදු පළ පුරුද්දක් සමඟ, බිම් මැනුම I සහ II ගොඩනැගිලි කර්මාන්තය I සහ II නොහොත් සනීපාරක්ෂා ඉංජිනේරු වැඩ I සහ II, යන විෂය ඇතුළත් කොට, ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි පාඨ මාර්ගය නොහොත් ඊට ඉහළ පාඨ මාර්ගයක් සපල ලෙස නිමවා ඇති බවටත්, නැතහොත්.

(v) බිම් මැනීම සහ මට්ටම් ගැනීම පිළිබඳ සර්වේයර් ජනරාල් තුමාගේ ලයිසන් පත ලැබී, දිය සැපයුම් සහ ඉදිකිරීම් වැඩ වැනි ගොඩ නැංවීම් පිළිබඳ ඇවුරුදු පළපුරුද්දක් ලබා තිබෙන බවට, නැතහොත්

(vi) කණිෂ්ඨ පාඨශාලා සහතික විභාගයෙන් වත් එගොඩ වී දිය බස්නා වැඩ හෝ පල්දෝරු වැඩ හෝ, ගොඩනැගිලි වැඩ හෝ, දිය සැපයුම් වැඩ හෝ පිළිබඳ අවු ගණනේ 7 අවුරුදු ප්‍රායෝගික පළපුරුද්දක් ලැබ බිම් මැනීම සහ මට්ටම් ගැනීම පිළිබඳ හොඳ දැනුමක් තිබෙන බවටත්, නැතහොත්

(vii) සිවිල් නොහොත් යාන්ත්‍රික ඉංජිනේරු වැඩ පිළිබඳ පස් අවුරුදු අතවැසි සමයක් හෝ, අතවැසි සමය සහ ප්‍රායෝගික පළපුරුද්ද එකතු වී පස් අවුරුද්දකට නො අඩු සමයක් හෝ නිමවා ඊට අමතර ව, ගොඩනැගිලි නොහොත් බර ගොඩනැංවීම් වැඩ සහ බිම් මැනීම සහ මට්ටම් ගැනීම විෂයයෙන් මනා ප්‍රමේයානුබද්ද දැනුමක් සහ ප්‍රායෝගික පළපුරුද්දක් ලබා ඇති බවටත්, පිළිගත හැකි සාක්කි ඉදිරිපත් කල යුතුය.

**සැලකිය යුතුයි :—**

(vi), (vii) යන ඡේද යටතට ගැණෙන අපේක්ෂකයින්ට පත්වීම් දීමට කලින් පරීක්ෂණයට ඉදිරිපත් වන ලෙස නියම කරනවාත් හැර, පත්වීම් ලැබ දෙවුරුද්දක් ඇතුලත ඊ ළඟ පරීක්ෂක ශ්‍රේණියට ඉහළ යෑමට සුදුසුකම් දෙන දෙපාර්තමේන්තු විභාගයකින් එගොඩ වන ලෙස ද නියම කරනු ඇත.

5. අයදුම් කරුවන් විසින් තම අයදුම් පත්වලට මතු සඳහන් ලියකියවිලි (මුල් පිටපත් නොව,) අනු පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය,

(ii) ඉහළ ම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන සහතිකය.

(iii) කාර්මික සුදුසුකම් කිසිවක් වෙතොත් එය ද, ඉංජිනේරු වැඩ පිළිබඳ පළපුරුද්ද ද දැක්වෙන සහතික,

(iv) චරිතය පිළිබඳ ලඟදීම ලබාගත් සහතික තුනක් (සේවයේ දැනටත් සිටින නිලධාරීන්ගෙන් මෙය උවමනා නොවේ.)

6. රාජ්‍ය සේවයේ තනතුරුවලට දෙන පත්වීම් කෙරෙහි බල පවත්නා වූද, මේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදය පටන් ගැන්මේදී පළවී තිබෙන්නාවූ ද, පොදු කොන්දේසි ද මෙහි ලා කියවා බැලිම වටී.

වී. පී. ඒ. පෙරේරා,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.
(පාලන) නියෝජ්‍ය අධ්‍යක්ෂ.

1969.11.30 වනදා,
කොළඹ,
තැ. පෙ. අංක 500 හිමි,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේදී ය.

I වන, II වන, ශ්‍රේණිවල වැඩ උප පරීක්ෂක තනතුරු සඳහා වූ අයදුම් පතේ ආකෘතිය

1. මුළු නම (පැහැදිලි වටකුරු අකුරෙන්) :————.
2. දැනට ලිපිනය :————.
3. උපන් දිනය සහ තැන :————.
4. ජාතිය :————.
5. දැනට තනතුරක් දරන්නේ නම්, එය :————.
6. දැනට රැකියාවක නොවේ නම්, අන්තිමට දැරූ නිලය සහ ලැබූ වැටුප :————.
7. අධ්‍යාපන සුදුසුකම් (තමන් එගොඩ වූ විභාග දක්වන්න) :————.
8. කාර්මික සුදුසුකම් (එගොඩ වූ විභාග දක්වන්න) :————.
9. පුහුණු අතවැසි සමය ආදියේ වගතුග රාජකාරි සමග :————.
10. ගොඩනැගිලි කර්මාන්තය, දිය බස්නා, දිය සැපයුම් ඇතුළු ඉංජිනේරු වැඩ අතින් ලත් පළපුරුද්ද :————.
11. සුදුසුකම් ලබන්නේ කවර ඡේදයක් යටතේද යන වග :————.
12. යුද හමුදාවේ සේවය කළේ නම් ඒ කාල සීමාව :————.
13. සිංහල/දෙමළ විෂයයෙහි දැනුම :————.
14. වෙනත් අනෙක් සුදුසුකම් වේනොත් එය :————.
15. චරිත සහතික දෙන අයගේ නම් :————.

————,
අයදුම් කරුගේ අත්සන.

දිනය :————.

12-362—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදව

### හෙදි තනතුර (කාන්තා)

රාජකීය ලංකා ගුවන් හමුදාවේ, සුදුසුකම් ලත් හෙදි තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙල කර, 1970.1.2 දිනට පෙර මට ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප්.**—වර්ෂයකට රු. 4,080 න් පටන්ගෙන, රු. 90 බැගින් වූ වාර්ෂික වේතනාධික සහිතව වර්ෂයකට රු. 5,430 ක් දක්වා වැඩිවේ. (රු. 4,500 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් තිබේ.)

තෝරාගනු ලබන අයදුම්කාරියන් පහත සඳහන් දෑයට හිමිකම් ලැබෙනු ඇත :—

(i) වර්ෂයකට රු. 60 ක ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාවක් ;
(ii) වර්ෂයකට රු. 30 ක පාවහන් සඳහා දීමනාවක් ; සහ
(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෙදියන්ට නිකුත් කරන ප්‍රමාණයට නොමිළේ නිළ ඇඳුම්.

3. **අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කාරියන්ට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) 1970.1.2 දිනට වයස අවුරුදු 25ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 40 ට වැඩි නොවිය යුතුයි. (දනටමත් රජයේ සේවයේ නියුතු අය කෙරෙහි ඉහළ වයස් සීමාව බලනොපානු ඇත.) ;
(ii) 1949 අංක 10 දරණ වෛද්‍ය (සංශෝධිත) පනත යටතේ සුදුසුකම් ලත් හෙදියක් වශයෙන් ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචි වූ අය විය යුතුයි. සහ/හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ හෙදියන්ගේ ප්‍රවීණතා සහතිකය දරිය යුතුය ;
හෙදියන්ගේ ප්‍රවීණතා සහතිකයට අමතර වශයෙන් සූතිකා කර්මය පිළිබඳ සහතික දරණ ඉල්ලුම්කාරියන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.
(iii) මනා චරිතයකින් සහ හොඳ ශරීර සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුයි.
**සටහන.**—වෛද්‍ය ආඥාපනතේ (105 වැනි අධිකාරයේ) (vii) වැනි ඡේදය යටතේ වින්නඹු සේවිකාවක් වශයෙන් ලියාපදිංචි වී ඇති හා සුදුසුකම් ලත් හෙදියක් ලෙස අඩු වශයෙන් අවුරුදු දෙකක් වත් සේවය කර ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

4. **බඳවා ගැනීමේ වගන්ති.**—මෙම තනතුරු ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. අංක 372 හා 57.4.29 දින දරණ භාණ්ඩාගාරයේ චක්‍රලේඛය අනුව; විශ්‍රාම වැටුප් සහිත තත්ත්වය ප්‍රදානය කිරීම පාලනය වනු ඇත.

5. අයදුම්කාරියන් සිය අයදුම්පත්වලට පහත සඳහන් ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (**සැ.යු.**—බෞතිස්ම සහතික හෝ අධ්‍යාපන නීති මාලාව යටතේ පාසැල්වල භාවිතය සඳහා නිකුත් කරනු ලබන ලුහුඬු උප්පැන්න සහතිකය හෝ මේ සඳහා භාරගනු නොලැබේ) ;
(ආ) අයදුම්කාරියගේ චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (දනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ගෙන් මෙය අවශ්‍ය නොවේ.) ;
(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික.

6. ඉල්ලුම් පත් කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, තැ. පෙ. 594, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක නිළධාරී හා ගණකාධිකාරී වෙත එවිය යුතුයි. මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙකුගේ පෞද්ගලික නමට ඉල්ලුම්පත් නොඑවිය යුතුයි.

7. රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ ඉල්ලුම් පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ මුල පළකොට ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා කරන පත්වීම්වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සැළකිල්ල යොමු කරවනු ලැබේ.

**සටහන.**—ඉල්ලුම්පත්වලට අමුණා එවන කිසිම ලියවිල්ලක් ආපසු එවනු නොලැබේ. ඉහත සඳහන් සියලුම සුදුසුකම් නොමැති අයදුම්කාරියන්ගේ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඒ. සී. අරසරත්නම්,
සිවිල් පාලක නිළධාරී හා ගණකාධිකාරී,
ගුවන් හමුදා අණදෙන නිළධාරී වෙනුවට.

මූලස්ථානය, රා.ලං.ගු.හ.,
තැ.පෙ. 594, කොළඹ,
1969 නොවැම්බර් මස 7 වැනි දින.

### ආදර්ශ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා වයස (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
4. ජාතිය (ලාංකිකයෙකු වන්නේ පෙළපතින්ද නැතහොත් ලියාපදිංචි වීමෙන්ද යන වග සඳහන් කරන්න) :————.
5. විවාහකද අවිවාහකද යන වග :————.
විවාහක නම් පහත සඳහන් තොරතුරු සපයන්න :—
(අ) කන්‍යා නාමය (විවාහයට පෙර නම) :————.
(ආ) ස්වාමිපුරුෂයා ජීවත්ව සිටීද ? :————.
(ඇ) (1) ස්වාමිපුරුෂයා සමග ජීවත් වන්නේද යන වග :————.
(2) නීත්‍යානුකූලව වෙන්වී සිටීද :————.
(3) නීත්‍යානුකූලව නොවේ නම් වෙන්වී සිටින්නේ කෙසේ ද ? :————.
(4) ස්වාමි පුරුෂයාගේ රැකියාව :————.
(5) ඔහු රැකියාව කරන ස්ථානය :————.
(6) ළමයින් ගණන :————.
(අ) වැඩිමල් ළමයාගේ වයස :————.
(ආ) බාලම ළමයාගේ වයස :————.
6. දනටමත් සේවයේ යෙදී සිටී නම්—
(අ) දනට රැකියාව කරන ස්ථානය :————.
(ආ) සේවා කාලය අවුරුදු කීයද ? :————.
7. අධ්‍යාපනය ලැබූ පාසැල් හා විභාග සමත් වූ ස්ථාන :————.
8. හෙදි පුහුණුව ලැබූ ස්ථානය :————.
9. සූතිකා කර්මය පිළිබඳව පුහුණුව ලබා ඇතිද යන වග (සහතිකයේ පිටපතක් අමුණන්න) :————.
10. චරිත සහතික ලබා ගත්තේ යමෙකුගෙන්ද, ඒ අයගේ නම් හා ලිපිනය (මෑතකදී ලබාගත් චරිත සහතික තුනක පිටපත් අමුණන්න) :————.
11. පියාගේ හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
12. පහත සඳහන් දෑ පිළිබඳ දනුම :—

| | කියවීම | ලිවීම | කථා කිරීම |
|---|---|---|---|
| සිංහල | ———— | ———— | ———— |
| දෙමළ | ———— | ———— | ———— |
| ඉංග්‍රීසි | ———— | ———— | ———— |

13. මීට පෙර රජය යටතේ සේවය කර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර සපයන්න :————.
14. හෙදියක වශයෙන් ලියාපදිංචි වී ඇති අංකය (සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

මා රජයේ සේවයේ හෝ වෙනත් ආයතනයක සේවයේ අකාර්යක්ෂමතා වය නිසා විශ්‍රාම නොගන්වන ලද බවද, සේවයෙන් පහ නොකරන ලද බවද, සාපරාධී වරදකට උසාවියකින් වරදකාරියක් නොකරන ලද බවද, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් හෝ තොරතුරු අසත්‍ය බව සොයා ගනු ලැබුවහොත් ඊට ලැබෙන දඬුවම වහාම, මා රාජ්‍ය සේවයෙන් පහ කිරීම බව මම දනිමි.

————,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

12-455—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## ලංකා යුද හමුදව—සෙසු නිල පත්වීම්

1. ලංකා යුද හමුද නිත්‍ය හට සේනාවට සෙබලුන් වශයෙන් ඉදුරාම බඳවා ගැනීම පිණිස ඇබැර්තු තිබේ.

(අ) මෙම ඇබැර්තු පිරවීම පිණිස පත්වීම් ඉදිරියෙන් දක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| පත්වීම | ඒකකය | අවශ්‍ය විශේෂ සුදුසුකම් |
|---|---|---|
| (i) සාමාන්‍ය සෙබල ලිපිකරු (කාර්මික) ... | ල.යු.යු.බ. ... | වයස අවුරුදු 18—30 අතර විය යුතුයි. සිංහල/දෙමල කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රෙණිය සමත්ව සිටිය යුතුයි. යතුරුලිවීම මිනිත්තුවකට ඉංග්‍රීසි වචන 35 ක්ද, සිංහල වචන 20 ක්ද, වේගයෙන් යතුරු ලිවීමට හැකියාවක් තිබිය යුතුයි. පහත සඳහන් සුදුසුකම් ඇති අයවළුන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.<br>සිංහල ලඝුලේඛනය හෝ ඉංග්‍රීසි ලඝුලේඛනය ගැන දැනුමක් තිබීම, කාර්යාල පිළිවෙත, ලිපිගොනු කිරීම හා ලේඛනගත කිරීම ගැන දැනුමක් තිබීම. |
| (ii) සාමාන්‍ය සෙබළ ගබඩාකරු ... | ල.යු.යු.බ. ... | වයස අවුරුදු 18—30 අතර විය යුතුයි. සිංහල/දෙමළ හත්වෙනි ශ්‍රෙණිය සමත්ව සිටිය යුතුයි. යාන්ත්‍රික ප්‍රවාහන අමතර කොටස් සහ පොදු බඩු හඳුනා ගැනීම සහ ඒවායේ නම් පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුයි. යාන්ත්‍රික ප්‍රවාහන අමතර කොටස් පිළිබඳ දැනුමක් ඇති අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (iii) සාමාන්‍ය සෙබළ පාවහන් අළුත්වැඩියා කරන්නන් | ල.යු.යු.බ. ... | වයස අවුරුදු 18—30 අතර විය යුතුයි. සිංහල/දෙමළ හත්වැනි ශ්‍රෙණිය සමත්ව සිටිය යුතුයි. සම් වර්ග හඳුනා ගැනීමේ හැකියාවක් තිබිය යුතු අතර, සෑම වර්ගයකම බූට් සපත්තු පහත සඳහන් පරිදි අළුත් වැඩියා කිරීමට හැකියාවක් තිබිය යුතුයි.<br>ටිප්ස්මෝ ගැලවීම, ආරක්ෂක පුට්ටු බොත්තම්, පරණවූ අඩි අළුත් වැඩියා කිරීම හා අඩුපාඩු පිරවීම, සපත්තු අඩි මට්ටම් කිරීම, අළුත් භාග අඩි දැමීම සඳහා අඩිය සකස් කිරීම, ගෙවීගිය අඩියට කැලි යොද සකස් කිරීම සහ එහි රිවට් ඇණ සවි කිරීම, විලුඹේ අඩිය සවි කිරීම, ගෙවීගිය විලුම් අඩි කැලි යොද සම්පූර්ණ කිරීම, ගෙවීගිය විලුම් අඩි සහ පතුල් අඩියෙහි ටිප්ස් හා යකඩ ඇණ ගැහීම, සපත්තු මැසීමට ගන්නා නූල් වල ඉටි යෙදීම සහ සපත්තු මතුපිට කොටස අතින් මැසීම, බූට් සපත්තු මැසීමේ යන්ත්‍ර ක්‍රියාකරවීමේ හැකියාවක් තිබීම විශේෂ සුදුසුකමක් වේ. |
| (iv) සාමාන්‍ය සෙබල වඩු කාර්මිකයන් ... | ල.යු.යු.බ. ... | වයස අවුරුදු 18—30 අතර විය යුතුයි. සිංහල/දෙමළ හත්වැනි ශ්‍රෙණිය සමත්ව සිටිය යුතුයි. මූලික වඩු කර්මාන්තය ගැන මනා අවබෝධයක් තිබිය යුතුයි. |
| (v) සාමාන්‍ය සෙබල රියැදුරු යාන්ත්‍රික ප්‍රවාහන | ල.යු.යු.බ. ... | වයස අවුරුදු 18—30 අතර විය යුතුයි. සිංහල/දෙමළ සත්වැනි ශ්‍රෙණිය සමත්ව සිටිය යුතුයි. මෝටර් රථ පැදවීම පිළිබඳව සහ රිය නඩත්තු කිරීම පිළිබඳ මනා පළපුරුද්දක් සහ බලපත්‍රයක් තිබිය යුතුයි. බර වාහන පැදවීමට බලපත්‍රයක් තිබීම සහ මෝටර් යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුමක් තිබීම විශේෂ සුදුසුකම් ලෙස සලකනු ලැබේ. |
| (vi) සාමාන්‍ය සෙබල (මැහුම්කරුවන්) ... | ල.යු.යු.බ. ... | වයස අවුරුදු 18—30 අතර විය යුතුයි. සිංහල/දෙමළ 7 වෙනි ශ්‍රෙණිය සමත්ව සිටිය යුතුයි. මිම්ම මැනීම, මසන ලද ඇඳුම් සුදුසුලෙස නැවත සකස් කිරීම, ඇඳුම් අලුත්වැඩියා කිරීම සහ ඇඳුම් මසන යන්ත්‍ර ක්‍රියාකරවීමේ ප්‍රවීනත්වයක් තිබීම. තවද ඇඳුම් කැපීම, සොල්දාදුවන් ගේ ඇඳුම් කට්ටල මැසිම ගැනද පළපුරුද්දක් තිබිය යුතුයි. |
| (vii) ශීතකරණ කාර්මික (කෝප්‍රල්) ... | ල.වි.යා.ඉ. ... | වයස අවුරුදු 18—30 අතර විය යුතුයි. සිංහල/දෙමළ කණිෂ්ඨ පාඨශාලා සහතික පත් විභාගයෙන් හෝ 8 වෙනි ශ්‍රෙණියෙන් සමත් විය යුතුයි. ශීතකරණ යන්ත්‍ර හා උපකරණ අලුත් වැඩියා කිරීම පිළිබඳව, පිළිගත හැකි ආයතනයක අවුරුදු 5ක පලපුරුද්ද තිබිය යුතුයි. |
| (viii) ඉංජිනේරු සෙබල (පැස්සුම්කරුවන්) "බී" සණය iii වන ශ්‍රෙණිය | 1 ක.ඉ.රෙජි: ලඉ. ... | වයස අවුරුදු 18—30 අතර විය යුතුයි. සියලුම අයදුම්කරුවන් 7 වෙනි ප්‍රමාණයෙන් සමත්විය යුතු අතර, පහත දක්වෙන සුදුසුකම් වලින් එකක්ද අමතරව තිබිය යුතුයි. කම්කරු දෙපාර්තමේන්තුව මගින් හෝ කාර්මික විද්‍යාලය මගින් පවත්වන ලද වෘත්තීය පුහුණු කිරීමේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති බවට සහතිකය ; හෝ අඩුවශයෙන් අවුරුදු 3ක් නොකඩවා සේවය කර ඇති බවට පිළිගත් ඉංජිනේරු ආයතනයකින් ලබාගත් සහතිකය. |

(ආ) හුරුකම් හා කර්යක්ෂමතාවය මැනගැනීම සඳහා තෝරාගැනීමට ප්‍රථම අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයකට භාජනය කරනු ඇත.

(ඇ) ඉහත සඳහන් (1) වන ඡෙදයේ (අ) යටතේ ඇති ඇබැර්තු සඳහා "විශේෂ සුදුසුකම්" නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර සලකා බලනු නොලැබේ.

2. සාමාන්‍ය කොන්දේසි.—ඉහත සඳහන් (1) වන ඡෙදයේ (ආ) යටතේ දක්වා ඇති විශේෂ සුදුසුකම් වලට අමතර වශයෙන් යුද හමුදවට ඉදුරාම බැඳෙන සෙබලෙකු ලෙස බැඳීම සඳහා පහත සඳහන් සාමාන්‍ය කොන්දේසි සපුරාලිය යුතුය :—

අයදුම්කරුවෙකු—

(අ) ලාංකිකයෙකු විය යුතුයි. "ලාංකික" යනුවෙන් අදහස් කරනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙකු වූ අයෙකි.

(ආ) 1970.1.3 වන දිනට වයස අවුරුදු 18ට නොඅඩුවූද, වයස අවුරුදු 40ට නොවැඩිවද සිටිය යුතුය.

(ඇ) රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනත්වය පැහැදිලිවම සඳහන් කළ යුතු අතර සනාථ කලයුතුය.

(ඈ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි පස්වන පන්තිය සමත් විය යුතුය.

(ඉ) යුද හමුද ආඥපතිගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණයෙකින් සමත්වීම හා ;

(ඊ) උස අඩි 5 අඟල් 4ට අඩු නොවිය යුතුය.

කෙසේ වෙතත් යුද හමුද ආඥපතිගේ අනුමැතිය ඇතිව විශේෂ අවස්ථාවලදී අවුරුදු 40ට වඩා වයස්වූ හා උස අඩි 5 අඟල් 4ට අඩු අයද බඳවා ගත හැක.

3. මේ තනතුරු සඳහා ඉදිරිපත් වන සේවාමුක්ත භටයෙක් වේ නම් ඉහත දක්වන ලද සුදුසුකම් වලට අමතර වශයෙන් :—

(අ) තමා ලංකාරක්ෂක හමුදාවේ ඇතුළු බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයේ යම් හමුදාවක අවුරුදු එකකට නොඅඩු කාලයක් සේවය කර ඇති බවට හා

(ආ) යුද සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී හේවාචරිතය (''ඉතාහොඳ'') යයි වර්ග කර තිබිය යුතුයි.

4. **සේවා කාලය.**—අවුරුදු 12ක සේවා කාලය සඳහා බඳවා ගනු ලබන සෙබලකු පළමු අවුරුදු 5 නිත්‍ය බල සේනාවේද, ඉතිරි අවුරුදු 7 නිත්‍ය උප සේවා බල හමුදාවේ ද සේවය කිරීමෙන් පසු අස්කරනු ලැබීමට ඉඩ තිබේ. සමහර අවස්ථාවලදී සෙබලකුට ස්වකීය නිත්‍ය හමුදාවේ සේවය අවුරුදු 12 දක්වා දීර්ඝ කරනු ලැබීමටත් අවුරුදු 32 දක්වා එහිම සේවය කිරීමටත් ඉඩ තිබේ.

5. **වැටුප් හා දීමනා.**—යුද හමුදාවේ නිත්‍ය භට සේනාවේ සෙසු නිළ දරණ සෙබලුන් සඳහා වූ වැටුප් හා දීමනා 1961 අප්‍රේල් මස 28 වන දින අංක 12,395 දරණ රාජ්‍ය නිවේදන පත්‍රයේ පළවුනු 1961 යුද හමුද වැටුප් සංග්‍රහයේ 1 වන කොටසට අනුකූල වනු ඇත.

(අ) **වැටුප වෘතීයක් නොමැති සෙබලුන්.**—1961 යුද හමුද වැටුප් සංග්‍රහයට අනුකූලව සාමාන්‍ය සෙබලාගේ හෝ සමාන නිළදරන්නකු ගේ සිට වෘතියයක් නොමැත්තකු වන බලලත් නිලධාරි 1 දක්වා බඳවාගැනීමේදී 1961 යුද හමුද වැටුප් සංග්‍රහයට අනුව ගෙවනු ලබන මූලික මාසික වැටුප පහත සඳහන් අයුරුය :—

| නිළය | | මූලික මාසික වැටුප | |
|---|---|---|---|
| | | රු. | ශ. |
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිලදරන්නෙකුට | ... | 70 | 0 |
| ලාන්ස් කෝප්‍රල් ... | ... | 85 | 0 |
| කෝප්‍රල් ... ... | ... | 115 | 0 |
| සැරයන් ... ... | ... | 180 | 0 |
| මාණ්ඩලික සැරයන් ... | ... | 202 | 50 |
| බලලත් නිලධාරි 11 ... | ... | 220 | 0 |
| රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් | ... | 235 | 0 |
| බලලත් නිළධාරි 1 ... | ... | 250 | 0 |

(ආ) **වැටුප වෘතීය සෙබලුන්.**—කෝප්‍රල් නිලය හෝ ඊට සමාන නිලය හෝ පහත් නිලයක් දරණ, වෘත්තියයකට බඳවා ගන්නකු වශයෙන් ගැනෙන සෙබලකුගේ වැටුප යථෝක්ත ගනය තුලවූ පන්තියට අනුකූලව ඔහුට නියමිත වාර්ෂික වැටුප ගෙවනු ලබන්නේ පහත සඳහන් අයුරුය :—

| නිලය | ''එක්ස්'' ගනයේ වෘතීන් | | | ''ඒ'' ගනයේ වෘතීන් | | | ''බී'' ගනයේ වෘතීන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පන්තිය 1 | පන්තිය 2 | පන්තිය 3 | පන්තිය 1 | පන්තිය 2 | පන්තිය 3 | පන්තිය 1 | පන්තිය 2 | පන්තිය 3 |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිලය | ... 1,470 | ... 1,170 | ... 1,020 | ... 1,350 | ... 1,110 | ... 960 | ... 1,260 | ... 1,050 | ... 930 |
| ලාන්ස් කෝප්‍රල් හෝ සමාන නිලය | ... 1,620 | ... 1,320 | ... 1,170 | ... 1,500 | ... 1,260 | ... 1,110 | ... 1,410 | ... 1,200 | ... 1,050 |
| කෝප්‍රල් හෝ සමාන නිලය ... | ... 1,980 | ... 1,680 | ... 1,530 | ... 1,860 | ... 1,620 | ... 1,470 | ... 1,770 | ... 1,560 | ... 1,410 |

සැරයන් නිලය හෝ සමාන නිලය හෝ උසස් නිලයක් දරන වෘතියයකට බඳවා ගන්නකු වශයෙන් ගැනෙන සෙබලකුගේ වාර්ෂික වැටුප ගෙවනු ලබන්නේ පහත සඳහන් අයුරුය :—

| නිළය | උසස්ම පෙළ වෘත්තිය සෙබලුන් ''එක්ස්'' ගණය පන්තිය 1 | උසස්ම පෙළ වෘත්තිය සෙබලුන් ''ඒ'' ගණය පන්තිය 1 | සෙසු වෘතීය සෙබලුන් ''බී'' ගනය පන්තිය 1 |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| සැරයන් හෝ සමාන නිලය ... ... ... ... | 2,520 | ... 2,430 | ... 2,280 |
| මාණ්ඩලික සැරයන් හෝ සමාන නිලය ... ... ... ... | 2,880 | ... 2,790 | ... 2,550 |
| බලලත් නිලධාරි 11 වන පන්තිය ... ... ... ... | 3,180 | ... 3,000 | ... 2,760 |
| රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් ... ... ... | 3,360 | ... 3,180 | ... 2,940 |
| බලලත් නිලධාරි 1 වන පන්තිය ... ... ... ... | 3,540 | ... 3,360 | ... 3,120 |

(ඇ) **ජීවනාධාර හා විශේෂ ජීවනාධාර මුදල.**—රජයේ ගෙවීම් ක්‍රමයට ජීවනාධාර හා විශේෂ ජීවනාධාර මුදල පහත සඳහන් වර්ගවලට අයත් සෙබලුන්ට ගෙවනු ලැබේ

(i) හමුද වියදමෙන් ආහාර නොසැපයෙන විවාහ සෙබලා,

(ii) හමුද නිවාසවලින් බැහැරව විසීමට අවසර ලත් අවිවාහක සෙබලා, හා

(iii) හමුද නේවාසිකාගාරයෙන් ආහාර නොගෙන නිවාඩු ලබා සිටින අවිවාහක සෙබලා.

හමුද වියදමෙන් ආහාර සපයනු ලබන අවිවාහක හෝ විවාහක සෙබලෙකුට හිමිවනුයේ—

(i) රජයේ ගෙවීම් ක්‍රමයට අනුකූලවූ ජීවනාධාර මුදලේ හා විශේෂ ජීවනාධාර මුදලේ එකතුව හා

(ii) යුද හමුද ආඥපති විසින් නිගමනය කරන ආහාර සැපයීම පිණිස වූ වියදම් අතර වෙනසය.

(ඈ) **ගෙවල් කුලී.**—සේවා හෝ රජයේ නිවාසවල නොවෙසෙන විවාහක සෙබලුන්ට හා නේවාසිකාගාරවල ඉඩ පහසුකම් නොමැති හෝ රජයේ නිළධාරීන් සඳහා වූ දීමනා හා කොන්දේසි අනුව ඔහුගේ පත්වීමට දෙනු ලබන විශේෂ නිවාස නොමැති අවිවාහක සෙබලාට ගෙවල් කුලී ගෙවනු ලැබේ. විවාහකයන් සඳහා වූ රජයේ හෝ සේවා නිවාසවල වෙසෙන සෙබලෙකු ගෙවල් කුලී දීමනාවට අහිමිවනු ඇත.

(ඉ) **රජක දීමනා.**—(i) නේවාසිකාගාරයේ සිටින සෙබලෙකුගේ නිල ඇඳුම් හමුද වියදෙමන් සෝද දෙනු ලැබේ.

(ii) හමුද නිවාසයන්ගෙන් බැහැරව වෙසෙන සෙබලෙකු ඔහුගේ නිල ඇඳුම් සේදීම පිණිස යුද හමුද ආඥපති විසින් නිගමනය කරනු ලබන දීමනාවට හිමිකරුවකු වනු ඇත.

(ඊ) **සේවා වැඩිවීම:**—සෑම සෙසු නිළදරන්නෙකුටම සේවා වැඩිවීම් වශයෙන් ගණන් ගැනෙන පස් අවුරුදු සේවා කාලයකට මසකට රුපියල් 4.50 බැගින් ගෙවනු ලැබේ.

(උ) **නිල වැඩිවීම.**—කෝප්‍රල් සිට බලලත් නිළධාරි 11 දක්වා නිලවැඩිවීම් වශයෙන් එම නිළයේ සෑම සිව් අවුරුදු සේවා කාලයට රුපියල් 7.50 බැගින්ද, බලලත් නිලධාරි 1, දරණ අයෙකුට සිව් අවුරුදු සේවා කාලයට රුපියල් 15.00 බැගින්ද ලැබෙනු ඇත. කෝප්‍රල් සිට සමාන නිළදරන්නෙකුට හිමිවනුයේ නිළ වැඩිවීම් හතරක් පමණි.

(ඌ) **වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල.**—සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දයක මුදල් වශයෙන් තම මූලික වැටුපෙන් 4%ක මුදලක් අඩුකර ගැනීම ගැන තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් යුද හමුදවට බැඳීමේදී සෑම සෙබලෙකු විසින්ම දිය යුත්තේය.

5. ඉහත සඳහන් (1) වන ඡෙදය (අ) හි දක්වෙන ඉඩුරාම බඳවා ගැනීම පිළිබඳ ඇබැර්තු සඳහා එවන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් නීතිවලට අනුකූල විය යුතුය :—

(අ) ඉල්ලුම් පත්‍ර මෙම නිවේදනයේ අන්තයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ අනුසාරයෙන් ඉල්ලුම් කරුගේ අත් අකුරින්ම පුරවන ලද ඒවා විය යුතුය.

(ආ) ඉල්ලුම් පත්‍ර '' යුද හමුද ආදුනිකයින් බඳවන නිලධාරි, යුද හමුද මූලස්ථානය තැ. පෙ. 553 කොළඹ '' යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයෙහිද එය බහා ලනු ලබන කවරය මතුපිටද '' ඉල්ලුම් පත්‍රය නිත්‍ය බල සේනා සෙසු නිල පත්වීම් '' යනුවෙන් සඳහන් කල යුතුය.

ඉල්ලුම් පත්‍ර 1970.1.3 සවස 4.30 ට පෙර යුද හමුද මූලස්ථානයට ලැබිය යුතුය.

(ඇ) ඉල්ලුම් කරු විසින් ඉල්ලා සිටින තනතුර සහ ඒකකය නිවැරදිව සඳහන් කළ යුතුය.

(ඈ) ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික වල **පිටපත් පමණක්** අමුනා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය හෝ උප්පැන්න ලියා පදිංචිකර නැති අපේක්ෂකයින් සම්බන්ධයෙන් නම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය, බෞතිස්ම සහතික, ආධාර ලබන පාසැල්වල රෙගුලාසි සංග්‍රහය යටතේ භාවිතයට පමණක් නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ ජන්ම පත්‍ර භාරගනු නොලැබේ.

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(iii) ඉල්ලුම් කරුගේ චරිත ශුද්ධිය සහ මෙම තනතුර පිළිබඳ යෝග්‍යතාවය ගැන මෑතදී ලබාගත් සහතික තුනක්, රක්ෂාවක යෙදී සිටින්නේ නම් මින් එක් සහතිකයක් තමාගේ ස්වාමියාගෙන් විය යුතුය.

**සැලකිය යුතුයි :**(i) මෙම සහතික පත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කර යුත්තේ ඉල්ලුම් කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් පමණි.

(ii) ඉල්ලුම් පත්‍රය සමග සහතික පත්‍රවල මුල් පිටපත් එවනු ලැබ ඒවා නැතිවුවහොත් ඊට යුද හමුද මූලස්ථානය වගකියනු නොලැබේ.

(ඉ) තැපැලේදී නැතිවුන, ප්‍රමාද වන ඉල්ලුම් පත්‍රයක් හෝ ඊට අදල ලිපියක් පිළිබඳව කෙරෙන චෝදනාවක් ගැන සලකා බලනු නොලැබේ.

(ඊ) ස්වේච්ඡා හමුදවල සාමාජිකයින්ගේ ඉල්ලුම් පත් ඔවුන්ගේ ඒකක මූලස්ථාන මගින් ඉදිරිපත් කර යුතුය.

(උ) රජයේ සේවයේ යෙදී සිටින අය විසින් එවනු ලබන ඉල්ලුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් එවිය යුතුය.

(ඌ) දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලැබ, ඉල්ලුම් පත්‍ර බාරගන්නා දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ඉල්ලුම් පත්‍ර බාර ගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තුවලට ලැබී, යථෝක්ත දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ප්‍රමාදය පිළිබඳව පිළි ගත හැකි කරුණු සහිතව ඉදිරිපත් නොකරන ලද ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

(එ) සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුයයි තෝරාගනු ලබන අයදුම්කරුවන්, තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා තමාගේම වියදමෙන්ම පැමිණ, පෙනී සිටිය යුතුය. එම ඉල්ලුම් කරුවනට සම්මුඛ පරීක්ෂණය පවත්වන ස්ථානය, දිනය හා වේලාව පුද්ගලිකව දන්වනු ලැබේ.

(ඒ) තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගැනීමට සුදුසුයැයි තෝරා ගන්නා ලද ඉල්ලුම් කරුවන්, වෛද්‍ය පරීක්ෂණ එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා තමාගේ වියදමෙන්ම කොළඹදී පෙනී සිටිය යුතුය.

(ඔ) සම්මුඛ පරීක්ෂණයෙන් සහ යුද හමුද තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන අවශ්‍ය අනිකුත් පරීක්ෂණ වලින් පසුව යුද හමුද නිත්‍ය හට සේනාවට බඳවා ගන්නා අතර යුද හමුද අභ්‍යාස මධ්‍යස්ථානයේ හෝ අන්තැනක පවත්වනු ලබන පුහුණුවීමේ අභ්‍යාස පාඨමාලාවක් අනුගමනය කිරීමට සලසනු ලැබේ.

(ඕ) වයස අවුරුදු 21 කට අඩු අය තමාගේ දෙමව්පියන්ගෙන් හෝ භාරකාරයාගේ කැමැත්ත පලමු කොට ලියවිල්ලකින් ලබාගෙන නොමැති නම් නිත්‍ය හට සේනාවට බඳවා ගනු නොලැබේ.

(ක) තෝරා පත්කරගත් සෑම ඉල්ලුම් කරුවෙක්ම ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව ක්‍රියා කල යුතුය.

(ග) ඉල්ලුම්කරු රෙකමදරු කිරීමට කැමැති කෙනෙකු වේනම් ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම්කරුවකුගේ තෝරා ගැනීම පිළිබඳව දරණ අයථා ප්‍රයත්නයක් වේ නම් ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සකු වීමට ඉඩ තිබේ.

(ජ) යම් ඉල්ලුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බවට ඔහු තෝරාගැනීමට පෙර දැන ගැනීමට ලැබුනි නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු බවට පත්කරණු ලැබීමටත් තෝරාගැනීමෙන් පසුව අනාවරණය වුනි නම් රාජකාරියෙන් පහකරණු ලැබීමටත් ඉඩ තිබේ.

ඇම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
මණ්ඩලික ප්‍රධාන යුද හමුද ආඥපති වෙනුවට.

යුද හමුද මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ, 1959 දෙසැම්බර් මස 4 දින.

**නිත්‍ය හට සේනාවේ සෙසුනිල පත්වීමක් පිළිබඳ වූ ආදර්ශ ආකෘති පත්‍රය**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය :————. වයස :————. අවුරුදු :————. මාස :————.

(4) දින සහිත සමත් වූ විභාග, විෂයයන් සමග :————.

(5) ඉල්ලුම් කරණ තනතුර :————.
(මෙම නිවේදනයේ (1) වන ඡෙදයේ (අ) හි දක්වා ඇති පරිදි පත්වීම සහ ඒකකය සඳහන් කල යුතුය.)

(6) මෙම නිවේදනයේ (1) වන ඡෙදයේ (අ)හි දක්වා ඇති පරිදි පත්වීම සඳහා සුදුසුකම් හා පලපුරුද්ද ඔබට තිබේද? ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර ————.

(7) පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූවාට පසුව යෙදී සිටි රක්ෂාව :————.

(8) උස :————. අඩි :————. අඟල් :————.

(9) ජාතිය :————.

(10) ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

(11) කලින් කරන ලද සමාන පත්වීම් පිළිබඳ විස්තර, තනතුර සහ දින සහිතව :————.

(12) මීට ප්‍රථම, යුද, නාවික, ගුවන් හා ස්වේච්ඡා සේවක හමුදවල (යුද සේවය ඇතුලුව) දැරූ තනතුරු ආදියක් වේ නම් තත්ත්වය හා දිනය ඇතුළුව සම්පූර්ණ විස්තර :————.

(13) යුද සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී චරිතය :————.
(සේවාමුක්ත හටයෙක් වේ නම් යුද සේවයෙන් අස්වීමේදී, අස්කිරීමේදී ලබාගත් සහතික පිටපත් ඇමිණිය යුතුය.)

(14) වෙනත් සුදුසුකම් (ක්‍රීඩා ආදිය) :————.

(15) ඉදිරිපත් කරණ ලද චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරු (මෙම නිවේදනයේ (6) වන ඡේදයේ (ආ) බලන්න):

(1) :————.
(2) :————.
(3) :————.

(16) ඉල්ලුම්කරු අත්සනින් කර සිටින ප්‍රකාශය :————.

**ඉහත සඳහන් ප්‍රශ්න වලට මා විසින් සපයන ලද පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බවට මෙයින් සහතික කරමි.**

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12–419—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

**ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව**

**වෙළෙඳ පර්යේෂණ නිලධාරි තනතුර**

ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙළෙඳ පර්යේෂණ නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙල කරන ලද අයදුම්පත් 1970 ජනවාරි මස 13 වැනි දිනට හෝ ඊට පෙර හෝ කොළඹ 7, ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතැනට ලැබෙන ලෙස එවිය යුතුය.

ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරේ "වෙළෙඳ පර්යේෂණ නිලධාරි තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 5,736න් පටන් ගෙන රු. 144 වාර්ෂික වැටුප් වැඩිවීම් හයකින් ද, රු. 180 වැඩිවීම් අටකින් ද, රු. 240 වැඩිවීම් හයකින් ද, රු. 9,480 දක්වා වේ. වාර්ෂික වැටුප රු. 6,780,—7,320 සහ 8,280ට එළැඹෙන්නට පෙර කාර්යක්ෂමතා කඩඉම් වේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—

(අ) මෙම තනතුර කාවකාලිකය, විශ්‍රාම වැටුප් රහිත ය. තෝරාගන්නා අපේක්ෂකයා රජයේ සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(ආ) රජයේ ස්ථිර නිලධාරියකු මෙම තනතුරට තෝරාගනු ලැබුව හොත් ඔහු පළමුවෙන් ම නියමිත කාල සීමාවකට වැඩ බැලීමේ පදනමක් මත පත් කෙරෙනු ඇත.

4. **වයස් සීමාව.**—වයස අවුරුදු 21ට නො අඩු විය යුතු ය. අවුරුදු 40ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

5. **අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්.**—

(අ) (i) විශිෂ්ඨ චරිතයකින් සහ හොඳ ශාරීරික සනීපයකින් යුක්ත බව ;

(ii) ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යා ලේඛන විද්‍යාව යන විෂයයන් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු වීම ; හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ විද්‍යා උපාධිධාරියෙකු වීම ; හෝ
ලංකා කාර්මික විද්‍යාලය මගින් ප්‍රදානය කරනු ලබන වාණිජ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

(ආ) තනතුර ස්ථිර කරනු ලැබූ කළමනාකාර වරයෙකු වශයෙන් ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ "ලක්සලක" හෝ "ගෘහ කර්මාන්ත වෙළෙඳ සලක" හෝ අවුරුදු පහක සතුටුදායක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර ඇති පහත සඳහන් සුදුසුකම්වලින් එකක් සපුරා ඇති මෙම දෙපාර්තමේන්තුවේ සේවකයන්ට ද, මේ තනතුර සඳහා ඉල්ලුම් කළ හැක :—

(i) ලංකා කාර්මික විද්‍යාලය මගින් ප්‍රදානය කරනු ලබන වාණිජ ඩිප්ලෝමා සහතික පත්‍රය සඳහා වූ දෙවැනි වර්ෂයේ විභාගය ; හෝ

(ii) ලේකම්වරුන්ගේ වාටඩ් ආයතනයේ අවසාන විභාගය.

**සටහන.**—වෙළෙඳාම දියුණු කිරීම සහ වාණිජ හා අලෙවි කටයුතු පිළිබඳ ගැටලු අතින් දැනීමක් හා පළපුරුද්දක් ඇති අයවලුන් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

6. අයදුම්කරුවන් තම අයදුම්පත්වලට පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා ඇති ව්‍යවස්ථා සංග්‍රහය අනුව නිකුත් කර ඇති උප්පැන්න සහතික භාරගනු නො ලැබේ.)

(ආ) ලබා ඇති උසස් ම අධ්‍යාපනික හා පළපුරුද්ද පිළිබඳ සහතික ;

(ඇ) අයදුම්කරුගේ චරිතය පිළිබඳ ව හා මෙම තනතුරට සුදුසුකම් විදහා දක්වෙන මෑතදී ලබාගන්නා ලද සහතික දෙකක් (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම අවශ්‍යතාවය නොයෙදේ.)

7. **බඳවා ගැනීමේ ක්‍රමය.**—මේ කාර්ය සඳහා ම සංස්ථාපිත මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු සුදුසු අයෙකු තෝරාගනු ලැබේ.

සැ. යු.—සුදුසුකම් ලත් අයදුම්කරුවන් නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ හෝ ගාස්තුවක් නො ගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතික හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියකියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

8. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. ඉහතින් සඳහන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට කලට වේලාවට ලැබී ඔවුන් අතින් සිදුවන ප්‍රමාදය සඳහා පිළිගත හැකි සාධක ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලටද අවධානය යොමු කරනු ලැබේ.

10. කවර අන්දමේ හෝ අයථා බලපෑම් නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

11. ඉල්ලුම්පත්‍ර හා ඊට සම්බන්ධ වෙනත් ලියවිලි මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතු ය.

12. අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් 13″×8″ ප්‍රමාණයේ කඩදාසිවල යතුරු ලිවීමෙන් හෝ රතු තීන්තෙන් ලිවීමෙන් හෝ පිළියෙළ කරගත යුතුය. (මේ සඳහා වෙනත් ප්‍රමාණයේ කඩදාසි පාවිච්චි නො කළයුතු ය.) ආකෘති පත්‍රයේ 1 සිට 6 දක්වා වූ ඡේදයන් පළමු පිටුවේ ද, ඉතිරි ඡේදයන් දෙවැනි පිටුවේ ද, වන ආකාරයට අයදුම්පත පිළියෙල විය යුතුය. එක් කඩදාසියක දෙපැත්තේ ම ලිවීම නොකළ යුතු වේ. අපේක්ෂකයාගේ ම අත් අකුරින් අයදුම්පත පිරවිය යුතුයි.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ අයදුම් පත**

**ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව—වෙළෙඳ පර්යේෂණ නිලධාරි තනතුර**

1. (i) සම්පූර්ණ නම (මයා. මහත්මිය/මෙනෙවිය) :————.

(ii) මුලකුරු සහිතව නම :————.

2. දැනට ලිපිනය :————.

3. (අ) උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය.) :————.

දින :————.

(ආ) 1970 ජනවාරි මස 13 දිනට වයස අවු.——, මාස——.

4. (අ) ජාතිය :————.
(ආ) ඔබ ලංකාවේ පාරම්පරික රටවැසියෙක් ද එසේ නැතිනම් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන වග :————.
(ඇ) උපන් ස්ථානය :—
(i) අයදුම්කරුගේ :————.
(ii) අයදුම්කරුගේ පියාගේ :————.

5. (අ) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ උසස් ම විභාගය, විෂයයන් සහ දිනයන් සමඟ) :————.
(ආ) විශේෂ සුදුසුකම් (මෙම තනතුර සඳහා ලබා ඇති පළපුරුදුකම් හෝ පුහුණුවීම හෝ පිළිබඳ විශේෂ සහතිකය.) : ————.

6. භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය :—
සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

7. ඉගෙනීම ලත් පාසල් සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දිනයන් සමඟ) :—

| පාසැලේ/විද්‍යාලයේ නම | ඇතුළත් වූ දිනය | අස් වූ දිනය |
|---|---|---|
| (i) ————. | ————. | ————. |
| (ii) ————. | ————. | ————. |
| (iii) ————. | ————. | ————. |
| (iv) ————. | ————. | ————. |
| (v) ————. | ————. | ————. |

8. පාසලෙන් හෝ විද්‍යාලයෙන් අස් වූ දින සිට කළ රක්ෂාවල් (රක්ෂාව, සේවයට බැඳුණු දිනය හා අස් වූ දිනය, වැටුප) : ————.

9. දැනට දරන තනතුර හා ලබන වැටුප :————.
එය ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ද ? :————.

10. චරිත සහතික ලබාගත් පුද්ගලයන් දෙදෙනාගේ නම්, පදවි නාම සහ ලිපිනයන් :————.

මෙම ඉල්ලුම්පත්‍රිම ම විසින් සඳහන් කොට තිබෙන සියලු ම විස්තර සත්‍ය වූද, නිවැරදි වූද, කරුණු බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පු වුවහොත්, තෝරා ගැනීමට පෙර අනාවරණය වී නම් නුසුදුස්සකු වීමට ද, තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වී නම් කිසි වන්දි ගෙවීමක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට ද මා යටත් වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-363—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

# ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සංඛ්‍යාලේඛන විමර්ශක තනතුරු

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන විමර්ශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘතිපත්‍රයේ අන්දමට තමන්ගේම අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් 1970. 1. 10 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ " ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ, තැ. පෙ. 563, කොළඹ, " යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු අතර පුද්ගලිකව මා නමට හෝ මෙම කාර්යාලයේ අන් කිසි නිලධාරියෙකු නමට නො එවිය යුතුය.

**2. වැටුප් ක්‍රමය, විශේෂ දීමනා හා සේවය පිළිබඳ කොන්දේසි.**—වාර්ෂිකව රු. 3,576න් පටන් ගෙන රු. 144 වාර්ෂික වැටුප් වැඩිවීම් 20කින් යුක්තව රුපියල් 6,456 දක්වා වූ ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අයත් වේ. වාර්ෂිකව රු. 4,296 ට පෙර කාර්යක්ෂමතා කඩඉමෙකි.

තෝරාගනු ලබන අයදුම්කරුවන්, රුපියල් 4,296 ට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ඔබ්බට උසස් කිරීම සඳහා දෙපාර්තමේන්තුමය පරීක්ෂණයකින් සමත් විය යුතුය. 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන අනුව සමත් විය යුතු සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ට අමතරව පත්වීමේ දින සිට අවුරුදු 3ක් ඇතුළත දී දෙමළ භාෂාවෙන් කථනය හා අර්ථ නිරූපනය යන විෂයයන් ගෙන් සමන්විත පරීක්ෂණයකින් ද සමත් විය යුතුව ඇත. මෙම පරීක්ෂණය අසමත් වීම ඉන් පසුව යෙදෙන වේතනාධිකය විලම්බනය කිරීමට හේතුවේ.

**3. සේවාවට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු තුනක ආධුනික කාලයකට යටත් වනු ඇත.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් හිමි බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ලාංකිකයකු බව.

(ආ) 1970. 1. 10 දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි බව.

ගෙන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග
(ඇ) ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය විෂයයක් වශයෙන්
යෙන් හෝ උසස් විභාගයකින් සමත් වී ඇති බව.

(ඇ) ඉතා හොඳ චරිතයක් ඇති බව.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් පරිදි තමාගේ සහතික පත්‍රවල පිටපත් අයදුම්පතට අමුනා එවිය යුතුය :—

(1) අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපත (බව්තිස්ම කිරීමේ සහතිකය හෝ ආධාර ලබන පාඨශාලා රීති අනුව නිකුත් කරන ලද උප්පැන්න සහතිකවල පිටපත් භාරගනු නොලැබේ).

(2) අයදුම්කරු ලබා ඇති උසස් ම අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත්.

(3) මෙම තනතුර සඳහා අයදුම්කරු තමාගේ අධ්‍යාපනික සුදුසුකම්, චරිතය, හැකියාව හා වෙනත් සුදුසුකම් මත ලැබූ චරිත සහතික පත් තුනක පිටපත් (දැනට රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් මෙම සහතික පිටපත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළකර ඇති, රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලන්න.

එල්. බී. රාජකරුණා,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1969 නොවැම්බර් මස 30 දින,
කොළඹ 7, තැ. පෙ. 563,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේදි ය.

## ආදර්ශ ආකෘති පත්‍රය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව—සංඛ්‍යාලේඛන විමර්ශක තනතුර සඳහා අයදුම්පත**

1. අයදුම් කරන තනතුර හා ඒ ප්‍රසිද්ධ කරන ලද නිවේදනයට සැසඳුම :————.

2. සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය (පැහැදිලි අකුරෙන්) : ————.

3. උපන් දින හා උපන් ස්ථානය :————.
1970.1.10 දිනට වයස අවුරුදු :——, මාස :——, දින :——.

4. විවාහක නම්, විවාහ වූ දිනය හා ළමයින් ගණන :————.

5. අධ්‍යාපනික සුදුසුකම් (සමර්ථ වූ දිනය හා විෂයයන් ද සඳහන් කරන්න) :————.

6. ඉගෙනීම ලැබූ විද්‍යාලයයන් හා එයින් අස් වූ දිනය :————.

7. දැනට යෙදී සිටින රක්ෂාව හා දැනට ලබන වාර්ෂික වැටුප් : ————.

8. පාඨශාලා හැරයාමෙන් පසු යෙදී සිටි රක්ෂා හා ඉන් අස් වූ දින (රජයේ සේවයක යෙදී සිටියේ නම් ඒ පිළිබඳ සියලු තොරතුරු සඳහන් කළ යුතුයි) :————.

9. සිංහල හෝ දෙමළ කියවීම, ලිවීම හා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවය (සමර්ථ වූ විභාග පිළිබඳ තොරතුරු සඳහන් කළ යුතුය) :————.

10. විශේෂ සුදුසුකම් (වෘත්තීය, කාර්මික, ක්‍රීඩා, බාලදක්ෂ කටයුතු, සමාජ සේවා වැඩ, ශුභ සාධක වැඩ) :————.

11. පිටපත් අමුණා ඇති චරිත සහතික ලබාගත් අයවලුන් තිදෙනකුගේ නම් හා ඔවුන්ගේ නිලතල :————.

12. අයදුම්කරු පුද්ගලික වශයෙන් හඳුනන දෙදෙනෙකුගේ නම් හා ඔවුන්ගේ නිලතල (සහතික ලබාගත් අයගේ නම් හැර) : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-483—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## ස්වෙච්ඡා නාවික හමුදාවේ නැවියන් වශයෙන් පත්වීම සඳහා පුරප්පාඩු

### ස්වෙච්ඡා නාවික හමුදාවේ නැවියන් සඳහා පුරප්පාඩු ඇත

2. අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(අ) ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි ;

(ආ) 1970 ජනවාරි මස 12 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 30ට නොවැඩි විය යුතුයි;

(ඇ) නාවික හමුදාපති විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට හැකිවන පරිදි නිරෝගී අයකු විය යුතුයි ;

(ඈ) අට වැනි ප්‍රමාණයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් අධ්‍යාපන සහතිකයක් ලබා සිටිය යුතුයි ;

(ඉ) නාවික හමුදාපතිට, ඔහුගේ අභිමතය පරිදි, ඉහත සඳහන් 2 (ආ) ඡෙදය යටතේ නියම කර ඇති වයස් සීමාව වෙනස් කිරීමට ද අත්හැර දැමීමට ද පුළුවන.

**සංලක්ෂ්‍යය.**—අයැදුම්කරුවන් රජයේ භාෂා ප්‍රතිපත්තියට, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතට අනුකූලව පිළිපැදීමට එකඟව සිටිය යුතුයි. විශේෂඥ හෝ කාර්මික හැකියාවන් ලබා තිබෙන පුද්ගලයින් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

3. ස්වෙච්ඡා නාවික හමුදාවේ නැවියකු සාමාන්‍ය වශයෙන් එක්තරා අභ්‍යාස පෙළපාලි ගණනකට සහ දින 14 ක වාර්ෂික කඳවුරකට සහභාගි විය යුතුයි.

4. ස්වෙච්ඡා නාවික හමුදා රෙගුලාසි අනුව, ස්වෙච්ඡා නාවික හමුදාවේ නැවියෙකුට හුදෙක් ඇරීමට වන වියදම් පියවා ගැනීම සඳහා යම් යම් වේතන ගෙවනු ලැබේ.

5. ස්වෙච්ඡා නාවික හමුදා රෙගුලාසිවලින් සහ නාවික හමුදා පනතින් පොදු සේවා නීතිරීති පාලනය වනු ඇත. ලංකාවේ ව්‍යවස්ථාදායක ප්‍රඥප්තියේ ප්‍රතිශෝධිත සංස්කරණයෙහි 358 වැනි පරිච්ඡෙදය වන නාවික හමුදා පනතේ 7 වැනි සහ 16 වැනි වගන්තිවලට අනුකූලව ස්වෙච්ඡා හමුදා පුද්ගලයකු සක්‍රිය සේවය සඳහා කැඳවීමට යටත්වනු ඇත. එම සම්පූර්ණ සක්‍රිය සේවා කාලය තුළදී නිත්‍ය හමුදාවේ නැවියන්ට අදාළ වැටුප් සහ දීමනා ස්වෙච්ඡා නාවික හමුදාවේ සාමාජිකයන්ට ද ගෙවනු ලැබේ.

6. මෙම පුරප්පාඩු නිත්‍ය හමුදාවේ නොව, ස්වෙච්ඡා නාවික හමුදාවේ බවත්, තෝරා ගැනීම වැටුප් ලබන ස්ථිර රැකියාවකට නොවන බවත් අවධාරණයෙන් සඳහන් කරනු ලැබේ.

7. අයැදුම්කරු පුද්ගලිකව හඳුනන වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් පසුගිය අවුරුදු දෙක තුළ ලබාගත් චරිත සහතික දෙකක්වත් අඩු වශයෙන් ඉල්ලුම්පතට අමුණා එවිය යුතුයි.

8. ඉල්ලුම්පත් ගණනේ හැටියට, අවශ්‍යතාවයක් ඇති වුවහොත්, ඉහත කොන්දේසි සපුරාලන අය අතුරෙන් මූලික තේරීමක් කරනු ඇත. ඉන් අනතුරුව, තේරීම් මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර, අවසන් තෝරා ගැනීම කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට එවැනි සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ස්ථානය, වේලාව සහ දිනය ලියා දන්වනු ඇත. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් ලංකාණ්ඩුවෙන් ගෙවනු නොලැබේ. ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

9. ඉල්ලුම් පත් පහත දක්වා ඇති අයුරින් සකස් කර අණදෙන නිලධාරි, ස්වෙච්ඡා නාවික හමුදාව, කොච්චිකඩේ, කොළඹ 13 යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම් පතෙහි ද, එය බහාලන කවරයෙහි වම් පස ඉහළ කෙළවරහෙි ද ''අයැදුම් පත්‍රය—ස්වෙච්ඡා නාවික හමුදා සෙසු නිලයන්'' යනුවෙන් පහැදිලි ලෙස සඳහන් කළ යුතුයි. 1970 ජනවාරි මස 12 වැනි දින දවල් 12 ට පෙර ස්වෙච්ඡා නාවික හමුදා මූලස්ථානයට ඉල්ලුම් පත් ලැබිය යුතුයි..

ආර්. කදිර්ගාමර්,
රියර් අද්මිරාල්,
නාවික හමුදාපති.

නාවික හමුදා මූලස්ථානය,
කොළඹ 1.
1969 නොවැම්බර් 29 වැනි දින.

### ස්වෙච්ඡා නාවික හමුදාවට බැඳීම සඳහා අයදුම් පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) : :————.
2. ලිපිනය :————.
3. තදාසන්න තැපැල් /විදුලි පණිවුඩ කාර්යාලය :————.
4. තදාසන්න පොලිස් ස්ථානය :————.
5. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).
6. ජාතිය :————.
7. ඉහත දී, (යුද්ධ සේවය ඇතුළුව) යුද්ධ, නාවික ගුවන් සහ ස්වෙච්ඡා හමුදාවල සේවය ඇතොත්, දින සහ දැරූ තනතුරු ඇතුළුව, සම්පූර්ණ විස්තර දෙන්න :————.
8. මුදාහැරීමේ දී හෝ අස්කිරීමේ දී හැසිරීම :————.
   (මුදාහැරීමේ හෝ අස්කිරීමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
9. සමත්වූ පරීක්ෂනයන් දින සහ විෂයයන් ඇතුළුව :————.
   (අධ්‍යාපන සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
10. වෙනත් අදාළ කරුණු :————.
   (ක්‍රීඩා දක්ෂතාවයන් ආදිය)
11. පාසැලෙන් /විද්‍යාලයයෙන් අස්වූවාට පසු කරන ලද රැකියාව :————
12. දැන් සේව්‍ය යෝජකයාගේ නම සහ ලිපිනය :————.
   (ස්වෙච්ඡා නාවික හමුදාවට බැඳීම සම්බන්ධව කැමැත්ත දක්වන ලිපියක් දැන් සේව්‍ය යෝජකයාගෙන් ලබාගෙන ඉල්ලුම් පතට අමුණා එවිය යුතුයි)
13. උස :————. අඩි :————. අඟල් :————.
14. ඉදිරිපත් කරන ලද චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරු :
   1. ————.
   2. ————.
15. අවිවාහක විවාහක බව :————.
16. ඉල්ලුම්කරුගේ අත්සනින් සහතික කර සිටින ප්‍රකාශනය :————.

ඉහත සඳහන් කර ඇති ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට සත්‍ය ඒවා බැව් මෙයින් සහතික කරමි.

————.
දිනය ————. අයදුම්කරුගේ අත්සන.

(සංලක්ෂ්‍යය.—අයැදුම්පත අයැදුම්කරුගේ අත් අකුරින්ම පිළියෙළ කළ යුතුයි).

12–330—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

### මාර්ග හා කර්මාන්ත පිළිබඳ ප්‍රධාන ඉංජිනේරුගේ උප-දෙපාර්තමේන්තුවට ආධුනික සැළසුම්කරුවන් (සිවිල්) බඳවා ගැනීම—1969

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ආධුනික සැළසුම්කරුවන්ගේ (සිවිල්) තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් පරිමාණයන්.**—

(i) ආධුනිකයෙකුගේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 3,090 ක් වේ. පුහුණුවීමේ කාලසීමාව වර්ෂ දෙකක් හෝ අවශ්‍ය පරිදි ඊට වැඩි කාලසීමාවක් වනු ඇත.

(ii) ආධුනික කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් හා නියමිත විභාගයන්ගෙන් සාමාර්ථය ලැබීමෙන් පසුව, ආධුනිකයින් II වැනි පන්තියේ සැළසුම්කරුවන් වශයෙන් පත් කරනු ලැබේ. සැළසුම්කරුවන්ගේ ශ්‍රේණියේ ඇබෑර්තු නොතිබුණහොත්, II වැනි පන්තියේ සැළසුම්කරුවන්ට අදාල වැටුප් පරිමාණයේ, අතිරික්ත සැළසුම්කරුවන් වශයෙන් ඔවුන් සේවයේ රඳවා ගනු ලැබේ.

(iii) සැළසුම්කරුවන්ගේ වැටුප් පරිමාණයන් පහත සඳහන් පරිදි වේ :—

II වැනි පන්තිය—වර්ෂයකට රු. 3,432—144—රු. 6,456 යි.

I වැනි පන්තිය—වර්ෂයකට රු. 6,600—180—රු. 8,040 යි.

විශේෂ පන්තිය—වර්ෂයකට රු. 8,280—240—රු. 9,240 යි.

එක් ශ්‍රේණියකින් තවත් ශ්‍රේණියකට උසස් කිරීම රඳා පවත්නේ, ඇබෑර්තු, ජ්‍යෙෂ්ඨත්වය, යෝග්‍යතාවය හා එවකට පවත්නා බඳවා ගැනීමේ පරිපාටිය අනුවය.

3. **වයස් සීමාව.**—ඉල්ලුම්කරුවන් මනා දේහයෙන් යුක්ත අවිවාහකයන් විය යුතු අතර, ඉල්ලුම් පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට වයසින් අවුරුදු 16 ට නොඅඩුවූත්, අවුරුදු 24 ට නොවැඩිවූත් අය විය යුතු ය.

4. **අධ්‍යාපන හා කාර්මික සුදුසුකම්.—**

**ඉල්ලුම්කරුවන් :**

(අ) ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ; හෝ

(ආ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික), භෞතික විද්‍යාව සහ තවත් විෂයයන් තුනකින් (එනම් විෂයයන් හයකින්) දෙවරකට වැඩි නොවන වාර ගණනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ; හෝ

(ඇ) ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහ භෞතික විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව ඉහත සඳහන් විභාගවලට වඩා උසස් විභාගයකින් සාමාර්ථය ලැබ—

ලංකා කාර්මික විද්‍යාලයේ, කටුබැද්දේ කාර්මික විද්‍යායතනයේ සැළසුම්කරුවන් සඳහා නියමිත එක් අවුරුදු සම්පූර්ණ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලැබ සිටිය යුතු ය.

5. **සේවා කොන්දේසි.—**

(i) තෝරා ගනු ලබන ඉල්ලුම්කරුවන් ආධුනික කාලසීමාවකට භාජනය කරනු ලැබේ.

(ii) ආධුනික කාලසීමාව තුළදී ඔවුන් ලංකා කාර්මික විද්‍යාලයේ සවස් වරුවේ පවත්වනු ලබන පන්තිවලට සහභාගිවී (අනිකුත් නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලට අමතර වශයෙන්) නියමිත පරීක්ෂණයන්ගෙන් සාමාර්ථය ලැබිය යුතුය.

(iii) තෝරා ගනු ලබන ඉල්ලුම්කරුවන්, ආධුනික කාලය සම්පූර්ණ කර II වැනි පන්තියේ සැළසුම්කරුවන් වශයෙන් පත්වීම් ලැබීමෙන් පසු, වර්ෂ 5 ක කාලසීමාවක් ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට අත්සන් තැබිය යුතු ය.

(iv) ආධුනිකයෙකුගේ ගිවිසුම, අසතුටුදායක හැසිරීම නිසා හෝ, පුහුණුවෙන් සතුටුදායක ප්‍රගතියක් නොලබනවා නම් හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයන්ගෙන් හා කාර්මික විද්‍යාලයේ පරීක්ෂණයන්ගෙන් අසමත්වුවහොත් හෝ දිගටම පුහුණු කරගෙන යෑම මොනයම් හේතුවක් නිසා හෝ දෙපාර්තමේන්තුවට ඵලදායක නොවනවා නම් හෝ කලින් දැනුම්දීමක් නොදී අවලංගු කළ හැකි ය.

(v) පත්වීම් ලැබීමට ප්‍රථමයෙන්, ආධුනිකයින් දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීම සඳහා සුදුසු ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා පවත්වනු ලබන අක්ෂි දෘෂ්ටි පරීක්ෂණයක් ද ඇතුළු වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතු ය.

6. මරදානේ, ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ, දුම්රිය සාමාන්‍යාධිකාරීගේ කාර්යාලයේදී තේරීමේ මණ්ඩලයක් ඉදිරිපිට පෙනී සිටීමට හෝ අවශ්‍යයයි තීරණය කරනු ලබන සම්මුඛ පරීක්ෂණය කට තමන්ගේ වියදමින් පෙනී සිටීමට අපේක්ෂකයන් සූදානමින් සිටිය යුතු ය.

7. ඉල්ලුම් පත්‍ර, ඉල්ලුම්කරුවන්ගේම අත්අකුරින්, මෙහි අග දැක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලව, උප්පැන්න, අධ්‍යාපන, කාර්මික හා චරිත සහතිකවල පිටපත් ද සහිතව පහත සඳහන් ලිපිනයට 1969 දෙසැම්බර් මස 26 වැනි දින, ප. ව. 4.30 ට ප්‍රථම ලැබෙන පරිදි එවිය යුතු ය :—

දුම්රිය සාමාන්‍යාධිකාරී,
දුම්රිය සාමාන්‍යාධිකාරීගේ කාර්යාලය,
මරදාන, කොළඹ-10.

ඉල්ලුම්කරුවකු විසින් සපයන කරුණුවලින් එකකුදු හෝ අසත්‍ය බව පෙනී ගියහොත්, ඔහු පත්වීම ලදහොත් එම පත්වීම අවලංගු කිරීමට අවකාශ තිබේ.

8. ඉල්ලුම් පත්‍රයක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දින යන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි ඉල්ලුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුයි.

9. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයගේ ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන්නේ ඒවා, ඔවුන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණී.

10. ඉල්ලුම්කරුවකු තෝරා පත්කිරීම සඳහා කෙරෙන කොයි අන්දමේ කැමති කරවා ගැනීමක් හෝ බලපෑමක්, ඉල්ලුම්කරුගේ අපේක්ෂකත්වය නිෂ්ප්‍රභා කිරීමට හේතුවනවා ඇත.

11. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ පළ කර ඇති රජයේ සේවයේ තනතුරු සඳහා පත්කිරීම්වලට අදාල සාමාන්‍ය කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයය,
මරදාන, කොළඹ-10.
1969 දෙසැම්බර් මස 3 වැනි දින.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ආධුනික සැළසුම්කරු තනතුර—(සිවිල්) 1969—ලං.දු.සේ.**

1. සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) :————.

2. සම්පූර්ණ තැපැල් ලිපිනය (පැහැදිලි ලොකු අකුරෙන්) :————

3. ජාතිය :————.
   (අ) පරම්පරාවෙන්ම ලංකා රටවැසියෙක් ද, නැතහොත්
   (ආ) ලියාපදිංචි කිරීමෙන් රටවැසි බව ලද්දෙක් ද යන බව පරම්පරාවෙන් ලංකා රටවැසි බව ලද්දෙක් නම් පහත සඳහන් තොරතුරු සැපයිය යුතු ය :—
   (අ) ඉල්ලුම්කරු උපන් ස්ථානය :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා උපන් ස්ථානය :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මීමුත්තා උපන් ස්ථානය :————.

   ඉල්ලුම්කරු ලංකාවේ ඉපදී ඇත්නම් (අ) කොටසට අමතරව (ආ) කොටස හෝ (ඇ) සහ (ඈ) යන කොටස් දෙකම පුරවා තිබිය යුතු ය. ඉල්ලුම්කරු ලංකාවේ ඉපදී නැත්නම් (අ) කොටසට අමතරව (ආ) සහ (ඇ) යන කොටස් හෝ (ඇ) සහ (ඈ) යන කොටස් පුරවා තිබිය යුතුය.

4. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
   1969 දෙසැම්බර් මස 26 වැනි දිනට වයස : අවුරුදු :——, මාස : ——, දවස් :——.

5. විවාහකද, අවිවාහකද යන වග :————.

6. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (විස්තර වශයෙන් සඳහන් කර සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

7. ඔබ කටුබැද්ද කාර්මික විද්‍යායතනයේ එක් අවුරුදු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලැබ තිබේ ද? :————.

8. දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයෙක් ද, නැතහොත් දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයෙකුගේ පුත්‍රයෙක් ද යන වග සඳහන් කරන්න :————.

   දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයෙක් නම් පහත දැක්වෙන විස්තර සපයන්න :—
   (i) දැනට තමා දරණ තනතුර හා දෙපාර්තමේන්තු අංකයක් ඇතොත් එය :————.
   (ii) දැනට සේවය කරන ස්ථානය :————.
   (iii) පළමුවෙන් පත්වීම් ලැබූ දිනය :————.

9. ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් ආයතනයන්හි, එනම්, අද්මිරාල්තියෙන් හෝ ගුවන් අමාත්‍යාංශයෙන් මුදා හරිනු ලැබූ හේවා වසමට අයත් නොවූ සේවකයෙක් ද, යුද්ධ සිරකරුවෙක් ද, නැතහොත් සේවා මුක්ත භටයෙක් ද යන වග :————.
   (විස්තර සහිතව ඔප්පු කළ යුතුයි.)

මා දැක්වූ තොරතුරු මා දන්නා පමණින් ද, මගේ විශ්වාසයේ හැටියට ද, සත්‍ය බව ප්‍රකාශ කර සිටිමි. මෙම තනතුරුවලට බඳවා ගැනීමට අදාල නියමයන් අනුව, මා නුසුදුස්සෙකු බව තීරණය වුව හොත්, මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වෙන බවද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12-484—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## අධිකාරී පත්වීම් සඳහා ඇබෑර්තු—ලංකා ස්වේච්ඡා බලසේනාව

1. ලංකා ස්වේච්ඡා බලසේනාවේ 4 වන සංවර්ධන හා නිර්මාන රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු (ස්වේච්ඡා) හි, අධිකාරී පත්වීම් සඳහා ඇබෑර්තු තිබේ.

2. මෙම ඇබෑර්තු පිරවීම සඳහා පහත සඳහන් එක් එක් නිලය, ඉදිරියෙන් දක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| නිලය | වයස | විශේෂ සුදුසුකම් |
|---|---|---|
| (අ) ලුතිනන් සහ උපකරණ පාලක (කාර්මික නිළධාරි) | 1970.1.5 දිනට අවු.21–40... | අඩුම අධ්‍යාපනික සුදුසුකම වනුයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන විභාගයකි. පහත සඳහන් දය සම්බන්ධයෙන් තමාට අදල වන පරිදි, ඔවුන් සාර්ථක අන්දමින් සම්පූර්ණ කර ඇති කාර්මික විභාගයන් සම්බන්ධයෙන්, තමන් ලබා ඇති දනීම සහ පළපුරුදුකම් ඉල්ලුම්කරුවන් විසින් සඳහන් කළ යුතු වේ.<br>(අ) ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු.<br>(ආ) ජලය සැපයීම සහ කාණු තැනීමේ කටයුතු.<br>(ඇ) පාරවල් සහ පාලම් ඉදිකිරීමේ කටයුතු.<br>(ඈ) ඇස්තමේන්තු සහ ප්‍රමාණයන් ගැනීමේ කටයුතු.<br>(ඉ) යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීමේ කටයුතු.<br>(ඊ) විදුලි භාණ්ඩ සහ සුවිච් ගියර් සම්බන්ධයෙන් නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීමේ කටයුතු.<br>(උ) මිනින්දෝරු සහ තැනිතලා කිරීමේ කටයුතු.<br>(ඌ) සටහන් සැකසුම් සහ සැලසුම් කිරීමේ කටයුතු.<br>(එ) කම්කරු පරිපාලනය. |
| (ආ) ලුතිනන් සහ උපකරණ පාලක (කාර්මික නිළධාරි) (ගිණුම් තැබීමේ නිළධාරි) | 1970.1.5 දිනට අවු.21–40... | (අ) රජයේ සේවා හෝ පුද්ගලික අංශයේ ගිණුම් ක්‍රියා පිළිවෙත සම්බන්ධයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් සහ මිළ ගාස්තු ගණන් තැබීමේ දනීම තිබිය යුතුයි. |

සැ.යු. —ඉල්ලුම්කරුවන් විසින් කරනු ලබන සුදුසුකම් සහ වෙනත් අයිතිවාසිකම් සම්බන්ධයෙන් හැකිතාක් දුරට දෙපාර්තමේන්තු හෝ පිළිගත් සංස්ථාවන්ගෙන් ලබාගත් සහතික අමුණා එවිය යුතුයි.

3. **පොදු කොන්දේසි.**—ලංකා ස්වේච්ඡා බලසේනාවේ අධිකාරී පත්වීම් සඳහා ඉල්ලුම් කරන අපේක්ෂකයින්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි.

(අ) ලංකාවේ පුර වැසියෙකු විය යුතුයි.

(ආ) යුද්ධ හමුද ආඥපති තැන විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට නීරෝගීමත් අයෙකු විය යුතුයි.

සැ. යු.—රජයේ භාෂා ප්‍රතිපත්තිය, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ නියමයන්ට අනුකූලව ක්‍රියා කරන්නට සූදනම්ව සිටිය යුතුයි

4. ස්වේච්ඡා බලසේනාවේ නිළධාරියෙකු සාමාන්‍ය වශයෙන් එක්තරා පුහුණු පෙරෙට්ටු ගණනකටහා දින 14 ක වාර්ෂිකකඳවුරකට සහභාගී විය යුතුයි.

5. ලංකා ස්වේච්ඡා බලසේනා රෙගුලාසි අනුව, ස්වේච්ඡා බලසේනාවේ නිළධාරියෙකු හට හුදෙක් ඔහුට දරන්නට වන වියදම් පියවා ගැනීම්වස් යම් යම් වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.

6. පොදු සේවා නීති රීති යුද හමුද පනතට හා ලංකා ස්වේච්ඡා බලසේනාවේ ව්‍යවස්ථාවලට අනුකූල වනු ඇත. හමුද පණතේ 7 හා 19 වැනි වගන්ති (357 වැනි අධිකාරය) අනුව ස්වේච්ඡා සේවකයෙකු සක්‍රිය සේවය සඳහා කැඳවීමට යටත් වනු ඇත. එම සේවය සම්පූර්ණ සක්‍රිය සේවය වන අතර. ඒ සේවා කාලය තුලදී නිත්‍ය හට හමුදවේ නිළධාරීන්ට ගෙවනු ලබන වැටුප් හා දීමනා ස්වේච්ඡා බලසේනාවේ අයටද ගෙවනු ලැබේ.

7. මෙම ඇබෑර්තු නිත්‍ය හට සේනාවේ නොව ස්වේච්ඡා බලසේනාවේ බවත්, තෝරා ගැනීම් වැටුප් ලබන ස්ථිර රැකියාවක් නොවන බවත්, අවධාරණයෙන් දනුම් දෙනු ලැබේ.

8. අයදුම්කරු පෞද්ගලිකව හඳුනන වැදගත් තැනැත්තන් දෙදෙනෙකුගෙන් පසුගිය අවුරුදු දෙක ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක්වත් අඩු වශයෙන් ඉල්ලුම් පතට අමුනා එවිය යුතුයි.

9. අධික ඉල්ලුම් පත් ගණනක් ලදහොත් ඉහත සඳහන් කොන්දේසි අනුව සුදුසුකම් ඇති අය අතුරින් මූලික තේරීමක් කරනු ලැබේ. මෙම අයදුම්කරුවන්ව, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරන තේරීම් මංඩලයක සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් පසුව, අවසන් තෝරාගැනීම පවත්වනවා ඇත. සම්මුඛ පරීක්ෂණයට තෝරාගන්නා අයදුම්කරුවන්ට, එය පවත්වන ස්ථානයත්, දිනයත්, වේලාවත් ලියා දන්නනවා ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹදී පවත්වනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් රජයෙන් දෙනු නොලැබේ. තේරීම් මංඩලයේ සම්මුඛ පරීක්ෂණයට තෝරා නොගන්නා අයදුම්කරුවන්ට ඒ බව දන්වනු ලැබේ.

10. සියළුම ඉල්ලුම්පත් පහත නියම කර ඇති අයුරු, පිළියෙලකර යුද හමුද මූලස්ථානය තැ.පෙ. 553, කොළඹ 3, කියා ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම් පතෙහිද, එය බහාලන කවරයෙහිද " ඉල්ලුම්පත්‍රය—ලංකා ස්වේච්ඡා බලසේනාව—අධිකාරී පත්වීම් " කියා සඳහන් කළ යුතුයි. ඉල්ලුම්පත් 1970 ජනවාරි 5 දින අ.භා. 4.30 ට ප්‍රථම යුද හමුද මූලස්ථානය වෙත ලැබිය යුතුයි.

සැ. යු.—(1) ඉල්ලුම්පත් මෙම මූලස්ථානයෙන් නිකුත් කරනු නොලැබේ.

(2) මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා නොලබනු ලබන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(3) රැකියාවල නියුතුව සිටින ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම්පත් තමාගේ හාම්පුතුන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම්කරු ස්වේච්ඡා බලසේනාවට බැඳීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බව හාම්පුතුන් විසින් සහතික කළයුතුවේ.

ඇම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්, මේජර්-ජනරාල්,
යුද්ධ හමුදධිපති වෙනුවට.

1969 නොවැම්බර් 30 වැනි දින,
යුද්ධ හමුද මූලස්ථානය,
තැ.පෙ. 553, කොළඹ.

### ඉල්ලුම් පත්‍රය

### ලංකා ස්වේච්ඡා බලසේනාවේ අධිකාරී පත්වීම්

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. ඉතා ආසන්න තැපැල්/විදුලි පණිවුඩ කාර්‍යාලය :————.

4. ඉතා ආසන්න පොලිස් ස්ථානය :————.

5. උපන් දිනය :———— වයස :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

6. ජාතිය :————.

7. ඇත්නම්, මීට ප්‍රථම කරන ලද හමුදා (යුද සේවය ඇතුළුව) නාවුක, ගගන සේවය, ස්වේච්ඡා සේවය ආදියෙහි සම්පූර්ණ විස්තර හා ඒ කාල සීමාවන් හා ඒවායේ දරූ නිලයන් :————.

8. යුද හමුදාවෙන් අස්කිරීමේදී හෝ එහි සේවය අවසානයේදී හමුද හැසිරීම, (අස්කිරීමේ සහතිකය හෝ සේවය අවසානයේදී දුන් සහතිකයේ පිටපතක්ද ඇමිණිය යුතුයි.) :————.

9. ඉල්ලුම් පත ඉදිරිපත් කරනු ලබන තනතුර :————.

10. විෂයයන් හා දිනයන් ඇතුළුව සමත් කළ විභාගයන් (අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.) :————.

11. සමත්කර ඇති කාර්මික විභාගයන්, ඉහත 2(අ) සහ (ආ) ඡේදයන්හි දක්වා ඇති විෂයයන් සම්බන්ධයෙන් දැනීම සහ පළපුරුදුකම් :————.

12. උස :—. අඩි :————. අඟල් :————.

13. විවාහකද ? අවිවාහකද ? :————.

14. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ලබාගත් ක්‍රීඩා ගුරතාවයන් :————.

15. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තියක් ලැබූ වෙනත් ක්‍රීඩාවන් :————.

16. ඔබේ පාසැල් සහ විශ්ව විද්‍යාල කාල සම්බන්ධ පහත සඳහන් විස්තර සපයන්න :————.

පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නම :————.

ඇතුළත් වූ දිනය :————.

අස්වූ දිනය :————.

සමත් කළ ප්‍රසිද්ධ විභාගයන් :————.

17. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකියාවන් පිළිබඳව පහත සඳහන් විස්තර සපයන්න :—

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | කාලය | සිට | දක්වා |
|---|---|---|---|---|
| | | | | |

(ස්වේච්ඡා බලසේනාවට බැඳීම සම්බන්ධවූ කැමැත්ත දක්වෙන ලිපියක් දුන් සේවා යෝජකයාගෙන් ලබාගෙන අමුණා එවිය යුතුයි.)

18. චරිත සහතික ලබාගෙන තිබෙන අයගේ නම් සහ ලිපිනයන් (සහතික පිටපත් අමුනා එවිය යුතුයි.) :————.

19. ඉල්ලුම්කරුගේ අත්සනින් සහතිකකර සිටින ප්‍රකාශනය :—

ඉහත සඳහන් ප්‍රශ්නවලට මා විසින් සපයන ලද පිළිතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බව මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම් කරුගේ අත්සන.

දිනය :————.

12–344—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පුරප්පාඩුවක්

මණ්ඩලීය සංවිධානයේ වෛද්‍ය කොට්ඨාශයේ V වෙනි ශ්‍රේණියේ සහකාර වෛද්‍ය වෘත්තීය තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර එවන මෙන් ලංකාවේ පුරවැසියන්ගෙ මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. **පඩි ක්‍රමය.**—(සියළු දීමනාවන් ඇතුළුව) මසකට රු. 600—40×10—රු. 1,000 කාර්යක්ෂමතා කඩඉම් රු. 800 හා රු. 920 ප්‍රථමයෙනි. (තෝරාගත් අපේක්ෂකයා සුදුසුකම් හා පළපුරුද්ද අනුව යථෝක්ත පඩි ක්‍රමයේ සුදුසු පඩි පියවරක තැබිය හැක.)

3. **සුදුසුකම්.**—(i) **වයස.**—1969.12.1 වෙනි දිනවන විට අවුරුදු 25 ට අඩු නොවූද, අවුරුදු 35 ට වැඩි නොවූද අය විය යුතුයි.

(ii) **වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද.**—යටත් පිරිසෙයින් අවුරුදු 3 නේ සිට 4 දක්වා පළපුරුද්ද සහිතව ලංකා වෛද්‍ය විද්‍යාලයේ ඇපොතිකරි විභාගය.

4. (අ) රාජ්‍ය සේවාවෙහි හෝ පළාත් පාලන සේවාවෙහි සිටින නිලධාරීන් ඉල්ලුම්පත්‍ර එවිය යුත්තේ ඒ ඒ දෙපාර්තමේන්තු මගිනි. එම ඉල්ලුම්පත්‍ර සළකා බලනු ලබන්නේ එම දෙපාර්තමේන්තුවල ප්‍රධානියන් 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවය කිරීමට එම නිලධාරීන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. නැතහොත් එම නිලධාරීන් රාජ්‍ය සේවාවෙන් හෝ පළාත් පාලන සේවාවෙන් ස්ථිර ලේකම් තැනගේ අවසර ඇතිව ඉල්ලා අස්වීමට කැමති වෙතොත් පමණකි.

(ආ) සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද, දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද, නිලධාරීන් එවන ඉල්ලුම්පත්‍ර සැලකිල්ලට භාජන කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා ඔවුන් (පත්කිරීමට) තෝරුනොත් තව සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම්පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

5. **සේවා කොන්දේසි.**—තෝරාගනු ලබන අපේක්ෂකයා 1 වෙනි වතාවට තුන් අවුරුදු පුවාසන කාලය පිට පත්කරනු ලැබේ. ඔහු පහත සඳහන් වන කොන්දේසිවලට යටත් විය යුතුය :—

(1) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(2) දැනටමත් පණවා ඇත්තාවූද, කලින් කල පණවනු ලබන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුය.

(3) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයේ සිංහල ප්‍රවීණත්වයක් ලබාගත යුතුය.

(4) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10 ක දායක මුදල් ගෙවිය යුතුය. මණ්ඩලීය දායක මුදල සියයට 15 කි.

(5) ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීමට කැමති විය යුතුය.

6. පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1969.12.29 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවක මණ්ඩල කළමනාකාර තැන.

1969 දෙසැම්බර් මස 2 වෙනි දින,
කොළඹ 5, කිරුළ පාරේ,
200 වෙනි ස්ථානයේදීය.

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ඉල්ලුම්පත්‍ර පෝරමය

(1) ඉල්ලන තනතුර :————.

(2) ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නම :————.

(3) ලියුම් ලැබෙන පිළිවෙල :————.

(4) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් අමුණන්න)

(5) 1969.12.1 දිනට වයස :—අවුරුදු :—මාස :— දවස් :—

(6) ලාංකිකයෙකු වූයේ පෙළපතින්ද, ලියා පදිංචි වීමෙන්ද යන වග :————.

(7) විවාහකද, අවිවාහකද යන බව :————.
(විවාහක නම් විවාහවූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න)

(8) ද්විතීය පාඨශාලා අධ්‍යයනය :—
(ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත්වූ විභාගයද දිනයත් සහිතව සඳහන් කරන්න)

(9) උසස් අධ්‍යයනය : (ඔබ ඉගෙනීම ලැබූ විද්‍යායතන, සාමාර්ථය ලත් විභාග, වෘත්තීය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයත් සහිතව සඳහන් කරන්න)
(සහතික පත්‍රවල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න)

(10) පාසැලෙන් අස්වූ දා සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. (එනම් දූරු පදවියේ හා සේවා යෝජකයාගේ නම, පත්වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස්කළ දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු.)

(11) වෘත්තිය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන්කිසි ආයතනයක විධායක තනතුරක වැඩකිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර : (දූරු තනතුරු, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළුවූ පඩි යන මේවා දිනයන් සහිතව සඳහන් කරන්න.)

(12) මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් :————.
(මේ තනතුරට ඔබේ සුදුසුකම් වැඩි කරවන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂේප විස්තරයක් ලියන්න.)

(13) සිංහල භාෂාව ඉගෙනගත් ඉහළම ප්‍රමාණය :————.

(14) මීට කලින් ඔබ ලංකා ගමනා ගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද ?
එසේ නම් එහි ප්‍රතිඵලය කුමක්ද ? :————.

(15) සෙසු විස්තර :————.

(16) යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරද කරුවෙකු වූයේදැයි සඳහන් කරන්න. වරදකරුවකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.

(17) ඔබ ගැන තොරතුරු දැනගැනීමට සුදුසු නෑනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න

1. ..................................................

2. ..................................................

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තේරීමට කලින් දැනගතහොත් මා නුසුදුස්සෙකු විය හැකි නියාව හා තෝරා ගැනීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුවාගේ අත්සන.

දිනය :————.

12–522—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ඇබෑර්තුවක්

ලංකා ගමනාගමන මණ්ඩලයේ ගිනිනිවුම් නිලධාරි තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරාගනු ලබන අයදුම්කරු සුදුසුකම් හා පළපුරුද්ද අනුව මණ්ඩලීය සේවයේ 4 වෙනි ශ්‍රේණියට හෝ 5 වෙනි ශ්‍රේණියට පත්කරනු ඇත.

3. **4 වෙනි ශ්‍රේණියේ පඩි ක්‍රමය.**—රු. 700—40 × 5—50 × 6—රු. 1,200 කාර්යක්ෂමතා කඩයිම් රු. 900 ට හා රු. 1,050 ට ප්‍රථමයෙනි.

**5 වෙනි ශ්‍රේණියේ පඩි ක්‍රමය.**—රු. 600—40—රු. 1,000. කාර්යක්ෂමතා කඩඉම් රු. 800 ට හා රු. 920 ට ප්‍රථමයෙනි.

4. 1969.9.1 වෙනි දාට වයස අවුරුදු 35 ටත් 45 ටත් අතර විය යුතුය.

5. අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සමත් වී සිටිය යුතුය.

6. අයදුම්කරුවන්ට ගිනිනිවුම් කටයුතු සම්බන්ධයෙන් සන්නාහ සන්නද්ධ සේවාවල හෝ නාගරික ගිනිනිවුම් හමුදාවක් යටතේ පිරිසෙයින් 5 අවුරුද්දක පළපුරුද්දක් තිබිය යුතුය. විධායක තරාතිරමේ පරිපාලන හා කෘත්‍යාධිකරණ කටයුතු සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. විශාල ගිනි නිවීම පිළිබඳ හා ගිනි වැලැක්වීමේ කටයුතු පිළිබඳ පළපුරුද්දක්ද ගිනිනිවුම් උපකරණ පිළිබඳ මනා දැනුමක්ද අයදුම්කරුවන්ට තිබිය යුතුය.

8. අධ්‍යාපනය හා වයස පිළිබඳ ඉහත දක්වා ඇති සුදුසුකම් ගැන නොතකා 6 වෙනි හා 7 වෙනි ඡේදවල දක්වා ඇති සුදුසුකම් ඇති මණ්ඩලීය සේවකයන්ගෙන්ද ඉල්ලුම්පත් භාර ගනු ලැබේ.

9. ඉහත දක්වා ඇති සම්පූර්ණ අවශ්‍යතාවන්ට අනුකූලවන සුදුසු අයදුම්කරුවන් සෑහෙන ගණනක් නොසිටිය හොත් අධ්‍යාපනය හා වයස පිළිබඳ සුදුසුකම් වලට අනුකූල නොවන බාහිර අයදුම්කරුවන්ද සලකාබලනු ඇත.

10. (අ) රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවයෙහි සිටින නිලධාරීන් ඉල්ලුම්පත්‍ර එවිය යුත්තේ ඒ ඒ දෙපාර්තමේන්තු මගිනි. එම ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලබන්නේ එම දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් 1957 තේ 48 අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවය කිරීමට එම නිලධාරීන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි.

(ආ) සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද, දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද නිලධාරීන් එවන ඉල්ලුම්පත්‍ර සැලකිල්ලට භාජනය කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා ඔවුන් (පත්කිරීමට) තෝරුනොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම්පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

11. **සේවා කොන්දේසි.**—තෝරාගනු ලබන අපේක්ෂකයින් 1 වෙනි වතාවට තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත්කරනු ලැබේ. ඔවුන් පහත සඳහන් වන කොන්දේසි වලට යටත් විය යුතුයි :—

1. පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.
2. දැනටමත් පණවා ඇත්තාවූද, කලින් කල පණවනු ලබන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුයි.
3. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයේ සිංහල ප්‍රවීණත්වයක් ලබාගත යුතුයි.
4. මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10 ක දායක මුදල් ගෙවිය යුතුයි. මණ්ඩලීය දායක මුදල සියයට 15 කි.
5. ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීමට කැමති විය යුතුයි.

12. පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකමණ්ඩල කළමනාකාර තැන වෙත 1969 දෙසැම්බර් මස 29 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවකමණ්ඩල කළමනාකාර තැන.

1969 යේ නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 5, කිරුළ පාරේ
අංක 200 වෙනි ස්ථානයේ දීය.

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ඉල්ලුම්පත්‍ර ෆෝර්මය

1. ඉල්ලන තනතුර :————.
2. ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නම :————.
3. ලියුම් ලැබෙන පිළිවෙල :————.
4. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් අමුණන්න)
5. 1969. 9. 1 දිනට වයස :— අවුරුදු :——, මාස :——, දවස් :——.
6. ලාංකිකයෙකු වූයේ පෙලපතින්ද, ලියා පදිංචි වීමෙන්ද යන වග :————.
7. විවාහකද, අවිවාහකද යන බව :————.
   (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න)
8. ද්විතීය පාඨශාලා අධ්‍යායනය :————.
   (ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත් වූ විභාගයද දිනයත් සහිතව සඳහන් කරන්න)
9. උසස් අධ්‍යායනය :————.
   (ඔබ ඉගෙනීම ලැබූ විද්‍යායතනය, සාමාර්ථය ලත් විභාග, වෘත්තීය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.)
   (සහතික පත්‍රවල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න)
10. වෛධික සුදුසුකම් :————.
    (ඔබ ඉගෙනීම ලැබූ ආයතන, සමත් වූ විභාගය, ලබා ඇති සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.)
    (සහතික පත්‍රවල මුල් පිටපත් නොව අනු පිටපත් අමුණන්න.)
11. (පාසැලෙන් අස්වූදා සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.
    (එනම් දැරූ පදවියේ හා සේවා යෝජකයාගේ නම, පත් වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස්කළ දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු).
12. වෘත්තීය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන්කිසි ආයතනයක විධායක තනතුරක වැඩ කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර :————.
    (දැරූ තනතුරු, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළුවූ පඩි යන මේවා දිනයන් සහිතව සඳහන් කරන්න.)
13. මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් :————.
    (මේ තනතුරට ඔබේ සුදුසුකම් වැඩි කරවන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂෙප විස්තරයක් ලියන්න.)
14. සිංහල භාෂාව ඉගෙනගත් ඉහලම ප්‍රමාණය :————.
15. මීට කලින් ඔබ ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද? එසේ නම් එහි ප්‍රතිඵලය කුමක්ද? :————.
16. සෙසු විස්තර :————.
17. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරුවෙකු වූයේදැයි සඳහන් කරන්න. වරදකරුවෙකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.
18. ඔබ ගැන තොරතුරු දැනගැණීමට සුදුසු තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න :————.

    1. ————.
       ————.
       ————.
    2. ————.
       ————.
       ————.

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තේරීමට කලින් දැන ගතහොත් මා නුසුදුස්සෙකු විය හැකි නියාව හා තෝරා ගැණීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————.
ඉල්ලුම්කරුවාගේ අත්සන.

දිනය :————.

12–542—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### අනියම් ඉංග්‍රීසි ලඝුලේඛක තනතුරු

1969.11.28 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය හා සම්බන්ධයි. එම තනතුරු සඳහා අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනය දීර්ඝ කිරීමට තීරණය කර ඇත. මේ අනුව අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 1969.12.26 වැනි දින ප. ව. 4.30 දක්වා දීර්ඝ කරනු ලැබේ. අයදුම් පත් කොළඹ 7, තැ. පෙ. අංක 1138, වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.

වී. පද්මනාදන්,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

12–593—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## ලන්ඩන් හි පොදුරාජ්‍ය මණ්ඩලීය කාර්‍යාංශයේ සහකාර මහ ලේකම් තනතුර

ලන්ඩන් හි පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්‍යාංශයේ සහකාර මහලේකම් තනතුර සඳහා, අධ්‍යාපන ක්ෂෙත්‍රයෙහි විශිෂ්ඨත්වයක් දරන අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සම්පූර්ණ විස්තර හා අයදුම්පත් ආකෘති, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ විදේශ ආයතන ශාඛාව වෙත ලිපියකින් අයදුම් කිරීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ හෝ ලබාගත හැකිය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 1969.12.19 වේ.

ස්ථිර ලේකම්,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

1969.12.2,
කොළඹ 2.

12–491—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## 1969 ඔක්තෝබර් මස පවත්වන ලද නොතාරිස් අවසාන විභාගය

මෙහි පහත නම සඳහන් අයදුම්කරු ඔහුගේ නමට ඉදිරියෙන් පෙන්නුම් කරන භාෂාවෙන් නොතාරිස් වෘත්තියේ කටයුතු කිරීම සඳහා නොතාරිස් අවසාන විභාගයෙන් සමත් වී සිටින බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජී. පී. ගුණතිලක මහතා—සිංහල.

ජී. පී. තම්බයියා,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1969 නොවැම්බර් මස 27 දින,
කොළඹ දීය.

12–396—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## ඒකාබද්ධ රේගු සේවය

ඒකාබද්ධ රේගු සේවයේ II වන ශ්‍රේණියට ඇතුළත්වීමට බලාපොරොත්තු වන පුරුෂ පක්ෂයේ අපේක්ෂකයින් සඳහා තරග පරීක්ෂණයක්, විභාග කොමසාරිස් විසින් කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, යාපනය, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, රත්නපුරය, කුරුණෑගල යන මධ්‍යස්ථානයන්හි දී 1970 මාර්තු මස 14 දින පවත්වනු ලැබේ.

අපේක්ෂකයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නැති කිසි මධ්‍යස්ථානයක් වෙතොත් එම මධ්‍යස්ථානය අවලංගු කෙරෙනු ඇත.

**2. අපේක්ෂකයින් විභාගයට පෙනී සිටිය යුතු භාෂා මාධ්‍යය.—** මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් වීම සඳහා කලින් සමර්ථ වී සිටිය යුතු විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම (එනම් සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන්) මෙම විභාගයට ද පෙනී සිටිය යුතු ය.

එසේ වුවද,

(අ) මෙහි 6 ඡේදයෙහි දැක්වෙන අධ්‍යාපන සුදුසුකම් ඇති අපේක්ෂකයෙකු වෙතොත් ඔහු අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් වූ භාෂා මාධ්‍යයෙන්ම මෙම විභාගයට පෙනී සිටිය යුතු ය.

(ආ) සුදුසුකම් ලැබීම සඳහා තමන් සමත් වූ විභාගයේ දී විවිධ විෂයයන් සඳහා වෙනස් වෙනස් භාෂා මාධ්‍යයන්ගෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන් මෙම විභාගයේ දී පිළිතුරු සැපයිය යුත්තේ 14 වැනි ඡේදයෙහි දැක්වෙන (1) විෂයයට (රචනය හා සාරංශය) පිළිතුරු ලියන භාෂා මාධ්‍යයෙන්ම ය.

(ඇ) සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ පෙනී සිට සමත් වූ අපේක්ෂකයෙකුට නැතහොත් දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ අධ්‍යාපනය ලද අපේක්ෂකයෙකුට තමා කැමති නම් මෙම විභාගයේ දී සිංහල භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය හැකි වේ.

**3. වැටුප්.—**මෙම විභාගයෙන් සාමාර්ථය ලබා ඒකාබද්ධ රේගු සේවයේ II වැනි ශ්‍රේණියට පත් කරනු ලබන අපේක්ෂකයින්ට රු. 1,980 ක වාර්ෂික වැටුපකින් පටන්ගෙන රු. 120 ක වැටුප් වැඩිවීම් 16කින් හා රු 180ක වැටුප් වැඩිවීම් 8කින් ද රු. 5,340 දක්වා වැඩිවන වැටුප් ක්‍රමයක් හිමි වේ. (මෙම වැටුප් ක්‍රමයෙහි රු. 2,340, රු. 3,900 සහ රු. 4,800 යන වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වේ.)

**4. සේවා කොන්දේසි.—**

(අ) සාමාන්‍ය—

(i) මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

(ii) මෙම පරීක්ෂණයෙන් සාමාර්ථය ලද අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු ආධුනිකත්වය ඇතිව මෙම සේවයට පත් කරනු ඇත. මෙම තනතුරු විශ්‍රාම වැටුප් සහිත ය.

(iii) මෙම පරීක්ෂණයෙන් සාමාර්ථය ලද අපේක්ෂකයින් දිවා රෑ දෙකේදීම, තක්සේරු, ගාස්තු නිවාරණ යන ශාඛාවන්හි ද අපනයන කාර්යාලයේ, ගුදම් වල, ලංකාවේ ඕනෑම පලාතක සේවය කිරීමට හා ප්‍රධාන රේගු අයකැමි විසින් තීරණය කරනු ලබන එවැනි තවත් රාජකාරීන්හි යෙදවීමට ද යටත් වනු ලැබේ.

(iv) මෙම පරීක්ෂණයෙන් සාමාර්ථය ලැබ තෝරා ගනු ලබන අපේක්ෂකයෝ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධි විධානවලට ද, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින හෝ මතුවට පනවනු ලැබිය හැකි වූ හෝ යම් නීතිරීතිවලට සහ ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතු ය.

මෙම විභාගයට සිංහල භාෂා මාධ්‍යයෙන් පෙනී නොසිටි, එහෙත් පත් කිරීම සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂකයින්, ස්වකීය ආධුනික කාලසීමාව තුළ දී සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා ගත යුතු ය. ඔවුහු සිංහලය පිළිබඳ පහත සඳහන් ප්‍රවීණතා පරීක්ෂණවලින් ඒ ඒ පරීක්ෂණයන් ඉදිරියෙහි ඇති කාල සීමාවන් තුළ දී සමර්ථ විය යුත්තාහ :—

| පරීක්ෂණයේ ප්‍රමාණය | පරීක්ෂණයෙන් සමත් වීම සඳහා දී ඇති කාල සීමාව |
|---|---|
| I වැනි ශ්‍රේණියේ ප්‍රවීණතා පරීක්ෂණය (3 වන ප්‍රමාණ තත්ත්වය) ... | පත්වීම් දිනයේ සිට අවු. 1 යි. |
| II වැනි ශ්‍රේණියේ ප්‍රවීණතා පරීක්ෂණය (5 වන ප්‍රමාණ තත්ත්වය) ... | පත්වීම් දිනයේ සිට අවු. 2 යි. |
| III වැනි ශ්‍රේණියේ ප්‍රවීණතා පරීක්ෂණය (කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර ප්‍රමාණ තත්ත්වය) ... | පත්වීම් දිනයේ සිට අවු. 3 යි. |

ආධුනික කාලය අවසානයේ දී අපේක්ෂකයන්ගේ සේවය ස්ථිර කරනු ලබන්නේ ඔවුන්ගේ වැඩ සහ හැසිරීම සතුටුදායක නම් සහ ඉහත සඳහන් කළ III වැනි ශ්‍රේණියේ ප්‍රවීණතා පරීක්ෂණයෙන් සාමාර්ථය ලබා ඇත්නම් ය. නියමිත කාලය තුළ සිංහලය පිළිබඳ නියමිත ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් අසමත් වුවහොත් එහි ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම අත්හිටවනු ලැබීම ය. නියමිත කාල සීමාවට වඩා තව දුරටත් මාස 6 ක් ඇතුළත දී එකී පරීක්ෂණයෙන් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම අත්හිටුවීම එකී පරීක්ෂණයෙන් සමත් වන තුරු නැවැත්වීමක් බවට පරිවර්තනය වනවා ඇත. ආධුනික කාලය අවසානයේ දී III වැනි ශ්‍රේණියේ ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත්වීමට නොහැකි වූ කිසියම් අපේක්ෂකයෙකු වුවහොත් ඔහුගේ සේවය නවතාලීමට ඉඩ තිබේ.

**5. පත්වීම් දෙනු ලබන අන්දම.—**සාමාර්ථය ලබන අපේක්ෂකයන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකර, සුදුසු පුරප්පාඩු ඇති වූ විට ඔවුනට පත්වීම් දෙනවා ඇත.

**6. යෝග්‍යතාව පිළිබඳ සාමාන්‍ය කොන්දේසි.—**

(i) අපේක්ෂකයන් යහපත් චරිතයෙන් යුක්ත විය යුතු ය.

(ii) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතු ය.*

* රාජ්‍ය සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහාම 'ලාංකික' යන පදයෙන් අදහස් කරනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලබා ඇති තැනැත්තන් ය.

(iii) අපේක්ෂකයන්—

(අ) අංක ගණිතය හා ඉංග්‍රීසි භාෂාවෙන් පොදු අධ්‍යයන සහතික (සාමාන්‍ය පෙළ) විභාගයට නො අඩු තත්ත්වයේ සාමාර්ථයක් ලබා සිටිය යුතු හා

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් එකම අවස්ථාවක, එකම විභාගයෙන් විෂයයන් තුනකින් සාමාර්ථය ලබා සිටිය යුත්තා හ.

(iv) සෑම අපේක්ෂකයකුම 1970 ජනවාරි මස 5 දිනට තමා වයස් අවුරුදු 17 ට එළඹ ඇති බවට හා වයස අවුරුදු 24 නොඉක්මවා ඇති බව සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

**7. අයදුම් පත්.—**

(i) ආදර්ශ අයදුම්පත් පෝර්මයන් මෙම නිවේදනය අග පළ කර ඇත. අයදුම් කරුවන් විසින් මෙහි සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයේ පිළිවෙලට තමාගේ අයදුම් පත්‍ර තමා විභාගයට ඉදිරිපත් වන මාධ්‍යයෙන්ම භාග ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසියක පිළියෙල කර ගත යුතු අතර, අයදුම් පත්‍ර තමාගේ අත්අකුරෙන්ම සම්පූර්ණ කළ යුතු ය. මේ සඳහා පාවිච්චි කළ යුත්තේ එක් කඩදාසියක් පමණි. 1 සිට 6 දක්වා කොටු අයදුම් පත්‍රයේ 1 වැනි පිටුවෙහි ද, 7, 8 සහ 9 කොටු අයදුම් පත්‍රයේ 2 වැනි පිටුවෙහි (පසු පිටෙහි) ද සිටින සේ පිළියෙල කර ගත යුතු ය.

(ii) අයදුම් පත් 1970 ජනවාරි මස 5 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් කොළඹ 1, තැ. පෙ. 518 ප්‍රධාන රේගු අයකැමි වෙත ලැබෙන පරිදි ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතු ය.

එම දිනට පසුව ලැබෙන ඕනෑම අයදුම් පතක් භාරගනු නොලැබේ. අයදුම්පත්‍ර බහා එවනු ලබන ලියුම් කවරයේ, වම් පස ඉහළ කෙළවරේ, විභාගයේ නම සහ තමන් විභාගයට පෙනී සිටීමට කැමති මධ්‍යස්ථානය පැහැදිළිව සඳහන් කළ යුතු ය.

(iii) අයදුම්පත්වල රුපියල් 25ක් වටිනා මුද්දර අලවා අපේක්ෂකයාගේ අත්සන සහ දිනය ද යොදා විධි ප්‍රකාර කොට තිබිය යුතුය.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයින් විසින් එවනු ලබන අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු වල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. 1970 ජනවාරි 16 දිනට හෝ ඊට ප්‍රථමයෙන් හෝ ප්‍රධාන රේගු අයකැමි වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමකුත් සමඟ ස්වකීය අයදුම් පත් තමන්ගේ දෙපාර්තමේන්තු වල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලනු ලැබේ.

ප්‍රධාන රේගු අයකැමි ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට අයදුම් පත් නොඑවිය යුතු ය.

8. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) ප්‍රධාන රේගු අයකැමි වෙත ලැබුණු අයදුම්පත් වෙනුවෙන් ඒ ඒ අපේක්ෂකයන් වෙත ප්‍රවේශ පත්‍ර යවනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් තමන්ගේ ප්‍රවේශ පත්‍ර විභාග ශාලාව භාර පරිපාලන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය. එබඳු ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්කරුවන් තමන්ට නියම කර තිබෙන විභාග ශාලාවෙහිම පෙනී සිටිය යුතු ය. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැර අන්‍ය වූ විභාග ශාලාවකට පැමිණෙන කිසිම අපෙක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයට පෙනීසිටින සෑම අපේක්ෂකයෙකු විසින්ම තමන් විභාගයට පෙනී සිටින දිනයෙහිම ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලා පරිපාලක වෙත භාරදිය යුතු ය.

මේ දැන්වීම අවසාන කොටසේ විභාග අපේක්ෂකයන් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළ කොට ඇත. විභාග අපේක්ෂකයෝ මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

කිසිම අපේක්ෂකයෙකුට යටත් පිරිසෙයින් විභාගය පවත්වන දිනට සත් දිනකට කලින්වත් තම ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඔහු පහත දැක්වෙන තොරතුරුත් සමඟ "කොළඹ 1, ලංකා රේගුව, ප්‍රධාන රේගු අයකැමි" යන ලිපිනයට (විදුලි පණිවුඩ : "රේගුව", කොළඹ) ඒ බව අප්‍රමාදව දන්වා එවිය යුතු ය :—

(1) විභාගයේ නම

(2) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම

(3) සම්පූර්ණ ලිපිනය

(4) විභාගයට පෙනී සිටීම සඳහා අපේක්ෂකයා ඉල්ලා සිටි විභාග මධ්‍යස්ථානය

(5) අයදුම් පත ලියා පදිංචි කළ තැපැල් කාර්යාලය, අංකය හා අයදුම්පත තැපැල් කළ දිනය.

(ii) අපේක්ෂකයෙකු විභාගයට ඇතුළු කර ගැනීම ඊට ඔහුගේ ඇති යෝග්‍යතාව පිළිගැනීමක් නොවේ.

9. **හැඳින්වීමේ පත්‍ර.**—අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග පරිපාලකගේ සතුටට හේතුවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා ද පහත දැක්වෙන ලියකියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රයක්.

(ආ) මෙම විභාග දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදෙස් ගමන් බල පත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

(ඇ) විභාග දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක හෝ පොදු සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක් හෝ අධිකාරිත්ත්වයක් යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් ද සහිතව සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක්.

(ඇ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසු පිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක්. "පසු පිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති ..............................(අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අයගේ බව මම සහතික කරමි.

..............................
අයදුම්කරුගේ පුරුදු අත්සන.

.......................................
අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

නම සහ තරාතිරම :.......................
දිනය :........................."

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්ත්වය තාවකාලික ය. එම අපේක්ෂකත්ත්වය ප්‍රධාන රේගු අයකැමිගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. **සුදුසුකම් පිළිබඳ ලියවිලි.**—(i) අයදුම්පත සමඟ කිසිදු ලිපි ලේඛනාදියක් නොඑවිය යුතු ය. එහෙත් නියම කොට ඇති පරිදි අවශ්‍ය සියලුම විස්තර අයදුම් පතෙහි සඳහන් කළ යුතු ය. මෙසේ අවශ්‍ය වන කරුණු වලින් සම්පූර්ණ නොවන කිසි අයදුම් පතක් වෙතොත් එය, එහිම කුශලතා උඩ සළකා බලා ප්‍රතික්ෂේප කරන්නට ඉඩ තිබේ.

(ii) සුදුසුකම් ලද අපේක්ෂකයන් ලියකියවිලි වලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාවය ඔප්පු කළ යුතුය. එබඳු වූ අපේක්ෂකයන් එම ලියකියවිලි ප්‍රධාන රේගු අයකැමි විසින් ඉල්ලා සිටි විට නොපමාව ඔහු වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය.

(iii) පහත දැක්වෙන ලියකියවිලි අවශ්‍ය ය :—

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිවයුතු පුද්ගලයෙකු විසින් අත්සන් කරන ලද සහතිකයක් ;

**සංලක්ෂයය.**—අපේක්ෂකයා රජයේ හෝ උපකෘත හෝ පාඨශාලාවක අධ්‍යාපනය ලබමින් හෝ රජයේ හෝ උපකෘත පාඨශාලාවකින් ළඟ දී අස් වී හෝ සිටි නම්, චරිත සහතිකය ලබා ගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්ය වරයාගෙනි. නො එසේ වන කල්හි එම සහතිකය සමාදාන විනිශ්චයකාරයෙක්, අධිනීතිඥ කෙනෙක් හෝ නොතාරිස් කෙනෙක්, ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියෙක් හෝ රු. 2,400 ක් හෝ ඉන් වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙක් හෝ සාමාන්‍යයෙන් ප්‍රකටව දන්නා, කෙළින්ම තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන් වුවද ලබා ගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිලි සේ සඳහන් ව තිබිය යුතු ය.

රජයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයන් විසින් යහපත් චරිත පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියා පදිංචි නොකළ අපේක්ෂකයන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක් කිසියම් අපේක්ෂකයකුහට ඉදිරිපත් කළ හැක්කේ අනුමාන වයස් සහතිකයක් පමණක් නම්, එම අපේක්ෂකයාගේ උපන් දිනය වශයෙන් සළකනු ලබන්නේ සහතිකයේ සඳහන් වර්ෂයේ ජූලි මස 1 වැනි දින ලෙසට ය.

**සංලක්ෂ්‍යය.**—(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික කළ උද්ධෘත හෝ භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන එසේම ඔහු විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම්, යථායෝග්‍ය පරිදි උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 110 වැනි පරිච්ඡේදයේ අංක 27 හෝ 28 දරණ නියමයන් අනුව ස්වකීය උප්පැන්නයෙහි දැක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතු ය.

1957 අගෝස්තු මස 18 වැනි දින නිකුත් කරන ලද අංක 394 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ ප්‍රකාර ස්වකීය නම වෙනස් කළ, දැනට රජයේ සේවයේ ස්ථිර තනතුරු දරණ අපේක්ෂකයන් උප්පැන්න සහතිකයේ තමන්ගේ නම් වෙනස් කරවා ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍ය නොවේ.

(ඇ) ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියා පදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි) ;

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික පත් හෝ එසේ සහතික පත් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් (උදා.—පෞද්ගලික අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද ලංකා අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය) විභාගයේ ප්‍රතිඵල සටහන හෝ අපේක්ෂකයාගේ පාඨශාලාවේ ප්‍රධානයාගෙන් ලබාගත් ලිපියක්).

(iv) ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේ දී මෙම සියළුම ලියකියවිලි සූදානම් කොට තබාගන්නා ලෙස අපේක්ෂකයනට අවවාද කරනු ලැබේ. ප්‍රධාන රේගු අයකැමි විසින් ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන හෝ අපේක්ෂකයෙකු වෙතොත් ඔහු විභාගයට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. **අසත්‍ය තොරතුරු සැපයීම ගැන කෙරෙන දඬුවම්.**—මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට තරම් සුදුසුකම් නැති බව පෙනී ගියහොත්, විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ කවර අවස්ථාවක දී වුවද ඔහුගේ අපේක්ෂකත්ත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

අපේක්ෂකයෙකු විසින් දැන දැනම අසත්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනීගියහොත් හෝ ඔහු මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකුව සිටි බව ඔහුගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත් හෝ එයම ඔහු වහා සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත.

මෙම නිවේදනයේ සඳහන් නියමයන් සම්පූර්ණයෙන් පිළිනොපදින අයවළුන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**12. විභාග ගාස්තු ආපසු ගෙවීම.**—කිසිම කරුණක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු මුදල් අන්‍ය වූ කිසිම විභාගයක් වෙනුවෙන් මාරු කළ හැකි ද නොවේ.

**13. විභාගයට පෙනී සිටීම සඳහා රජයේ නිලධාරීන්ට නිවාඩු දීම.**—ප්‍රධාන රේගු අයකැමි විසින් පිළිගන්නා ලද අයදුම් පත් ඇති නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිවාඩු (රාජකාරි නිවාඩු නොවේ) දිය යුතු වේ.

**14. විභාග පරිපාටිය.**—විභාගය සඳහා නියමිත විෂයයන් සහ එක් එක් විෂය වෙනුවෙන් නියමිත ලකුණු ද පහත දක්වේ:—

| | | | ලකුණු |
|---|---|---|---|
| 1. | රචනය හා සාරාංශය | (පැය 2½) | 200 |
| 2. | සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය | (විනා.ඩි 45) | 100 |
| 3. | සාමාන්‍ය දැනීම | (පැය 1) | 100 |
| 4. | වාචික පරීක්ෂණය | | 100 |
| | එකතුව ... | | 500 |

**සංලක්ෂ්‍යය.**—(i) සෑම උත්තර පත්‍රයකම නරක අත් අකුරුවලට හා වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි අත් අකුරු ඇති අපේක්ෂකයන් විභාගයට නුසුදුස්සන් කරනු ලැබීමට ඉඩ ඇත.

(ii) සෑම ප්‍රශ්න පත්‍රයකින්ම 50% හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති අපේක්ෂකයන් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(iii) වාචික පරීක්ෂණයට කැඳවනු ලබන අපේක්ෂකයන්ගේ ගමන් හා අනිකුත් වියදම් දෙපාර්තමේන්තුව මඟින් දරනු නොලැබේ.

**නිර්දේශ පත්‍රය :**

(1) රචනය හා සාරාංශය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) : මෙම පත්‍රය අධ්‍යයන පොදු සහතික විභාගයේ (උසස් පෙළ) තත්ත්වයේ එකක් වේ.

(2) සාමාන්‍ය දැනීම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) : ලංකාවේ හා ලෝකයේ වර්තමාන සිදුවීම්, විද්‍යා, කලා, සාහිත්‍ය හා ක්‍රීඩා පිළිබඳ දැනීමක් අපේක්ෂකයන් විසින් ලබා තිබිය යුතු යැයි අපේක්ෂා කෙරේ.

මෙම විභාගයේ කාල සටහන පහත සඳහන් පරිදි වේ:—

පෙ. ව. 9 සිට පෙ. ව. 11.30 දක්වා—රචනය හා සාරාංශය
ප. ව. 1.30 සිට ප. ව. 2.15 දක්වා—සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය.
ප. ව. 2.30 සිට ප. ව. 3.30 දක්වා—සාමාන්‍ය දැනීම.

ප්‍රධාන රේගු අයකැමි විසින් කාල සටහනේ පිටපත් නිකුත් නොකරන බැවින්, අපේක්ෂකයන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම කාල සටහන්, සටහන් කරගන්නා ලෙස අපේක්ෂකයනට දන්වා සිටිනු ලැබේ.

විභාග මධ්‍යස්ථානය සම්බන්ධයෙන් අපේක්ෂකයින් විසින් තමන්ගේ අයදුම්පත් වල සඳහන් කර ඇති මධ්‍යස්ථානය ඔවුන්ගේ අවසාන තීරණයක් සේ සලකනු ලැබේ. එබැවින්ම එම තීරණයන් පිළිබඳ කිසි වෙනසක් කිරීම සඳහා කරනු ලබන කිසිම ඉල්ලීමක් භාරගනු නොලැබේ.

**16. වෛද්‍ය පරීක්ෂණය.**—සාමාර්ථය ලබන අපේක්ෂකයෝ ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවට වෛද්‍ය පරීක්ෂණයකින් ද සමත් විය යුත්තාහ.

17. මෙම රෙගුලාසි වලින් විස්තර නොකරන ලද මීට අදාළ වූ වෙනත් යම් කරුණක්වේ නම් එය ප්‍රධාන රේගු අයකැමිගේ කැමැත්ත පරිදි තීරණය කෙරෙනු ඇත.

ප්‍රධාන රේගු අයකැමි.

රේගු දෙපාර්තමේන්තුව,
කොළඹ, 1969. 11. 29.

**අයදුම් පත්‍රය**

රේගු දෙපාර්තමේන්තුව, කොළඹ

**විභාග අංකය :..............................**

**(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)**

**ඒකාබද්ධ රේගු සේවය**

1. මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
3. සම්පූර්ණ ලිපිනය :————.

(ආණ්ඩුවේ සේවයේ සිටින අපේක්ෂකයින් කාර්යාලයීය ලිපිනය සඳහන් කළ යුතුයි.)

4. (අ) ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ—
   (i) පරම්පරාවෙන් ද, නැතහොත්
   (ii) ලියා පදිංචි කිරීමෙන් ද, යන බව සඳහන් කරන්න.

   (ආ) උපන් ස්ථානය :—
   (i) අපේක්ෂකයාගේ :————.
   (ii) අපේක්ෂකයාගේ පියාගේ :————.
   (iii) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මුත්තාගේ :————.
   (iv) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මී මුත්තා ගේ :————.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා සහ ඔහුගේ පියා ද යන දෙදෙනාම උපන්නේ ලංකාවේ නම්, (i) සහ (ii) පමණක් පිරවීම සෑහේ. අපේක්ෂකයා, ඔහුගේ පියා හෝ උපන්නේ ලංකාවෙන් පිටත දී නම්, (i), (ii), (iii), (iv) යන සියල්ලම පිරවිය යුතු ය.

5. ඔබ විභාගයට පෙනී සිටීමට කැමති ස්ථානය :—
   (පළමු තේරීම) :————.
   (දෙවන තේරීම) :————.

6. සුදුසුකම්—
   (අ) උපන් දිනය :————.
   (ආ) අධ්‍යාපනික සුදුසුකම් :————.
   (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය : සාමාර්ථය ලත් විෂයයන් :————.
   මෙම සාමාර්ථයන් ලබාගත් විභාගයේ දිනය : ————.
   (ii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය : සාමාර්ථය ලත් විෂයයන් :————.
   මෙම සාමාර්ථයන් ලබාගත් විභාගයේ දිනය : ————.

7. (i) ඉහතින් මා දී ඇති තොරතුරු මගේ දැනීම පරිදි හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙයට අලවා ඇත්තේ කලින් පාවිච්චි නොකරන ලද්දාවූ වලංගු මුද්දර බවත්, මෙයින් දිවුරා සහතික කරමි.
   (ii) මේ විභාගය හා සම්බන්ධ නීති රීති වලට යටත්වීමට මම එකඟ වෙමි.

8. මුද්දර කොටුව—සැලකිය යුතුයි.—විභාගාපේක්ෂකයා රුපියල් විසිපහක් වටිනා මුද්දර මෙම කොටුවෙහි අලවා ඒ මත අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුයි. මුද්දර එක පිට එක ඇලවිය යුතු නොවේ.

මුද්දර කොටුව
රු. 25

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

*........................සේවයේ නියුක්ත/පදිංචි...........නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 1969........... මස..............වැනි දින ඔහු මා ඉදිරිපිට දී අත්සන කළ බවත්, මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :————.
නම, පදවිය හා තරාතිරම :————.
ලිපිනය :————.

* දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු විසිනි.

අනිකුත් අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සමාදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස් වරයෙකු, පෙරකදෝරුවකු, මහජන නොතාරිස් කෙනෙකු, රජයේ හෝ අධ්‍යක්‍ෂ පාලිත පාසැල ප්‍රධානයකු, නාවුක, ගගන, යුද්ධ හමුදාවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 2,400 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරණ පූජක කෙනෙකු යන මොවුන් ගෙන් කෙනෙකු විසිනි.

4. **සුදුසුකම්.**—මේ විභාගයට ඉදිරිපත් වන අපේක්ෂකයන්—

(i) යහපත් චරිතයෙන් යුක්ත විය යුතු ය.

(ii) ලාංකිකයන්* විය යුතු ය.

(iii) යටත් පිරිසෙයින්—

(1) සිංහල හෝ දෙමළ භාෂා විෂයයෙහි ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන පොදු සහතිකය (උසස් පෙළ) හෝ ;

(2) සිංහල හෝ දෙමළ ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ,

(3) සිංහල හෝ දෙමළ හෝ විෂයයක් වශයෙන් ඇති (විශේෂ සිංහල හෝ විශේෂ දෙමළ නොවේ) උසස් පාඨශාලා සහතිකය හෝ,

(4) සිංහල හෝ දෙමළ හෝ විෂයයක් වශයෙන් ඇති ව, ලන්ඩන් විශ්ව විද්‍යාලයේ කලා අංශයේ මධ්‍යම සහතිකය හෝ ලංකා විශ්ව විද්‍යාලයේ පොදු කලා විභාගයට සුදුසුකම් ලැබීමේ (ප්‍රථම) විභාග සහතිකය හෝ,

(5) භාණ්ඩාගාරයෙන් පවත්වන ලද සිංහල හෝ දෙමළ පිළිබඳ ප්‍රවීණතා විභාගයේ (උසස් පෙළ) සිංහල හෝ දෙමළ භාෂා විෂයයෙන් සාමාර්ථයක්

**යන ප්‍රධාන සුදුසුකම් වලින් එකක් හා යටත් පිරිසෙයින් පහත සඳහන් අතිරේක සුදුසුකම් වලින් එකක් ද ලබා තිබිය යුතු ය :—**

(අ) ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථයක් සහිත 1957 ජූලි හෝ ඉන් පෙර හෝ ප්‍රදානය කරන ලද ඉංග්‍රීසි භාෂාමය පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ ඕනෑම අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයක දී ඉංග්‍රීසි භාෂාව "ඒ" නිර්දේශයෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් සම්මාන සාමාර්ථයක් ඇති ව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ ඉංග්‍රීසි භාෂාවෙන් මේවාට සමාන හෝ උසස් හෝ තත්ත්වයක් ඇති ව අන්‍ය විභාගයකින් සාමාර්ථ ය.

(ආ) ඉංග්‍රීසි භාෂාව "ඒ" නිර්දේශයෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් දෙකකට නො වැඩි වාර ගණනකදී ලබන ලද අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය).

**සංලක්ෂ්‍යය.**—යම් යම් අපේක්ෂකයන් ඉහත සඳහන් විභාගවලින් යම්කිසිවකට පෙනී සිටි නමුත්, මෙම විභාගය සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට පෙර තමා පෙනී සිටි එම විභාගයේ ප්‍රතිඵල නිකුත් වී නැත් නම් එවැනි අපේක්ෂකයන් එවන ඉල්ලුම් පත්‍ර භාර ගනු නො ලැබේ.

(iv) 1970 ජනවාරි මස 1 වැනි දිනට වයස අවුරුදු 19 ට නො අඩු හෝ 25 ට නො වැඩි හෝ අය විය යුතු ය.

* රාජ්‍ය සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහා ම "ලාංකික" යන පදයෙන් අදහස් කෙරෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලබා ඇති තැනැත්තන් ය.

5. **සුදුසුකම්.—වියදම් අඩු කිරීමේ පියවරක් වශයෙන් එක්සත් රාජ්‍යයට අයත් ලංකාවේ සේවා කණ්ඩායම් වලින් අස් කරන ලද සිවිල් අංශයේ සේවකයන්ට ද, යුද්ධ හමුදාවේ සේවාමුක්ත භටයන්ට ද දෙන විශේෂ සහන :—**

(i) කඳවුරු ආපසු ගැනීමට ආණ්ඩුව කළ තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1956 ජූලි 6 වැනි දින හෝ, ඉන් පසුව හෝ අස් කරනු ලැබූ, එක්සත් රාජධානිය සතු ලංකාවේ සේවා කණ්ඩායම් වලට අයත් සිවිල් අංශයේ ලාංකික සේවකයෝද, නාරාහේන්පිට රාජකීය නාවික ගුවන් විදුලි ස්ථානය (ඇන්ඩර්සන් ස්ථානය) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පෙරිය කරච්චියට ගෙන යාමට ආණ්ඩුව විසින් කරන ලද තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් 1954 සැප්තැම්බර් 27 වැනි දිනට පසුව එම ගුවන් විදුලි ස්ථානයෙන් අස් කරනු ලැබූ සේවකයෝද, අනික් සියලුම සුදුසුකම් ඇතිව සිටිත් නම්, පහත සඳහන් සහනය ලැබීමට සුදුස්සෝ වන්නාහ :—

4 (iv) වන ඡේදයේ නියම කර ඇති වයස් සීමාව සඳහා වයස ගණන් බැලීමේදී ඔවුන් එක්සත් රාජධානියේ සේවා කණ්ඩායම් යටතේ අඛණ්ඩවද, සතුටුදායක ලෙසට ද සේවය කොට ඇත් නම් එම සේවා කාලය වයසින් අඩු කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ.

(ii) යුද්ධ හමුදාවේ සේවාමුක්ත භටයෝ පහත සඳහන් සහනය ලැබීමට සුදුස්සෝ වන්නාහ :—

යුද්ධ හමුදාවේ සේවාමුක්ත භටයන්ට එනම් ස්ථිර හමුදාවේ සේවය කිරීමෙන් පසුව උප සේවයට මාරු කරනු ලැබූ යුද්ධ හමුදාවේ අයට හෝ අවශ්‍ය සහගත ලෙස සේවයෙන් නෙරපන ලද්දා වූ ද, සේවයෙන් නිදහස් කරන ලද්දා වූ ද, එසේ ම යම් අන්දමක විෂමාචාරයක් නිසා සේවයෙන් අස්වන්ට සිදු වූ ද අය හැර යුද්ධ හමුදාවෙන් අස්ව සිටින අනෙක් නිලධාරීන්ට හා භටයන්ට 4 (iv) වැනි ඡේදයේ නියම කරන ලද වයස් සීමාව සඳහා වයස ගණන් බැලීමේ දී, තමන් ස්ථිර හමුදාවේ සිටි සේවා කාලය, තම වයසින් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ.

6. **වියදම් අඩු කිරීමේ පියවරක් වශයෙන් සේවයෙන් අස් කරන ලද, ආණ්ඩුවේ සේවකයන්ට දෙන විශේෂ සහනය.**—ස්ථිර හෝ තාවකාලික හෝ තත්ත්වයෙන් ආණ්ඩුව යටතේ සේවය කර ඇත්තා වූ ද වැඩ හෝ හැසිරීම අසතුටුදායක වීම හැර, අන් කිසි හේතුවක් නිසා සේවය නවත්වනු ලැබුවා වූ ද අය පහත දැක්වෙන සහනය ලැබීමට සුදුස්සෝ වෙති :—

සේවයෙන් පහ කරනු ලැබීම නිසා හෝ වැඩ අසතුටුදායක වීම නිසා හෝ ඉල්ලා අස්වීම නිසා හෝ අවසන් කරන ලද සේවා කාල හැර, ආණ්ඩුව යටතේ සේවය කළ සෙසු කාලසීමාවන් 4 (iv) වන ඡේදයේ නියම කරන ලද වයස් සීමාව සඳහා වයස ගණන් බැලීමේ දී තම වයසින් අඩු කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ.

7. **සුදුසුකම් : ආණ්ඩුවේ සේවකයන්ට දෙන විශේෂ සහන :—**

(i) **ස්ථිර සේවකයෝ**—1969 දෙසැම්බර් 4 වැනි දිනට ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ අයට පහත සඳහන් සුදුසුකම් තිබේ නම්, මේ විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(අ) මෙහි 4 (iii) වන ඡේදයෙහි දක්වන ලද අධ්‍යාපනික සුදුසුකම් තිබීම ;

(ආ) 1970 ජනවාරි 1 දිනට වයස අවුරුදු 45 ට අඩුවීම ; හා

(ඇ) ඔවුන්ගේ සේවය සතුටුදායක බව දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් සහතික කර තිබීම සහ භාෂා පරිවර්තක සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඔවුන් නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානයන් සූදානම්ව සිටීම.

**සංලක්ෂ්‍යය.**—1956 සැප්තැම්බර් මස 24 වන දිනට කලින් පත් වූද, මෙම විභාගයෙන් සමර්ථ වන්නාවූ ද, පූර්වෝක්ත ගණයට අයත් නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාල කාර්යයන් සම්බන්ධයෙන් "ආදී ප්‍රවේශකයන්" සංඛ්‍යාවෙහි ලා සලකනු ලැබේ.

(ii) **තාවකාලික සේවකයෝ.**—ආණ්ඩුවේ සේවයෙහි තාවකාලික තනතුරු දරණ අයට පහත සඳහන් සුදුසුකම් තිබේ නම්, මේ විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(අ) මෙහි 4 (iii) වන ඡේදයේ අධ්‍යාපන සුදුසුකම් තිබීම ;

(ආ) 1970 ජනවාරි 1 වන දිනට වයස අවුරුදු 45 ට අඩු වීම ; හා

(ඇ) 1969 දෙසැම්බර් 4 වන දිනට ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් එක් අවුරුද්දක්වත් අවිච්ඡින්න සේවයක් කර තිබීම සහ ඔවුන්ගේ සේවය සතුටුදායක බව දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් සහතික කර තිබීම.

**සංලක්ෂ්‍යය.**—63. 12. 4 දින අංකය 629 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3 වැනි ඡේදයෙහි සඳහන් වර්ගයන්ට ඇතුලත් වන ස්ථිර, තාවකාලික හෝ අනියම් සේවකයන්, යුද හමුදාවන්හි සහ ලංකා පොලිස් සේවයේ නියුක්ත වූවන්, පළාත් පාලන සේවකයන්, ශිෂ්‍ය ගුරුවරුන් සහ මණ්ඩල, සංයුක්ත මණ්ඩල සහ සමාන ස්වතන්ත්‍ර ආයතනවල සේවකයන් ඉහත 7 (i) සහ 7 (ii) දරණ ඡේදවල දැක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සන් නොවනු ඇත.

8. **ඉල්ලුම් පත්‍ර.**—(i) මේ නිවේදනය සමග පළකර ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයේ සඳහන් අන්දමට ඉල්ලුම් පත් සකස් කර ගත යුතුය.

(ii) ඉල්ලුම් පත්‍ර 1969 දෙසැම්බර් මස 29 වන දිනට හෝ ඊට පළමු හෝ කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්ට ලැබෙන පරිද්දෙන් රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය.

එදින පසු වී ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව ලියා තිබිය යුතුය.

(iii) අයදුම් පත්‍රයේ රුපියල් 25 ක් වටිනා මුද්දර අලවා අපේක්ෂකයාගේ අත්සන සහ දිනය යෙදීමෙන් විධිප්‍රකාරව අවලංගු කර තිබිය යුතුය.

(iv) දැනට ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්ත අපේක්ෂකයන් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මගින් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. 6 වන ඡේදය යටතේ සුදුසුකම් ඉදිරිපත් කරන අපේක්ෂකයන් තම තමන් අන්තිමට සේවය කළ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මගින් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. යම්කිසි අපේක්ෂකයෙක් එසේ කිරීමට අපොහොසත් වේ නම් ඔහු නුසුදුසු බවට පත් වූවකු ලෙස සලකනු ලැබේ. 1969 දෙසැම්බර් මස 29 වන දිනට හෝ ඊට කලින් හෝ විභාග කොමසාරිස්ට ලැබෙන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍ර යවන ලෙස ඉල්ලා කල් ඇතිව දෙපාර්තමේන්තු ප්‍රධානයන්ට එම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන මෙන් අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

(v) අයදුම් පත්‍රය පිළියෙල කළ යුත්තේ ෆුල්ස්කැප් ප්‍රමාණයේ කඩදාසිවල පමණකි. එහි 1 සිට 8 දක්වා කොටු මුල් පිටුවෙහි විය යුතුය. අත්සන සහතික කිරීම සහ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අනික් පැත්තේ විය යුතුය.

(vi) අයදුම්කරුගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සමාදාන විනිශ්චයකාරයකු,

දිවුරුම් කොමසාරිස්වරයෙකු, පෙරකදෝරුවකු, මහජන නොතාරිස් කෙනකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක ප්‍රධානයකු, නාවුක, ගගන, යුද්ධ හමුදාවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 4,800 හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් බාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කෙනෙකු විසිනි.

9. **විභාගයට ඇතුලත් වීම.**—(i) ඉල්ලුම් පත්‍ර එවා ඇති සියලුම අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් විසින් ඇතුළුවීමේ පත්‍රිකා නිකුත් කරනු ඇත. විභාගයට ඉදිරිපත් වන අපේක්ෂකයන් විසින් තම ඇතුළුවීමේ පත්‍රිකා විභාගය පරිපාලනය කිරීම සඳහා පත් කර ඇති නිලධාරියාට ඉදිරිපත් කළ යුතුය. එම පත්‍රිකාව ඉදිරිපත් නො කරන අපේක්ෂකයකු වෙතොත් ඔහු විභාගයට බාර ගනු නොලැබේ.

අපේක්ෂකයන් විභාගය සඳහා පෙනී සිටිය යුත්තේ තමන්ට නියමිත විභාග ශාලාවේය. විභාගය සඳහා තමාට නියමිත ශාලාවේ හැර අන් ශාලාවක පෙනී සිටින අපේක්ෂකයෙකු වෙතොත් ඔහු විභාගයට භාර ගනු නො ලැබේ.

ඇතුළුවීමේ පත්‍රිකාව සමග කාල සටහන් පිටපතක් ද එවනු ලැබේ. විභාගයට ඉදිරිපත් වන හැම අපේක්ෂකයෙකුම විභාග දින යෙහි තම ඇතුළුවීමෙහි පත්‍රිකාව පරිපාලක හට බාර දිය යුතුය.

අපේක්ෂකයන් සඳහා වූ නියෝග මෙම නිවේදනයේ අග වෙනම මුද්‍රණය කර ඇත. අපේක්ෂකයෝ මේ නියෝග වලින් බැඳෙනු ලැබෙත්.

විභාග දිනයට යටත් පිරිසෙයින් දින 7 කට වත් කලින් තම ඇතුලුවීමේ පත්‍රිකාව අපේක්ෂකයෙකුට නො ලැබුනහොත්, එය නො ලැබුන බව ද, පහත දැක්වෙන තොරතුරු ද සඳහන් කොට, කොළඹ 2, තැ. පෙ. 1503, කොම්පඤ්ඤ වීදියේ මැලේ වීදියෙහි විභාග කොමසාරිස්ට (විදුලි පණිවුඩ ලිපිනය "විභාග", කොළඹ) අප්‍රමාදව දැනුම් දිය යුතුය :—

(1) විභාගයේ නම ;
(2) සම්පූර්ණ නම ;
(3) සම්පූර්ණ තැපැල් ලිපිනය ; සහ
(4) තැපැල් කන්තෝරුව, රෙජිස්ටර කිරීමේ අංකය හා තැපැල් කළ දිනය.

(ii) **විභාගයට ඇතුලත් කර ගැනීම සුදුසුකම් පිළිගැනීමක් නොවේ.** එසේ වුව ද, විභාග කොමසාරිස්ට සිය අභිමතය පරිදි අපේක්ෂක යෙකු තාවකාලිකව විභාගයට ඇතුළු කරගන්ට පුළුවන. එබඳු අපේක්ෂකත්ව පසුව ස්ථිර කරනු හෝ අවලංගු කරනු ඇත.

10. **හඳුනා ගැනීමේ පත්‍ර.**—තමන් විභාගයට ගන්නා එක් එක් විෂයයක් සම්බන්ධයෙන් පරිපාලකයන් සෑහීමට පත් වන පරිද්දෙන් අපේක්ෂකයන් විසින් විභාග ශාලාවේ දී තම අනන්‍ය තාව ඔප්පු කළ යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමක් වුව ද පිළිගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හඳුනා ගැනීමේ පත්‍රය ;
(ආ) මෙම විභාග දිනයට අවුරුදු තුනකට නොවැඩි කාලයකට මෙපිට දී නිකුත් කරන ලද වලංගු ගමන් බලපත්‍රයක් ;
(ඇ) මෙම විභාග දිනයට අවුරුදු තුනකට නො වැඩි කාලයකට මෙ පිට දී අයිතිකරුගේ ඡායාරූපයක් සහිත ව ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක බලය පිට නිකුත් කරන ලද ඕනෑම සහතික පත්‍රයක්, බලපත්‍රයක් හෝ අන් කිසි ලේඛනයක්.

ඇතුලත් වීමේ පත්‍රිකාවට අතිරේකව ඉහත කී ලේඛනවලින් එකක් සැම අපේක්ෂකයෙකුට ම තිබිය යුතු යි. එ සේ නොමැති කිසිම අපේක්ෂකයෙක් විභාගයට ඇතුළු කරගනු නො ලැබේ.

11. **සුදුසුකම් පිළිබඳ ලියවිලි.**—(i) **ඉල්ලුම් පත්‍රය සමග කිසිම ලියවිල්ලක් ඉදිරිපත් නොකළ යුතු ය.** එහෙත් අවශ්‍ය විස්තර සියල්ලක්ම නියමිත පරිදි පෝරමයේ ම ඇතුලත් කළ යුතුයි. මේ හැම අතින්ම සම්පූර්ණ නොවූ ඉල්ලුම් පත්‍රයක් වෙතොත් එය එහි ඇති සුදුසුකම් අනු ව සලකා බලන අතර ප්‍රතික්ෂේප කරන්ට ද ඉඩ ලැබේ.

(ii) සුදුසුකම් ලත් අපේක්ෂකයන් විසින් තම සුදුසුකම් ස්ථුට කරනු පිණිස ලේඛනගත සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. **වාචික පරීක්ෂණයක්** වෙතොත් එහි දී එබඳු අපේක්ෂකයන් විසින් මෙම ලේඛන ඉදිරිපත් කළ යුතු ය. නැතහොත් විභාග කොමසාරිස් විසින් ඉල්ලා එවූ කල්හි අප්‍රමාද ව ලියාපදිංචි කළ තැපෑලෙන් ඒවා එවිය යුතුය.

(iii) පහත සඳහන් ලේඛන අවශ්‍ය වන්නේ ය :—

(අ) යහපත් චරිතයක් ඇත්තෙකු බවට වගකිව යුතු තැනැත්තෙකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා ආණ්ඩුවේ හෝ උපකෘත හෝ පාඨශාලාවක අධ්‍යාපනය ලබමින් හෝ ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලවකින් ළඟ දී අස්වී හෝ සිටි නම්, චරිත සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයාගෙනි ; නො එසේ නම් සමාදාන විනිශ්චයකාර, අද්වකාත්, පෙරකදෝරු හෝ නොතාරිස්, ප්‍රාදේශීය ආදායම් නිලධාරි යන මේ අයකුගෙනි. නැතහොත් රු. 4,800 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර සේවයේ නියුක්ත ආණ්ඩුවේ නිලධාරියෙකුගෙන් ය. සාමාන්‍යයෙන් කියතොත්, පහසුවෙන් තොරතුරු විමසිය හැකි කිසියම් ප්‍රකට පුද්ගලයෙකුගෙන් මෙය ලබාගත හැකි ය. එම තැනැත්තාගේ නම, තනතුර හා ලිපිනය සහතිකයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

ආණ්ඩුවේ ස්ථිර සේවයේ නියුක්ත අපේක්ෂකයන් යහපත් චරිතයක් ඇති බවට සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කළ සටහනේ සහතික කළ පිටපතක් හෝ (උප්පැන්නය ලියාපදිංචි නො කළ අපේක්ෂකයන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

**සංලක්ෂ්‍යය :**

(i) පාඨශාලා හෝ අධ්‍යාපන කටයුතු හෝ සඳහා නිකුත් කරනු ලබන විශේෂ උප්පැන්න සහතික පත්‍රය හෝ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ සහතික කළ **උධෘතයක්** හෝ පිළිගනු නො ලැබේ.

(ii) දිවුරුම් පෙත්සම් හෝ බෞතීස්ම සහතික පත්‍ර හෝ උප්පැන්න සහතික පත්‍ර වෙනුවට භාරගනු නො ලැබේ.

(iii) උප්පැන්න සහතික ප්ත්‍රයේ දැක්වෙන නම/නම් අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිත කරන්නාවූ ද, විභාගයට ඉදිරිපත් වීම සඳහා පාවිච්චි කරන්නාවූ ද නමට/නම්වලට වෙනස් වෙතොත් 1951 අංක 17 දරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 27 වන හෝ 28 වන වගන්ති දෙකෙන් කාරණයට ගැලපෙන වගන්තියට අනුව උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ නම වෙනස් කරවා ගැනීමට වහාම ක්‍රියා කළ යුතු ය.

1953 අංක 15 දරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ, දෙවන වගන්තියෙන්, සංශෝධනය කරන ලද 1951 අංක 17 දරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 24 (6) වන වගන්තිය යටතේ, උපන් දිනයට අවුරුද්දකට වඩා පසු වී ලේඛනගත කරන ලද උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනක සහතික කළ පිටපතක් පත්කිරීම් පිළිබඳ කටයුතු සඳහා භාර ගනු ලබන්නේ උපන් දිනය තහවුරු කර ගැනීමට අදාළ වූ සාක්ෂ්‍ය ගැන සලකා බැලීමෙන් පමණකි.

ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන්නා වූ ද, 1957 අගෝස්තු මස 18 වන දිනය හා 394 වන අංකය දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව තම නම් වෙනස් කර ඇත්තාවූ ද, අපේක්ෂකයන් විසින් උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහන සංශෝධනය කරවා ගැනීම අනවශ්‍ය ය.

(ඇ) ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ (අවස්ථාවට ගැලපෙන පරිදි) පාරම්පරික පුරවැසි භාවය සඳහා කළ ඉල්ලීම පිළිගත් බව දක්වන රාජකාරී ලියුමේ මුල් පිටපත.

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික.

(ඉ) එක්සත් රාජධානියට අයත් ලංකාවේ සේවා කණ්ඩායම්වල සිවිල් අංශයේ සේවය කළ බැව් දක්වන සහතිකයේ හෝ යුද්ධ හමුදාවේ කරන ලද සේවය පිළිබඳ සහතිකයේ හෝ මුල් පිටපත (මෙය පස්වන ඡේදයේ සඳහන් අපේක්ෂකයන් සම්බන්ධයෙනි.)

(ඊ) ආණ්ඩුව යටතේ කරන ලද සේවය පිළිබඳ සහතිකවල මුල් පිටපත් (6 වන ඡේදයේ සඳහන් අපේක්ෂකයන් සම්බන්ධයෙනි.)

(උ) හඳුනාගැනීමේ පත්‍රය (**වාචක පරීක්ෂණයක්** වෙතොත් එහි දී පමණක් ඉදිරිපත් කළ යුතු ය.)

(iv) ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවෙහිම වුවමනා සියළු ලියවිලි සූදානම් කොට තබා ගන්නා මෙන් අපේක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. **වාචක පරීක්ෂණයක්** පැවැත්වුවහොත් එහිදී අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන, නැතහොත් විභාග කොමසාරිස් ඉල්ලා එවූ විට ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අපේක්ෂකයන්ගේ ඉල්ලුම් පත්‍ර අවලංගු කරනු ලැබේ.

12. **අසත්‍ය විස්තර සැපයීම ගැන දඬුවම්.**—මෙම විභාගයේ රෙගුලාසි අනුව, කිසියම් අපේක්ෂකයෙකු නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ විභාග කාලය තුළ දී හෝ ඉන් පසුව කුමන අවස්ථාවකදී හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

අපේක්ෂකයකු විසින් සපයන ලද විස්තරවලින් යම්කිසිවක් ඔහුගේ දැනීම පරිදි අසත්‍ය බව පෙනී ගියහොත්, නැතහොත් ඔහු කිසියම් වැදගත් කරුණක් ඕනෑකමින් ම යටපත් කර තිබුණහොත්, එසේ ද නැතහොත් ඔහු මෙම විභාගයට ඉදිරිපත් වීමට නුසුදුස්සකු බව ඔහුගේ සේවා කාලය ඇතුළත කුමන අවස්ථාවක දී හෝ ප්‍රත්‍යක්ෂ වුවහොත් ඔහු වහාම සේවයෙන් පහකිරීමට ඉඩ තිබේ.

13. **ආපසු ගෙවීම.**—කිසිම අවස්ථාවක දී ආපසු ගෙවීමක් නො කරනු ලැබේ.

මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තු අන් කිසි විභාගයක් සඳහා මාරු කිරීමට නුපුළුවන.

14. **ආණ්ඩුවේ නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—විභාග කොමසාරිස් අනුමත කළ ඉල්ලුම් පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු—රාජකාරි නිවාඩු නොවේ—දෙන ලෙස ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ට නියම කරනු ලැබේ.

15. **විභාග පරිපාටිය.**—විභාගය කොටස් දෙකකින් යුක්ත ය. (1) වන කොටස **ලිඛිත පරීක්ෂණයකි.** (2) වන කොටස **වාචක පරීක්ෂණයකි.**

විභාග විෂයයන් හා එක් එක් විෂයයකට නියමිත ලකුණුද පහත සඳහන් වේ :—

ලිඛිත පරීක්ෂණයේ දී නරක අත් අකුරු හා අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් සෑම උත්තර පත්‍රයකින් ම ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි අත් අකුරු ඇති අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සැලකීමට ඉඩ තිබේ.

**1 වන කොටස (ලිඛිත)**

විභාගයේ මේ කොටස, එකක් පැය තුන බැගින් වූ ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

**1 වන පත්‍රය.**—සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම.

| | | | **ලකුණු** |
|---|---|---|---|
| (i) සාහිත්‍ය පාඨයක්, | | | |
| (ii) සාමාන්‍ය පාඨයක්, | | | |
| (iii) (අ) කාර්යාලීය ලිපියකින් හෝ වාර්තාවකින් | | | |
| සහ | | | |
| (ආ) ප්‍රවෘත්ති පත්‍ර ලිපියකින් හෝ වාර්තාවකින් | | | |
| උපුටාගත් කොටස් | ... | ... | 100 |

**2 වන පත්‍රය.**—ඉංග්‍රීසියෙන් සිංහලට/දෙමළට පරිවර්තනය කිරීම.

| | | | **ලකුණු** |
|---|---|---|---|
| (i) සාහිත්‍ය පාඨයක්, | | | |
| (ii) සාමාන්‍ය පාඨයක්, | | | |
| (iii) (අ) කාර්යාලීය ලිපියකින් හෝ වාර්තාවකින් | | | |
| සහ | | | |
| (ආ) ප්‍රවෘත්ති පත්‍ර ලිපියකින් හෝ වාර්තාවකින් | | | |
| උපුටාගත් කොටස් | ... | ... | 100 |
| **2 වන කොටස (වාචක පරීක්ෂණය)** | ... | ... | 50 |

පළමු කොට ලිඛිත පරීක්ෂණය පවත්වා එහි ප්‍රතිඵල අනුව තරඟකාරීව තෝරා ගනු ලබන අපේක්ෂකයෝ කොළඹ දී පැවැත්වෙන **වාචක පරීක්ෂණය** සඳහා කැඳවනු ලැබෙති. **වාචක පරීක්ෂණය** පැවැත්වෙන දිනය ඔවුන්ට දන්වනු ලැබේ. විභාග කොමසාරිස් සමග සාකච්ඡා කොට භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් විසින් වාචක පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අපේක්ෂක සංඛ්‍යාව තීරණය කෙරෙනු ඇත. එතකුදුවුවත්, වාචක පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව පුරප්පාඩු ගණනට වඩා අඩු වුවහොත් **වාචක පරීක්ෂණය** අත්හැර දැමීමට වුව ද පුළුවන.

16. **ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම සහ පත්වීම් දීම.**—සමත් වන අපේක්ෂකයන්ගේ නම් **ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි** ප්‍රසිද්ධ කෙරෙනු ඇත. යෝග්‍ය පුරප්පාඩු ඇතිවන අන්දමට ඔවුන්ට පත්වීම් දෙනු ඇත.

17. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරා ගත් අපේක්ෂකයන් ලංකාවේ කවර පළාතක හෝ සේවය කිරීමට ශාරීරික වශයෙන් යෝග්‍ය බව ඔප්පු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

18. මෙම රෙගුලාසි මගින් විධිවිධාන සැපයී නැති කවර කරුණක් වුව ද භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්ගේ අභිමතය පරිදි විසඳෙනු ඇත.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 දෙසැම්බර් මස 4 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

**ලංකා විභාග දෙපාර්තමේන්තුව**

විභාග අංකය [ ]

**භාෂා පරිවර්තක සේවයට බඳවා ගැනීමේ විභාගය, 1970 ජනවාරි**

ස්ත්‍රී පුරුෂ භාවය [ ]

1. මුලකුරු සමග අගට යෙදෙන නම :————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :—
3. සම්පූර්ණ ලිපිනය :————.
(ආණ්ඩුවේ සේවයේ සිටින අපේක්ෂකයන් කාර්යාලීය ලිපිනය සඳහන් කළ යුතුය)
4. ඔබ තරඟ කරන්නේ සිංහල භාෂා පරිවර්තක පුරප්පාඩු සඳහාද, දෙමළ භාෂා පරිවර්තක රපුප්පාඩු සඳහා ද යන්න :————.
5. **සුදුසුකම් :**
   - (අ) උපන් දිනය :————.
   - (ආ) අධ්‍යාපනික සුදුසුකම් :————.
   - (ඇ) ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචිවීමෙන් ද යන වග :————.
   - (ඈ) විභාගයට පෙනී සිටීමට ඔබේ ඇති සුදුසුකම් පිළිබඳ අතිකුත් විස්තර :————.
6. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් පහත සඳහන් විස්තර සැපයිය යුතු ය :—
   - (i) ඔබ දැනට දරන තනතුර :————.
   - (ii) එම තනතුරට පත් වූ දිනය :————.
   - (iii) එම තනතුරේ ඔබ ස්ථිර කර තිබේ ද ? :————.
   - (iv) එම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ද ? නැතහොත් තාවකාලික තනතුරක් ද ? :————.
   - (v) ඔබ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සඳහා ආදි ප්‍රවේශකයෙක් ද නැතහොත් නව ප්‍රවේශකයෙක් ද ? :————.
   - (vi) ඔබ විවාහකද ? අවිවාහකද ? :————.
   - (vii) විවාහක නම් පාසල් යන ළමයින් ගණන :————.
7. (i) ඉහතින් මා දී ඇති තොරතුරු මගේ දැනීම පරිදි හා විශ්වාසය පරිදි සත්‍ය බවත් මෙයට අලවා ඇත්තේ කලින් පාවිච්චි නොකරන ලද්දාවූ වලංගු මුද්දර බවත් මෙයින් දිවුරා සහතික කරමි.
   (ii) මේ විභාගය හා සම්බන්ධ නීති රීතිවලට යටත් වීමට මම එකඟ වෙමි.
8. මුද්දර කොටුව : **(සැලකිය යුතුයි).**—විභාගාපේක්ෂකයා රුපියල් විසිපහක් වටිනා මුද්දර මෙම කොටුවෙහි අලවා, ඒ උඩ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුයි. මුද්දර එක පිට එක ඇලවිය යුතු නොවේ.

[ රු. 25 ]

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

* ....................................සේවයේ නියුක්ත/පදිංචි ....................................නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්, 1969....................මස....................වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :————.
නම, පදවිය හා තරාතිරම :————.
ලිපිනය :————.

*දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාල දෙපාර්තමේන්තු ප්‍රධානයා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියකු විසිනි.

**දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ සහතිකය**

මෙම අයදුම්කරු මෙහි 5 වැනි සහ 6 වැනි ඡේදවල දී ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහුගේ/ඇගේ හැසිරීම සහ වැඩ සතුටුදායක/වූ බවත්, අදාල ගැසට් නිවේදනයෙහි ප්‍රකාර ඔහු/ඇය මේ විභාගයට පෙනී සිටීමේ සුදුසුකම් සපුරා ඇති බවත් මෙයින් සහතික කරමි.

තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැන් සේවයෙන් මුදා හැරිය හැකිය.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන.
තනතුර :————.

දිනය :————.

ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

**විභාගාපේක්ෂකයන් සඳහා නීති**

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාව විභාගශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාග ශාලාවේදී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්නද තෝරා ගතයුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතු ය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නො දිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතු ය.

කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී යැ.

12–422—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාර අංකය : 1/23/33/2(ජී)

## යතුරු ලේඛක සේවයේ ඉහළ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය—1969 දෙසැම්බර්

අංක 14,877 හා 1969. 10. 24 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1969. 10. 11 දින දරණ නිවේදනය අනුව, 1969 දෙසැම්බර් මස 7 වැනි දින කොළඹදී පැවැත්වීමට නියමිතව තිබූ ඉහත සඳහන් විභාගය 1970 පෙබරවාරි මස 27 වැනි දිනට කල් දැමූ බව අපේක්ෂකයින් ගේ දැනගැනීම සඳහා නිවේදනය කරනු ලැබේ.

2. මෙම විභාගය, මහනුවර, ගාල්ල, කුරුණෑගල හා අනුරාධපුරය යන අතිරේක මධ්‍යස්ථාන වලදීත් පැවැත්වීමට තීරණය කර ඇත. අපේක්ෂකයින් වෙනුවෙන් යොදා ඇති මධ්‍යස්ථාන විභාග කොමසාරිස් විසින් ඔවුන් වෙත දැනුම් දෙනු ලැබේ.

3. අළුතින් අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. මෙම විභාගය පිළිබඳ අනිකුත් කොන්දේසි නොවෙනස්ව පවතිනවා ඇත.

ඊ. ඩී. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

12–332—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ශිෂ්‍යයින්ගේ අභ්‍යාස පන්තියට වැද්දා ගැනීම පිණිස අපේක්ෂකයින් තේරීම

මහජන සෞඛ්‍ය ශිෂ්‍යයින්ගේ අභ්‍යාස පන්තියට වැද්දාගනු පිණිස අපේක්ෂකයින් තේරීම සඳහා, 1970 මාර්තු 21 වන දා මතු සඳහන් මධ්‍යස්ථාන වල පැවැත්වෙන තරඟ විභාගයකට ලක්වැසි පිරිමින්ගෙන් අයැදුම් පත් කැඳවනු ලැබේ.

2. **තිබිය යුතු සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකු විසින් ම—

(අ) 1970 ජනවාරි 12 වනදාට තම වයස අවුරුදු 19 ට නොඅඩු 24 ට නොවැඩි බවටත් ;

දැනට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින ස්ථිර, තාවකාලික සේවකයින් වෙනුවෙන් ඉහළ වයස් සීමාව අවුරුදු 35 ට නොවැඩි වේ.

(ආ) තමා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික විභාගයෙන්, හෝ, ඊට ඉහළ විභාගයකින් හෝ,

(i) සිංහල/දෙමළ භාෂාව

(ii) ගණිතය/අංක ගණිතය යන දෙ විෂයය

ඇතුළු විෂය 6ක් දෙවතාවකට නොවැඩි වාර ගණනක දී පියවමින් (සාමාන්‍ය) පෙළ පොදු අධ්‍යයන සහතික විභාගයෙන් හෝ සමත් වී සිටින බවටත්, පිළිගත හැකි සාක්කි ඉදිරිපත් කළ යුතු වේ

3. **ඇයැදුම් පත් එවන අන්දම :**

(අ) ඇයැදුම්පත් කොළ සපයනු නොලැබේ. මෙහි අගට ඈඳා තිබෙන ආදර්ශ ආකෘති පත්‍රයේ අනුසාරයෙන් පිළියෙල කර ගත යුතු ඇයැදුම් පත්, ඇයැදුම්කරු වෙසෙන පෙදෙසේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙත 1970 ජනවාරි 12 වන දා හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස, කවරයේ වම් පස උඩු කෙළවරේ ''මහජන සෞඛ්‍ය ශිෂ්‍යයන් තේරීමේ ඇයැදුම් පත්'' යනුවෙන් හනක් තබා, ඒ සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ලිපිනය ලියා, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අපේක්ෂකයින්ට දැන බලා ගැනීම පිණිස සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ ලැයිස්තුවක් මෙහි දක්වනු ලැබේ :—

| | මධ්‍යස්ථානය | | සෞඛ්‍ය සේවා අධිකාරි ලිපිනය | |
|---|---|---|---|---|
| 1. | අනුරාධපුරය | ... | අනුරාධපුර, සෞඛ්‍ය සේවා අධිකාරි | |
| 2. | මඩකලපුව | ... | මඩකළපුවේ | ,, |
| 3. | බදුල්ල | ... | බදුල්ලේ | ,, |
| 4. | කොළඹ | ... | කොළඹ | ,, |
| 5. | ගාල්ල | ... | ගාල්ලේ | ,, |
| 6. | යාපනය | ... | යාපනයේ | ,, |
| 7. | මහනුවර | ... | මහනුවර | ,, |
| 8. | කුරුණෑගල | ... | කුරුණෑගල | ,, |
| 9. | කෑගල්ල | ... | කෑගල්ලේ | ,, |
| 10. | කළුතර | ... | කළුතර | ,, |
| 11. | මාතර | ... | මාතර | ,, |
| 12. | මාතලේ | ... | මාතලේ | ,, |
| 13. | පුත්තලම | ... | පුත්තලමේ | ,, |
| 14. | රත්නපුරය | ... | රත්නපුර | ,, |
| 15. | වවුනියාව | ... | වවුනියාවේ | ,, |

1970 ජනවාරි 12 වන දාට පසු ලැබෙනඇයැදුම් පත් පිටු දකිනු ඇත. ඇයැදුම් පත් කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලිපිනය ලියා එවීම නොකළ යුතු ය.

(ආ) ඇයැදුම්පත් මෙහි අත්සන් කරන නිලධාරියාටවත්, මේ කාර්යාලයයේ වෙන යම් නිලධාරියෙකුටවත් නමින් අමතා එවීම ද, යම් නිලධාරියෙකුට අතේ ගෙනාවිත් බාර දීම ද නොකටයුතු ය.

(ඉ) රු. 25 ක් වටිනා මුද්දර ඇයැදුම් පතේ අලවා ඒ මත අයැදුම්කරුගේ අස්සන තැබීමෙන් ඒ අවලංගු කළ යුතු ය. කිසිදු හේතුවක් නිසාවත් මේ මුද්දර ගාස්තුව ආපසු ගෙවීමෙක් නොවේ.

(ඊ) දනට රැකියාවක යෙදී සිටින අයෙකු ඇයැදුම් පතක් එවන විට, ඒ ඇයැදුම්කරු පුහුණුවට තෝරා ගනු ලැබුවොත් පුහුණුව පටන් ගන්නා දවසේ සිට පන්තියට බැඳීමට ඔහුට ඉඩ ලැබෙනු පිණිස කල් වේලා තිබිය දී ඔහු ඒ රැකියාවෙන් මුදා හරින බවට සේවා යෝජකයාගෙන් (ස්වාමියාගෙන්) ලබා ගත් ලිපියක් ද ඇයැදුම් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

4. **විභාග පටිපාටිය.**—මේ විභාගය කොටස් දෙකකින් පවත්වනු ඇත. පළමුවෙන් ලිවීමේ විභාගය පවත්වා එහි ප්‍රතිඵල අනුසාරයෙන්, සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට අපේක්ෂකයින් තෝරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පැවැත්වේ. එහි දිනය අපේක්ෂකයින්ට දන්වා එවනු ඇත.

සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ අපේක්ෂකයා 1 වන ප්‍රශ්න පත්‍රය වූ භාෂාව සහ රචනයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.

මේ විභාගයේ විෂය මෙසේ වෙයි :—

| | | වේලාව | | ලකුණු |
|---|---|---|---|---|
| (1) භාෂාව සහ රචනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | ... | පෙ.ව. 9–10.30 | ... | 150 |
| (2) සාමාන්‍ය සහ ප්‍රාදේශීය දැනුම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | ... ... | පෙ.ව. 10.45–11.45 | ... | 100 |
| (3) සාමාන්‍ය බුද්ධිය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | ... | ප.ව. 1–1.45 | ... | 100 |
| (4) සම්මුඛ පරීක්ෂණය | ... | (දිනය පසුව දැනුම් දීමට) | ... | 100 |

අපේක්ෂකයින්ට අමුතුවෙන් කාල සටහන් නො සපයන හෙයින්, ඉහත දැක්වෙන කාල සටහන ඔවුන් විසින් ලියා තබා ගත යුතු යි.

**සැ.යු.**—අපේක්ෂකයින් මේ විභාගයට පෙනී සිටිය යුත්තේ 2 වන ඡේදයේ කියැවෙන සුදුසුකම් ලැබීමේ විභාගයෙන් එගොඩ වූ භාෂා මාධ්‍යයෙනි. (එනම් සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ වේ.)

එහෙත්—

(අ) සුදුසුකම් ලැබීමේ විභාගයෙන් දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ, සමත් වී සිටින අපේක්ෂකයෙකු විසින් ද, දෙමළ ඉංග්‍රීසි මාධ්‍යයකින් උගැනීම ලබා සිටින අපේක්ෂකයෙකු විසින් ද මේ විභාගයට සිංහල මාධ්‍යයෙන් පෙනී සිටීමට කැමැත්ත දැක්විය හැකි ය.

5. තමන් ඉදිරිපත් වන එක් එක් විෂයයෙහි දී විභාගශාලාධිපති සෑහීමට පත්වන තරමට තම අනන්‍යතාවය (තමා අනෙකකු නොවන බව) විභාග ශාලාවේ දී අපේක්ෂකයින් විසින් ඔප්පු කළ යුතු වේ. මේ කාරිය සඳහා මතු සඳහන් ලියකියවිලිවලින් කවරක් වුව ද පිළිගනු ලැබේ :—

(1) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන හැඳින්වීමේ පත් ;

(II) විභාග දිනට තුන් අවුරුද්දක් ඇතුළත නිකුත් කරන ලද වලංගු පාස් පෝට් බලපත්‍රයක් ;

(III) දරන්නාගේ ඡායාරූපයක් ඇතුළත් වූ, මේ විභාගයේ දිනට තුන් අවුරුද්දක් ඇතුළත දී රජයේ දෙපාර්තමේන්තුවක වරම පිට නිකුත් කරන ලද සහතිකයක්, ලයිසන් පතක් නැත්නම් වෙනත් ලියවිල්ලක්, තම ප්‍රවේශ පත්‍රයට අමතරව යට කී ලියවිලිවලින් එකක් ඉදිරිපත් කළ නොහැකි කිසිදු අපේක්ෂකයෙකු විභාගශාලාවට වැද්දා ගනු නො ලැබේ.

6. (අ) සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ ඒ සඳහා සංස්ථාපිත මණ්ඩලයක් විසිනි. පරීක්ෂණය පවත්වන දිනය සහ ඉසව්ව අපේක්ෂකයින්ට දන්වා යවනු ඇත. මේ පරීක්ෂණයට පෙනී සිටීමට එන අපේක්ෂකයින්ට දෙපාර්තමේන්තුවෙන් ගමන් වියදම් කිසිවක් නොගෙවනු ඇත. අපේක්ෂකයාගේ ඇයැදුම්පතේ කියැවෙන සියලු සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

(ආ) මේ විභාගය විභාග දෙපාර්තමේන්තුවේ පරිපාලනය යටතේ පැවැත්වේ. තම තමන්ට පැවරෙන විභාග මධ්‍යස්ථාන කවරේද යනු අපේක්ෂකයින්ට දන්වා යවනු ඇත.

(ඉ) අපේක්ෂකයින් පුහුණුවට වැද්දා ගැනීම පිණිස තෝරා ගනු ලබන්නේ තරඟ විභාගයේ සහ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත යෙදෙන කුසලතාවයේ අනුපිළිවෙලට ය. මෙසේ පුහුණුව සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ගේ නම් වැලක් පුවත් පත් නිවේදනයක් මගින් නිසි කලට පළ කරවනු ඇත.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීමට තමන් කායික සෞඛ්‍යයෙන් සුදුසු බවට වෛද්‍යපරීක්ෂණයකින් එගොඩ වන ලෙස ද තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට නියම කරනු ඇත.

8. **කලුකර අභ්‍යාස පංතියේ අභ්‍යාස පාඨ මාර්ගය**—

(අ) පුහුණුව සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් විසින්, රාජකීය සෞඛ්‍ය සමිතියේ විභාග මණ්ඩලයට රු. 200 ක ගාස්තුවක් ගෙවිය යුතු අතර, පන්තියට වැද්දා ගනු ලැබීමට කලින් තමන් වෙත මතු සඳහන් බඩු මුට්ටු සපයා ගත යුතු ද වේ :—

(i) පා පැදි බයිසිකලයක් ;

(ii) ඇඳීමේ උපකරණ කට්ටලයක් ;

(iii) මිනුම් පටිය සහ අඩි පටියක් ;

(iv) අපේක්ෂකයින් පන්තියට කැඳවන විට ඔවුන්ට දැනුම් දෙන වෙනත් දේවල්.

රු. 200 ක ගාස්තුව බැඳීමෙන් පසු යම් අසනීපයක් නිසා පන්තියට බැඳීමට යම් අපේක්ෂකයෙකුට නොහැකි වුවහොත්, ලියාපදිංචි නිපුණ වෛද්‍ය වරයෙකුගෙන් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් ගාස්තුවෙන් සියයට 80 ක් ආපසු ලද හැකි වේ.

(ආ) එබඳු හැම අපේක්ෂකයෙකුට ම—

(i) අභ්‍යාස පන්තියට තම පත්වීම බාර ගැනීමෙන් පසු මුළු පාඨ මාර්ගය නිමවීමට කලින් තමන්ගේ ම වුවමනාවෙන් ඉල්ලා අස් වුවොත්, පුහුණුව ලබන කාලයේ දී දීමනා හැටියට ලබා ගත් මුදල් දෙපාර්තමේන්තුවට ආපසු ගෙවන බවට (නියමිත ආකෘති පත්‍රයේ) ගිවිසුමකට අත්සන් කරන ලෙස ද,

(ii) තමා සපල ලෙස පුහුණුව නිමවා තුන් මසක් ඇතුළත ත්මාට පත්වීමක් දුන්නොත් එය බාර ගන්නා බවටත්, සේවයට බැඳී 36 මාසයක් ඇතුළත කිසිදු විටෙක සේවයෙන් අස්වන්නේ හෝ තමා මුදා හරින ලෙස ඉල්ලා සිටින්නේ හෝ නැති බවටත් (නියමිත ආකෘති පත්‍රයේ) රු. 1,000 ක ඇප ඔප්පුවකට අත්සන් කරන ලෙස ද නියම කරනු ඇත.

(ඉ) පුහුණුව මාස 12 ක පමණ කාල සීමාවකට පවතිනු ඇත.

(ඊ) දෙසුම් සඳහා එකක් ද, ප්‍රායෝගික වැඩට එකක් ද, පිටියේ වැඩ දැක්වීම්වලට එකක් ද යනුවෙන් පොත් පෙළ තුනක් සෑම අපේක්ෂකයෙකු විසින් ම පුහුණුවේ දී පවත්වා ගත යුතු අතර, වුවමනා විට පරීක්ෂා කිරීම සඳහා ඒවා ඉදිරිපත් කළ යුතු ද වේ.

(උ) පුහුණුව තුළ දී මාස්පතා පරීක්ෂණ පවත්වනු ලැබේ. මේ පරීක්ෂණ වල ප්‍රතිඵල අවසාන විභාගයේ දී සැලකිල්ලට ගනු ඇත.

(ඌ) **සෞඛ්‍ය මුළුවේ සිසු නිවස**—.පුහුණුව ලබන කාලයේ දී නිවෙසක නොමිලේ නවාතැන් පහසුව අපේක්ෂකයින්ට සලසා දෙනු ඇත. පුහුණුව සමයේ දී අවුරුද්දකට රු. 3,000 බැගින් දීමනාවක් අපේක්ෂකයින්ට ගෙවනු ලැබේ.

(එ) **පුහුඹු පිටු දැක්මට යටත් බව.**—සාමාන්‍ය පැමිණීම, උගැනීම, යෝග්‍යතාවය, හැසිරීමේ යෝග්‍යතාවය, යන කරුණු අතින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ සිත දිනා ගැනීමට අපොහොසත් වන යම් අපේක්ෂකයෙකු වෙතොත්, ඔහු පුහුණු සමය තුළ කවර විටෙක වුව ද පිටු දකිනු ලැබීමට යටත් වේ. එසේ පිටුදකිනු ලැබූ කිසිදු අපේක්ෂකයෙකුට ගාස්තුව ආපසු නොගෙවනු ලැබේ. ඉන් මතු අභ්‍යාස පන්තියකට තෝරනු ලැබීමට ද ඔහු නිස්සෙකු නොවනු ඇත. තමන්ගේ කැමැත්තෙන් පන්තියෙන් අස් වී යන කිසිදු අපේක්ෂකයෙකුට ගාස්තුව ආපසු නොගෙවන අතර, පුහුණුවේ යෙදී සිටිය දී දීමනා හැටියට තමන් ලබා ගත් මුදල් දෙපාර්තමේන්තුවට ආපසු ගෙවීමට නම් ඔහු යටත් වේ.

(ඒ) **සුදුසුකම් ලැබීමේ විභාගය.**—දස මාසයේ පුහුණුව කෙළවරේ දී ලංඩනයේ රාජකීය සෞඛ්‍ය සමිතියේ මෙරට විභාග මණ්ඩලය මගින් පවත්වනු ලබන ප්‍රමේය පිළිබඳ විභාගයක් යෙදේ. ඉන් පසු මාස දෙකක් පිටියේ වැඩ කිරීමට නියම වේ. ප්‍රායෝගික විභාගය සහ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ මේ කාලය අග දී ය.

(ඔ) **පත්වීම්.**—ලංඩනයේ රාජකීය සෞඛ්‍ය සමිතියේ මෙරට විභාග මණ්ඩලයේ අදහස් සපුරාලන අපේක්ෂකයෝ, ඇබෑර්තු ඇති වන හැටියට ඒ ඒ විට, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් හැටියට පත් කරනු ලැබීමට නිස්සෝ වෙත්.

9. **වැටුප් ක්‍රමය සහ සේවා කොන්දේසි.**—පත්වීම් සියල්ල දෙනු ලබන්නේ මහජන සෞඛ්‍ය පරීක්ෂක සේවයේ II වන පන්තියටය.

වැටුප් ක්‍රමය (ඒකාබද්ධ)

II වන පන්තිය—අවුරුද්දකට රු. 3,288—13 × 144—5,160 කි.

I වන පන්තිය—අවුරුද්දකට රු. 5,304—9 × 144 සහ 1 × 180—රු. 6,780 කි.

(කාර්යක්ෂමතා කඩඉම් පත්වීම් ලිපියේ දක්වනු ඇත.)

විශේෂ පන්තිය—අවුරුද්දකට රු. 6,960—6 × 180 සහ 1 × 240—රු. 8,280 කි.

එවකට බලපවත්නා දෙපාර්තමේන්තු රීති අනුව, පරිවර්තිත ගමන් වියදම් දීමනාවක්, කාර්යාල දීමනාවක්, නිල ඇඳුම්, හිස් වැසුම් සහ වැනි කබා දෙනු ලැබේ.

10. (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීති, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහයේ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග යන මේවාට සහ රජය මගින් කලින් කලට නිකුත් කැරෙන වෙනත් නීති නියෝගාදියට මේ පත්වීම යටත් වේ. සෑම නිලධාරියෙකුම තුන් අවුරුදු කාලයක් ආධුනික සේවයේ සිටිය යුතු වේ.

(II) මුළු විභාගය තනිකර සිංහල මාධ්‍යයෙන් නොගන්නා අපේක්ෂකයින් තෝරාගනු ලැබූ කල, ඔවුන් තම ආධුනික සමය තුළ දී සිංහල ප්‍රවීනතාවය ලබා ගත යුතු ය. ආධුනික සමය කෙළවරේ දී මේ අයගේ පත්වීම තහවුරු කරනු ලැබීමට ඔවුන් වෙත තිබිය යුතු සුදුසුකම් අතර නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වී සිටීම ද එකකි.

(III) තම ආධුනික සමය තුළ දී නියමිත සිංහල ප්‍රවීණතාවය ලබා ගැනීමට අසමත් වන අයගේ සේවය නැවැත්වීමට ඉඩ තිබේ. එහෙත්, රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා ඔවුන් පිරිසිදු සිතින් වෑයම් කොට ඇති බවට පත් කිරීමේ නිලධාරියා සෑහීමකට පත් වේ නම්, එසේ සේවය නැවැත්වීම කල් දැමිය හැකි වේ.

(IV) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැඟීම සඳහා ද, විශේෂයෙන් ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ද මෙතෙක් පනවා තිබෙන්නා වූ හෝ මින් මතුවට පනවනු ලබන්නා වූ හෝ කවර නීතියක් වුව ද පිළිපදින ලෙස රාජ්‍ය සේවයට පත් කර ගන්නා " නව ප්‍රවේශක නිලධාරීන්ට " නියම කරනු ඇත.

(V) නිලධාරීන් එන්නත් කිරීමේ සහ කොකුපණු ප්‍රතිකාරය පිළිබඳ ප්‍රවීණතා සහතිකය ලබා තිබේ නම්, සතුටුදායක ලෙස අවුරුද්දක් සේවය කිරීමෙන් පසු ඔවුන්ට පළමු වැටුප් වැඩියාව ගෙවනු ලැබේ. එන්නත් කිරීම සහ කොකු පණු ප්‍රතිකාරය පිළිබඳ ප්‍රවීණතා සහතිකය පත්වීමේ සිට පළමු අවුරුද්ද තුළ ලබා ගැනීමට අපොහොසත්වීම පළමු වැටුප් වැඩියාව නැවැත්වීමට තුඩු දෙන්නකි. ඉන් පසු ඊට අපොහොසත් වීමෙන් වැටුප් වැඩියාව විලම්බනය කිරීමට හේතු වේ. එසේ ද වුවත් මේ සහතික ලබා ගැනීමට අපොහොසත් වී ඇති නිලධාරීන්ගේ සේවය නැවැත්වීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂට අයිතියක් තිබේ.

11. ලංඩනයේ රාජකීය සෞඛ්‍ය සමිතියේ සහතිකය පිරිනමන්නේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සතුටුදායක ලෙස අවුරුද්දක සේවා කාලයක් නිම වන මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්ට පමණි.

12. යට විදහා දැක්වෙන නියමයන් කිසිවකට හෝ එකඟ නොවන ඇයැදුම් පත් පිටු දකිනු ඇත.

වී. පී. ඒ. පෙරේරා,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට
(පාලන) නියෝජ්‍ය අධ්‍යක්ෂ.

1969.12.3 වැනි දින,
කොළඹ දී ය.

### අයැදුම්පත් ආකෘතිය

#### මහජන සෞඛ්‍ය ශිෂ්‍යයන් තේරීමේ විභාගය

1. නම (මුලකුරු සමග) :————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
   (පැහැදිලි වටකුරු අකුරෙන්)
2. ලිපිනය :————.
3. උපන් දිනය සහ තැන :————.
4. ජාතිය :————.
5. විවාහක ද තනිකඩ ද යන වග :————.
6. රටවැසි භාවය :————.
   ලංකාවේ රටවැසියෙකු වූයේ (අ) පරම්පරාවෙන් ද
   නැත්නම් (ආ) ලියාපදිංචි වීමෙන් ද
7. (අ) ලබා ඇති උසස් ම ශාස්ත්‍රීය සුදුසුකම් :————.
   (ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික විභාගයේ දී නොහොත් (සාමාන්‍ය පෙළ) පොදු අධ්‍යයන සහතික විභාගයේ දී සමත් වූ, විෂය :————.

| පළමු වතාව—මාධ්‍යය | 2 වන වතාව—මාධ්‍යය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |

8. විභාගය ගැනීමට යන්නේ කවර භාෂා මාධ්‍යයෙන් ද ? :————.
   (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)
9. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම් එය :————.
10. ඔබ රැකියාවක් කරන්නේ නම්, ඔබ තෝරා ගනු ලැබූ විටෙක පන්තියට බැඳීමට කල් තිබිය දී රැකියාවෙන් මුද හැරීමට ඔබේ සේවා යෝජකයා කැමැත්තේ ද යන වග :————.
11. ඔබ මීට පෙර අභ්‍යාස පන්තියක සිටියේ ද ? :————.

මේ ආකෘති පත්‍රයේ මවිසින් සපයන තොරතුරු සැබෑ බවත්, නිවැරදි බවත්, මෙයින් ප්‍රකාශ කරමි. මෙහි තිබෙන ආදායම් මුද්දර මවිසින් ම අලවන ලදී. නියම සැබෑ මුද්දර වන ඒවා මීට ඉහත පාවිච්චියට නොගන්නා ලද ඒවාය. විභාග කොමසාරිස් විසින් විභාගාපේක්ෂකයින් උදෙසා පණවනු ලබන විභාග නීතිවලට ද, මේ විභාගයේ රීතිවලට ද අවනත වී සිටීමට මම එකඟ වෙමි.

මවිසින් සපයන ලද යම් තොරතුරක් හෝ ඒ තොරතුරු සියල්ල හෝ, තේරීමට කලින් වැරදි බව දක්නට ලැබුණොත් මා නුසුදුස්සෙකු බවට පත් කිරීමටත්, පත් කිරීමෙන් පසු ඒ වරද දක්නට ලැබුණොත් කිසි වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමටත් ගන්නා තීරණයට අවනත වීමට ද මම එකඟ වෙමි.

රුපියල් 25 ක් වටිනා මුද්දර
ඇයැදුම්කරුගේ අත්සන.
(ඇයැදුම්කරු මුද්දර මත අත්සන් කළ යුතුය.)

දිනය :————.

12–485—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : 1/23/4/14 (ජී).

## සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පංතියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1970 පෙබරවාරි

1955.10.1 දින අංක 10,844 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1957.11.15 දින අංකය 1/36/2/1 (ජී) සහ 1967.11.26 දින අංකය ජී (162) දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපි වලින් සංශෝධිත, සාමාන්‍ය ලිපිකාර සේවය පිළිබඳ වාර්තාවේ " සී " උපග්‍රන්ථයෙහි දැක්වෙන සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පංතියේ දෙවැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් 1970 පෙබරවාරි මස 20 දින කොළඹ දී පවත්වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම විභාගය, විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන අතර විභාග පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

3. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය හා 1967.11.26 දින අංකය ජී (162) දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ 2 වැනි ඡේදයෙහි සඳහන් උපදෙස් අනුව, නිවැරදිව හා පැහැදිළිව පිළියෙල කරගනු ලබන අයදුම් පත තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් 1970 ජනවාරි මස 9 වැනි දින නොඉක්මවා කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම් පත් විභාග කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයැදුම් පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයැදුම් පත් ප්‍රතික්ෂේප කෙරෙනවා ඇත.

4. අයැදුම් පත් පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් විසින් විභාග කාල සටහනේ පිටපතකුත් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. යම්කිසි විභාග අපේක්ෂකයෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකටවත් පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත්, ප්‍රවේශ පත්‍රය නොලැබුන බව පහත සඳහන් විස්තර සමග කොළඹ, තැ. පෙ. අංක 1503, කොම්පඤ්ඤ වීදියේ, මැලේ වීදියේ විභාග කොමසාරිස් (විදුලි පණිවුඩ ලිපිනය " විභාග " කොළඹ) වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතුය.

(1) විභාගයේ නම,
(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම,
(3) සම්පූර්ණ ලිපිනය,
(4) තැපැල් කාර්යාලය, ලියාපදිංචි කළ අංකය සහ යැවූ දිනය.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 දෙසැම්බර් 10 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

**ආදර්ශ අයදුම් පත්‍ර ආකෘතිය**

## සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පංතියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ ජාතික භාෂා සහ ගිණුම් පිළිබඳ විභාගය—1970 පෙබරවාරි

**ඉල්ලුම් පත්‍රය**

**සැළකිය යුතුයි.**—මෙම ආකෘති පත්‍රය අපේක්ෂකයාගේ අත් අකුරින් ම පිරවිය යුතුයි.

විභාග අංකය :————.
(කායඛාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි).

(1) ඔබගේ, අගට යෙදෙන නම මුලකුරු සමග :————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
පැහැදිළිව ලියන්න)

(2) උපන් දිනය :————.

(3) මව්පියන් අනුව ජාතිය :————.

(සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදි වශයෙන්.)

(4) තනතුර :————.

(5) සා. ලි. සේ. වි. ලි. ප. II වැනි ශ්‍රේණියට ඇතුළත් වූ දිනය :————.

(6) ඔබ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදි ප්‍රවේශකයෙක් ද, නැතහොත් නව ප්‍රවේශකයෙක් ද :————.

(7) දෙපාර්තමේන්තුව :————.

(8) කාර්යාලයීය ලිපිනය :————.

(9) ඔබ මින් ඉහත විභාගයකදී පහත සඳහන් විෂයයන් එකකින් හෝ සමත් වී තිබේද :—

ගිණුම් : සිංහල (ඒ), (බී) ; පහළ සිංහල (ඒ), (බී) දෙමළ (ඒ), (බී) ; පහළ දෙමළ (ඒ), (බී)

එසේ නම් විෂයය සහ විභාග දිනය සඳහන් කරන්න :——.

(10) 1965 දෙසැම්බර් 7 වැනි දින අංක ජී (98) දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ විධිවිධානවලට අනුව ඔබ සිංහල/දෙමළ විෂයයෙන් නිදහස් කර ඇත්නම්, එසේ නිදහස් කරන ලද භාණ්ඩාගාර ලිපියොමුව සඳහන් කරන්න :————.

(11) දැන් ඉදිරිපත් වන විෂයයන් :————.
(i) ගිණුම් (සිංහලෙන්)
ගිණුම් (දෙමළෙන්)
ගිණුම් (ඉංග්‍රීසියෙන්)
(ii) සිංහල (ඒ), (බී)
(iii) පහළ සිංහල (ඒ), (බී)
(iv) දෙමළ (ඒ), (බී)
(v) පහළ දෙමළ (ඒ), (බී)
ඒ = කථනය හා භාෂණ පරිවර්තනය
බී = කියවීම හා ලිවීම

**සැළකිය යුතුයි.**—සා. ලි. සේ., වි. ලි. ප. II වැනි ශ්‍රේණියේ නියුක්ත සිංහල, දෙමළ හෝ මුස්ලිම් නොවන නිලධාරීන්ට ("එනම් බර්ගර් සහ මැලේ ජාතිකයන්ට) පමණක් "පහළ සිංහල" හෝ "පහළ දෙමළ" ගත හැකිය.

මා දන්නා හැටියට හා මගේ විශ්වාසය අනුව මවිසින් ඉහත කරන ලද ප්‍රකාශ සත්‍ය බැව් මෙයින් සහතික කරමි. විභාග ව්‍යවස්ථා අනුගමනය කිරීමට ද එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත දක්වා ඇති විස්තර පරීක්ෂා කර බැලු බව ද, ඒවා නිවැරදි බව ද, අයදුම්කරු විභාගයට පෙනී සිටීමට සුදුස්සකු බව ද මින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන.
පදවි නාමය :————.

දිනය :————.

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

**විභාගාපෙක්ෂකයන් සඳහා නීති**

සියලුම විභාගාපෙක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳි සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපෙක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුලු ජීවිත කාලයේම විභාගයට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපෙක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිය යුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපෙක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර තුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපෙක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසල දීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්ත ව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන්වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාගශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන් ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපෙක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාගශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සැම විභාගාපේක්ෂකයකු ම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශෙෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නො කළ යුතුයි. තමන්ට නියම නො කරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කායඝීමණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතා බස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නො ලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නො හැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නො ලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සැම කඩදාසියක් ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුර පැහැදිළි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත් සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කෑබැලිද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, පයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නෑඹු ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නො ගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් ලියනලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්‍ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම් කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණවූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබාගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වූවොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාව කට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්‍ෂක යකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක් ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂක යකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන්ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කටත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසු කම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරු කර ගත යුතුයි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකි ය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන'ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධි පතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියනකඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලෙජර කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාවම විභාගශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්ට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුප්පි, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දි නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරණය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත් වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධ ව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝවිට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණ බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්න වලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළ වරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවක යකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

12–705—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### ගුවන් හමුදා පොලිස් සුනඛ නිවාසය

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි, ගුවන් හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 ජනවාරි මස 3 වැනි දින පෙරවරු 10 තෙක්, උසස් පෙළපතකින් පැවත එන ඇල්සේෂන් වර්ගයේ, වයස මාස 9 සිට අවුරුද්ද දක්වා බලු පැටව් (පිරිමි) සැපයීම සඳහා මිලදර්ශන භාරගනු ලැබේ.

2. මිලදර්ශන සහිත මුද්‍රා තබන ලද කවරයේ "ඇල්සේෂන් බලු පැටව් සැපයීම සඳහා මිල දර්ශනය" යන්න සඳහන් කර, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි, ගුවන් හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

3. වැඩි විස්තර, කොළඹ 2 හි පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැකි ය.

ඊ. ආර්. අමරසේකර.
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදා ආඥාපති.

12–471—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### ආයුධ සහ උපකරණ සැපයීම

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් රාජකීය ලංකා ගුවන් හමුදාවට ආයුධ සහ උපකරණ සැපයීම සඳහා 1970 ජනවාරි මස 3 වැනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත, නැවත ලබාගත හැකි රු. 75 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර, රිසිට් පතක් ලබාගත යුතුයි. 1969 ජනවාරි මස 2 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2 හි පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැකි ය.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

12–470/1—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### පරණ ලී බඩු සහ ගෘහ භාණ්ඩ විකිණීම

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, කටුනායක පිහිටි සැපයීම් සහ නඩත්තු කිරීමේ ප්‍රධාන කඳවුරේ තිබෙන පරණ ලී බඩු සහ ගෘහ භාණ්ඩ විකිණීම සඳහා 1970 ජනවාරි මස 3 වැනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ලබා ගැනීම පිණිස, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත, නැවත ලබාගත හැකි රු. 100ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1970 ජනවාරි මස 2 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කෙරේ.

3. වැඩි විස්තර, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැකි ය.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාආඥාපති.

12–470/2—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අංශයට අයත් පාවිච්චි කළ නොහැකි උපකරණ විකිණීම—68/69

කොළඹ 9 වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අධිකාරි විසින් පහත සඳහන් උපකරණ විකිණීම සඳහා 1969 දෙසැම්බර් මස 28 වැනි දින පූ. භා. 10.30 දක්වා ටෙන්ඩර්පත් බාරගනු ලැබේ.

1. වැනි තොගය—අවගාර (නොයෙක් ප්‍රමාණයන්ගෙන්) යනාදිය.
2 වැනි තොගය—ඩ්‍රිල් කටු, යතුරු (නොයෙක් ප්‍රමාණයන්ගෙන්) යනාදිය.
3 වැනි තොගය—ලෑලි වර්ග සහ බාල්දි ආදිය.
4. වැනි තොගය—යකඩ තැටි ආදිය.
5. වැනි තොගය—බුරුම සහ බෙලෙක් කපන කතුරු ආදිය.
6. වැනි තොගය—ස්පැනර්, සන්නාලි කතුරු සහ ඔර්ලෝසු ආදිය.
7. වැනි තොගය—අත් කියත් සහ බන්ඩි කියත් ආදිය.
8. වැනි තොගය—දඬු අඬු සහ මේසන් හැඳි ආදිය.
9. වැනි තොගය—කියත් සහ මිටි වර්ග ආදිය.
10. වැනි තොගය—පිහියා වර්ග සහ අඬු ආදිය.
11. වැනි තොගය—රාස්කු සහ අයිලව් අඬු ආදිය.
12. වැනි තොගය—පීරි වර්ග ආදිය.
13. වැනි තොගය—මහන යන්ත්‍ර අමතර කොටස් ආදිය.
14. වැනි තොගය—විදුලි පංකා සහ සපත්තු මහන යන්ත්‍ර අමතර කොටස් ආදිය.

2. ටෙන්ඩර්පත් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි. ටෙන්ඩර් තැන්පත් මුදල රු. 20 කි. මෙම කාර්යාලයෙන් මුදල් බාරගෙන වවුචරයක් ලබාගෙන එයත් සමග බන්ධනාගාර මූලස්ථානයේ සරප් කාර්යාලයේ තැන්පත් කිරීමෙන් පසු ඒ සඳහා නිකුත් කරනු ලබන රිසිට්පත තමන් ඉදිරිපත් කරන ටෙන්ඩර්පතට ඇමිණිය යුතුයි. කොළඹින් පිට නම් ඕනෑම දිසාපති කාර්යාලයක එම මුදල් තැන්පත් කළ හැක.

3. යම් ටෙන්ඩරයක් බාරගත් බව ලිපියකින් දන්වා දින හතක් (7) ඇතුලතදී එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට නොහැකි වී නම් හෝ ඉවත් කර ගැනීමේ කාර්ය පැහැර හැරියේ නම් ටෙන්ඩර්පත් වෙනුවෙන් තැන්පත් කළ මුදල් රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම් පැහැර හරින කොන්ත්‍රාත් කරුවන්ගේ නාමාවලියට ඇතුලත් කරනු ලැබේ. ටෙන්ඩර්පත් පිළිගත් බවට දන්වා යැවෙන ලිපිය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යැවිනි නම් හෝ එම ස්ථානයේ තබා ආවේ නම් හෝ ටෙන්ඩර්කරුට සිය ටෙන්ඩරය පිළිගත් බව දන්වා යැවුනු සේ සළකනු ලැබේ. පිළිගත් ටෙන්ඩර් කරු විසින් උක්ත උපකරණ ඉවත් කර ගැනීමෙන් පසු තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

4. ටෙන්ඩර්කරුවන් විසින් උපකරණ සියල්ලම වෙනුවෙන් ඒකාබද්ධ මිළක් සඳහන් කළ යුතුයි. වැඩිම මිළට ද්‍රව්‍ය සියල්ලක්ම දෙනු ලැබේ. ටෙන්ඩර්පත් ලියුම් කවරයක බහා සීල් තබා පහත සඳහන් අයගේ ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය හැක. සෑම ලියුම් කවරයකම වම් පස ඉහළ කෙළවරේ "පාවිච්චියට ගත නොහැකි උපකරණ සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුයි. **මේ සඳහා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු නොලැබේ.**

5. සාමාන්‍ය වැඩ කරන දිනයන්හි පූ. භා. 8 සිට 11 සහ අ. භා. 1 සිට 3 දක්වා ද පෙර පෝ දිනයන්හි පූ. භා. 8 සිට 11 දක්වා ද වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත කාර්යාලයෙන් විමසීමෙන් මෙම උපකරණ පරීක්ෂා කළ හැක. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩරයේ වෙනස් කිරීමක්, එකතු කිරීමක් හෝ මැකීමක් කර තිබේ නම් එයට ඔවුන්ගේ අත්සන් තැබිය යුතුයි.

6. ටෙන්ඩර්පත් 1969.12.28 වැනි දින පූ. භා. 10.30 ට කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ බන්ධනාගාර කර්මාන්ත අධිකාරීගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන් විසින් බලය පවරා ඇති නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටිය හැක.

7. තවත්, වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය නම්, පහත අත්සන් කරන අයගෙන් ඒවා ලබාගත හැක.

ඩබ්ලිව්. ජේ. ද සිල්වා,
වැ. බ. බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

බන්ධනාගාර කර්මාන්ත කාර්යාලය,
වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ 9,
1969.11.2.

12–454/1—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අංශයට අයත් හිස් ගෝනි, විනාකිරි බෝතල්, ටින්, සිමෙන්ති මළු සහ කැපී ඉතිරිවන ගැල්වනයිස් තහඩු යනාදිය විකිණීම—1969/70

කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ බන්ධනාගාර කර්මාන්ත අධිකාරි විසින් පහත සඳහන් ද්‍රව්‍යයන් විකිණීම සඳහා 1969.12.28 වැනි දින පූ. භා. 10 දක්වා ටෙන්ඩර්පත් බාරගනු ලැබේ:—

| | |
|---|---|
| 1. හිස් ගෝනි ... | ... 5,000 |
| 2. හිස් සිමෙන්ති මළු ... | .. 250 |
| 3. හිස් සිමෙන්ති ගෝනි ... | ... 70 |
| 4. හිස් බේකරි මුහුන් ටින් ... | ... 360 |
| 5. හිස් සෝඩා බයි කාබනේට් පීප්ප | ... 45 |
| 6. හිස් බ්ලිචින් පවුඩර් පීප්ප ... | ... 45 |
| 7. හිස් යීස්ට් ටින් ... | ... 900 |
| 8. හිස් මැන්ෂන් ඔප ටින් ... | ... 25 |
| 9. හිස් තෙල් පීප්ප (ගැලුම් 45) ... | ... 9 |
| 10. හිස් තීන්ත ටින් (ගැලුම් 1) ... | ... 10 |
| 11. හිස් තීන්ත ටින් (ගැලුම් 1/2) ... | ... 12 |
| 12. හිස් විනාකිරි බෝතල් (සම්පූර්ණ) | ... 550 |
| 13. හිස් විනාකිරි බෝතල් (භාග) ... | ... 85 |
| 14. කැපී ඉතිරිවී ඇති ගැල්වනයිස් තහඩු ගොඩක්. | |

2. ටෙන්ඩර්පත් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි. ටෙන්ඩර් තැන්පත් මුදල රු. 100 කි. මෙම කායශාලයෙන් මුදල් බාරදෙන වවුචරයක් ලබාගෙන එයත් සමග බන්ධනාගාර මූලස්ථානයේ සරප් කාර්යාලයේ තැන්පත් කිරීමෙන් පසු ඒ සඳහා නිකුත් කරනු ලබන රිසිට්පත් තමන් ඉදිරිපත් කරන ටෙන්ඩර්පතට ඇමිණිය යුතුයි. කොළඹින් පිට නම් ඕනෑම දිසාපති කාර්යාලයක එම මුදල් තැන්පත් කළ හැක.

3. යම් ටෙන්ඩරයක් බාරගත් බව ලිපියකින් දන්වා දින හතක් (7) ඇතුලතදී එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට නොහැකිවී නම් හෝ ඉවත් කර ගැනීමේ කාර්ය පැහැර හැරියේ නම් ටෙන්ඩර්පත් වෙනුවෙන් තැන්පත් කළ මුදල් රාජසන්තක කොට ඔහුගේ නාම සහ ලිපිනය වගකීම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඇතුළත් කරනු ලැබේ. ඉහත සඳහන් ද්‍රව්‍යයන් ඉවත්කර ගැනීමේදී ප්‍රථමයෙන් කැපී ඉතිරිවී ඇති තහඩු ගොඩ ඉවත් කළ යුතුයි. ටෙන්ඩර්පත් පිළිගත් බවට දන්වා යැවෙන ලිපිය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යැවිනි නම් හෝ එම ස්ථානයේ තබා ආවේ නම් හෝ ටෙන්ඩර්කරුට සිය ටෙන්ඩරය පිළිගත් බව දන්වා යැවුනු සේ සළකනු ලැබේ. පිළිගත් ටෙන්ඩර්කරු විසින් උක්ත ද්‍රව්‍ය ඉවත්කර ගැනීමෙන් පසු තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

4. ටෙන්ඩර්කරුවන් විසින් ද්‍රව්‍ය සියල්ලක්ම වෙනුවෙන් ඒකාබද්ධ මිළක් සඳහන් කළ යුතුයි. වැඩිම මිළට ද්‍රව්‍ය සියල්ලක්ම දෙනු ලැබේ. ටෙන්ඩර්පත් ලියුම් කවරයක බහා සීල් තබා පහත සඳහන් අයගේ ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක. සෑම ලියුම් කවරයකම වම්පස ඉහළ කෙළවරේ " හිස් ගෝනි, බෝතල්, ටින්,....................යනාදිය සඳහා " යනුවෙන් සඳහන් කළ යුතුයි. මේ සඳහා ටෙන්ඩර් ෆෝර්ම් නිකුත් කරනු නොලැබේ.

5. සාමාන්‍ය වැඩ කරන දිනයන්හි පූ. භා. 8 සිට පූ. භා. 11 දක්වා ද අ. භා. 1 සිට 3 දක්වාද පෙර පෝ දිනයන්හි පූ. භා. 8 සිට 11 දක්වාද වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත කායශාලයෙන් විමසීමෙන් මෙම ද්‍රව්‍ය පරීක්ෂා කළ හැක. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩරයේ යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් කර තිබේ නම් එයට ඔවුන්ගේ අත්සන් තැබිය යුතුයි.

6. ටෙන්ඩර්පත් 1969.12.28 වැනි දින පූ. භා. 10.30 ට කොළඹ 9, වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත අධිකාරීගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන් විසින් අනුමත කරන නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ඉදිරිපත් විය හැක.

7. තවත්, වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය නම්, පහත අත්සන් කරන අයගෙන් ඒවා ලබාගත හැක.

ඩබ්ලිව්. ජේ. ද සිල්වා,
වැ. බ. බන්ධනාගාර කර්මාන්ත අධිකාරි.

බන්ධනාගාර කර්මාන්ත කාර්යාලය,
වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ,
1969. 11. 2 දින.

12–454/2—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### ටයර් අළුත්වැඩියා කිරීම සහ නැවත පිරවීම—1968-69

කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අධිකාරිතුන විසින් පහත සඳහන් ටයර් අළුත්වැඩියා කිරීම සහ නැවත පිරවීම සඳහා ටෙන්ඩර් 1969.12.28 දින පූ. භා. 10.30 දක්වා බාරගනු ලැබේ.

| ටයර්වල මිමි | ටයර් ගණන |
|---|---|
| 1. 600×16 | ... 08 |
| 2. 640 × 14 | ... 21 |
| 3. 640 × 15 | ... 34 |
| 4. 650 × 13 | .. 03 |
| 5. 650 × 14 | ... 05 |
| 6. 670 × 13 | .. 04 |
| 7. 670 × 15 | ... 01 |
| 8. 700 × 20 | ... 11 |
| 9. 750 × 16 | ... 06 |
| 10. 750 × 20 | .. 06 |
| 11. 775 × 15 | ... 02 |
| 12. මිම්නොමැති ටයර් | ... 02 |
| එකතුව ... | 103 |

2. 1 වැනි ඡේදයේ දක්වා ඇති ටයර් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර් කිරීමේ නිදහස ටෙන්ඩර්කරුවන් සතුය.

3. 1969.12.28 වැනි දින දවල් 10 වනතෙක් බන්ධනාගාර කර්මාන්ත අධිකාරිතුමාගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝරම අනු පිටපතක් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ බන්ධනාගාර කොමසාරිස් වෙත හෝ කොළඹින් පිටත ඕනෑම දිසාපති කාර්යාලයකදීත් රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය, ෆෝරම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. සියලුම ටෙන්ඩර් මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි " ටයර් අළුත්වැඩියාකිරීම සහ නැවත පිරවීම " යනුවෙන් සඳහන් කොට කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අධිකාරි යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවීම හෝ පහත අත්සන් කරන ලද අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලියුම් කවරයේ වම් පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි.

5. ටෙන්ඩර් 1969.12.28 වැනි දින පූ. භා. 10.30 ට කොළඹ 9, වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත අධිකාරීගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන් විසින් අනුමත කරන නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ඉදිරිපත් විය හැක.

6. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර සාමාන්‍ය වැඩ කරන දිනයන්හී පූ. භා. 8 සිට 11 හා අ. භා. 1 සිට 3 දක්වා ද පෙර පෝ දිනයන්හී පූ. භා. 8 සිට 11 දක්වා ද වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත කාර්යාලයෙන් විමසීමෙන් පසු ටයර් පරීක්ෂා කළ හැක. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩරයේ යම් වෙනස් කිරීමක්, එකතු කිරීමක් හෝ මැකීමක් කර තිබේ නම් එයට ඔවුන්ගේ අත්සන් තැබිය යුතුයි.

7. කොන්ත්‍රාත්තුව පැවරුන දින සිට ටයර් අළුත්වැඩියා කිරීම/පිරවීම සඳහා කොපමණ කාලයක් ගතවේදැයි ටෙන්ඩරයෙහි සඳහන් කළ යුතුයි. ගාස්තු ඉලක්කමෙන් සහ අකුරෙන් සඳහන් කළ යුතුයි.

8. ටෙන්ඩර් පතෙහි සඳහන් කොන්දේසි පැහැර හැරියහොත් එම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත.

9. ටයර් එකතු කිරීම සහ අළුත්වැඩියාවෙන් පසු ගෙනවිත් බාරදීම ටෙන්ඩර්කරු විසින් කළ යුතුයි.

10. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකිවූ කොන්ත්‍රාත්කරු ඒ බව දන්වා එවූ විට දින 10 ක් ඇතුලතදී බන්ධනාගාර කර්මාන්ත අධිකාරී සමඟ ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු

අපොහොසත් වුණි නම් එම කාලසීමාව තුළදී ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුලත් කරනු ඇත.

11. ටෙන්ඩරය කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් බාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම රජය සතුය.

12. ටෙන්ඩර් බාරගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි.

13. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් කරන ලද කාර්ය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

14. තවත්, වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය නම්, පහත අත්සන් කරන අයගෙන් ඒවා ලබාගත හැක.

ඩබ්ලිව්. ජේ. ද සිල්වා,
වැ. බ. බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

බන්ධනාගාර කර්මාන්ත කාර්යාලය,
වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ 9,
1969.11.2.

12–454/3—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### 1970-73 වර්ෂ සඳහා අරක්කු සැපයීම

1970 අප්‍රේල් මස 1 වැනි දින සිට 1973 මාර්තු 31 දින දක්වා කාලසීමාව තුළ අරක්කු සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍ර, කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ පිහිටි ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජනවාරි මස 5 වන දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

සුරාබදු කොමසාරිස් වෙතින් ඉල්ලුම් කළ විට ලබාගත හැකි ෆෝර්ම්වල ටෙන්ඩර් පත්‍ර සකස් කළ යුතු අතර, මේ පිළිබඳව සියලුම විස්තර ද ඔහුගෙන් ලබාගත හැකිය. 1970 ජනවාරි මස 4 වන දින පස්වරු 3. න් පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු නොලැබේ.

මූ. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

එල්බී/ඒ 168.
1969 නොවැම්බර් මස 29 දින,
කොළඹ 7,
සුරාබදු කොමසාරිස් කාර්යාලයේදීය.

12–440—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

නැංගුරම් ටග් යාත්‍රාවක් සහ මඩ භාරන යාත්‍රාවක් සපයා භාරදීම සඳහා 1969. 12. 5 දා රජයේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීමට, වැඩි මනත්ව, නැංගුරම් ටග් යාත්‍රාව සපයා භාරදීම සඳහා ටෙන්ඩර් 1970 මාර්තු මස 11 වෙනිදා පෙරවරු 9.30 දක්වා භාරගන්නා බවද ටෙන්ඩර් ලියකියවිලි 1970 මාර්තු මස 10 වෙනිදා දහවල් 12 දක්වා නිකුත්කරන බවද මෙයින් දන්වනු ලැබේ.

රු. 250 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් හා රු. 30 ක මුදලක් ලියකියවිලි ගාස්තු වශයෙන් වරාය කොමිෂන් සභාවේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත්කරනු ලැබේ. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව රු. 250 ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් ලියකියවිලි ගාස්තු වන රු. 30 ආපසු ගෙවනු නැත. අවලංගු කරන ලද ටෙන්ඩර් ලියකියවිලි හෝ විස්තර පත්‍රිකා නිකුත් කරනු නොලැබේ.

මඩ භාරන යාත්‍රාව සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල සහ ලියකියවිලි ගාස්තු පිළිවෙලින් රු. 250 සහ රු. 30 වන අතර, ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව සහ ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන අවසාන වේලාව, නොවෙනස්ව 1969. 12. 5 දා රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද පරිදි පවතිනවා ඇත.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1.
1969. 12. 12 දින.

12–376—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඉප/260 (69/70).

## ගාලු කච්චේරිය

### ටෙන්ඩර් කැඳවීම පිළිබඳ දැන්වීමයි

ගාලු දිස්ත්‍රික්කයේ පහත උප ලේඛණයේ සඳහන් තැනීම් වැඩ සඳහා 1969 දෙසැම්බර් මස 31 වැනි බදාදා ප.ව. 2.30 වන තෙක් කොළඹ (තැ.පෙ. 500) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. එම ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයයේ තුන්වෙනි තට්ටුවේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබනු ඇත. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු වේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ගාල්ලේ දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩ පිළිබඳ සැලසුම් පූර්වෝක්ත දිසාපති කාර්යාලයයේ දී බැලිය හැකි වන අතර, ඒ පිළිබඳ සියලු විස්තර ඔහු වෙතින් ලබා ගත හැක.

3. පහත සඳහන් ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩි මුදලකට කොන්ත්‍රාත් වැඩ සඳහා රජයේ ලියාපදිංචි වී ඇති පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට හා රජයේ වැඩ, වාරිමාර්ග, අධ්‍යාපන හෝ වෙනත් දෙපාර්තමේන්තුවල ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති, මෙවැනි වැඩ හොඳින් කිරීමට හැකියාවක් තිබෙන සමූපකාර හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ද මෙම වැඩ සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඒ වෙනුවෙන් ඉහත සඳහන් දිසාපති වෙත එසේ ලියාපදිංචි වී තිබීම හා හැකියාව පිළිබඳ සාධකත්, රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා වූ කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 1969 දෙසැම්බර් මස 27 වැනි දින ප.ව. 3. දක්වා වන්නේය. ලියාපදිංචි සමිති විසින් ටෙන්ඩර් තැන්පත් තැබීම අවශ්‍ය නොවේ. එහෙත් ඒ ඒ සමිතිවලට අදාල දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික්ක ප්‍රධානීන්ගෙන් ලබාගත් තමන්ගේ හැකියාවන් පිළිබඳ සහතික ඔවුන් ඉදිරිපත් කළ යුතු වන්නේය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයේ හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ දී හෝ ගෙවීමට පිළිවන.

5. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ “ .......................... සඳහා ටෙන්ඩර් පත්‍රය ” යනුවෙන් සඳහන් විය යුතු අතර, සියලුම ටෙන්ඩර් පත්‍ර අත්සන් තබා සීල් කර, සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුය.

ඩබ්. එල්. ආර්. බී. ද අල්විස්,
උප සභාපති,
ගාල්ලේ දිසාපති වෙනුවට.

1969.11.28 දින,
ගාල්ලේ දිසාපති කාර්යාලයයේ දී ය.

### උප ලේඛනය

| | වැඩ විස්තරය | පිහිටි ප්‍රදේශය | ලියාපදිංචි වී තිබිය යුතු මුදල රු. |
|---|---|---|---|
| 1. | උඩවැලිවිටිය උස්බිම් ජනපද ප්‍රවේශ පාර බෝක්කු තැනීම ... | ගහබඩ පත්තුව ... | 20,000 |
| 2. | ලංසියාහේන ජනපද පාර තැනීම ... | කඩවත් සතර ... | 30,000 |
| 3. | දම්මල-හල්විටිගල පාර 1 වැනි සැතපුම තාර දැමීම ... | හිනිදුම් පත්තුව ... | 40,000 |
| 4. | රුමස්සල ජනපදයට ජල සම්පාදන ක්‍රමයක් ඇති කිරීම ... | තල්පෙ පත්තුව ... | 30,000 |

12–475—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

අංකය : ඉප/260 (69/70).

## ගාලු කච්චේරිය

### ටෙන්ඩර් කැඳවීම පිළිබඳ දැන්වීමයි

ගාලු දිස්ත්‍රික්කයේ පහත උපලේඛනයේ සඳහන් තැනීම් වැඩ සඳහා 1969 දෙසැම්බර් මස 31 වැනි බදාදා ප.ව. 2.30 වන තෙක් ගාල්ලේ දිසාපති තැන විසින් ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. එම ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය ගාල්ලේ උප දිසාපතිගේ කායඝාල කාමරයේ තබනු ඇත. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුවේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ගාල්ලේ දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩ පිළිබඳ සැලසුම් පූර්වෝක්ත දිසාපති කාර්යාලයේ දී බැලිය හැකි වන අතර, ඒ පිළිබඳ සියලු විස්තර ඔහු වෙතින් ලබා ගත හැක.

3. පහත සඳහන් ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩි මුදලකට කොන්ත්‍රාත් වැඩ සඳහා රජයේ ලියාපදිංචි වී ඇති පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට හා රජයේ වැඩ, වාරිමාර්ග, අධ්‍යාපන හෝ වෙනත් දෙපාර්තමේන්තුවල ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති, මෙවැනි වැඩ හොඳින් කිරීමට හැකියාවක් තිබෙන සමූපකාර හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ද මෙම වැඩ සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඒ වෙනුවෙන් ඉහත සඳහන් දිසාපති වෙත එසේ ලියා ලියාපදිංචි වී තිබීම හා හැකියාව පිළිබඳ සාධකත්, රු. 100/- ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා වූ කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 1969 දෙසැම්බර් මස 28 වැනි දින ප.ව. 3.00 දක්වා වන්නේය. ලියා පදිංචි සමිති විසින් ටෙන්ඩර් තැන්පත් තැබීම අවශ්‍ය නොවේ. එහෙත් ඒ ඒ සමිතිවලට අදාල දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික්ක ප්‍රධානීන්ගෙන් ලබාගත් තමන්ගේ හැකියාවන් පිළිබඳ සහතික මා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයේ හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ දී හෝ ගෙවීමට පිළිවන.

5. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ "........................... සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් විය යුතු අතර, සියලුම ටෙන්ඩර් පත්‍ර අත්සන් තබා සීල් කර, සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුයි.

ඩබ්. එල්. ආර්. බී. ද අල්විස්,
උප දිසාපති,
ගාල්ලේ දිසාපති වෙනුවට

1969.11.28 දින,
ගාල්ලේ දිසාපති කාර්යාලයේදී ය.

### උප ලේඛනය

| | වැඩ විස්තරය | පිහිටි ප්‍රදේශය | ලියාපදිංචි වී තිබිය යුතු මුදල රු. |
|---|---|---|---|
| 1. | උඩ වැලිවිටිය උස්බිම් ජනපද ප්‍රවේශ පාර (කොටසක්) ... | ගහබඩ පත්තුව ... | 15,000 |
| 2. | උඩවැලිවිටිය උස්බිම් ජනපදයේ ජල නල ව්‍යාපාරය ... | එම ... | 10,000 |
| 3. | ඕපාත-වීරපාන පාර 2 සැතපුම අළුත් වැඩියාව ... ... | හිනිදුම් පත්තුව ... | 15,000 |

12–474—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### මාන්කුලම් පොලිස් ස්ථානය ගොඩනැගිලිවල විදුලි ස්ථාපනය

ඉහත සඳහන් සේවය සඳහා 1970.1.9 වන දින පෙරවරු 11 දක්වා ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 70.1.8 වෙනි දින දාවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක අනු පිටපතක් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කායඝාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ. බැහැර කච්චේරියක රු. 25 ක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් ෆෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළ හොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ කෙළවරේ "මාන්කුලම් පොලිස් ස්ථාන ගොඩනැගිලිවල විදුලි ස්ථාපනය සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන්කොට, කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපැලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිත යෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට මසක් ඇතුළත වැඩය නිම කළ යුතුය.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දැන්වූ කල්හි පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වූවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නම ද රජයේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේය.

9. කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 70.1.9 වන දින පෙ. ව. 11.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් විසින් මෙවැනි වැඩ සඳහා ඔවුන්ගේ පළපුරුදුකම් හා දක්‍ෂතාවය ටෙන්ඩර් ෆෝරම ඉල්ලීමේදී ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාරගැනීමේ බලය රජය සතු වේ.

13. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරුතැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සීපී/3/62.
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය, කොළඹ, 69.12.3.

12–469—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1970 ජනවාරි මස 7 දින පෙ. ව. 11 දක්වා සේවයට අයෝග්‍ය හා වැඩිපුර ඇති පහත සඳහන් යන්ත්‍ර සූත්‍ර, පොම්ප, විදුලි උපකරණ සහ අමතර කොටස් මිළදී ගෙන ඉවත්කර ගැනීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

### බකට් ස්ක්‍රෙපර් යන්ත්‍ර

| විෂය | විස්තර | ධාරිතාවය | දෙපාර්තමේන්තු අංකය |
|---|---|---|---|
| 1. | බයිසරස් අයර් ඇස් 152 ... ... | 15/18 ඝන යාර ... | අයිඩීබීඇස්. 4 |
| 2. | එම ... | එම ... | අයි ඩීබීඇස්. 5 |
| 3. | එම ... | එම ... | අයිඩීබීඇස්. 6 |

| විෂය | විස්තර | ධාරිතාවය | දෙපාර්තමේන්තු අංකය |
|---|---|---|---|
| 4. | වූල්රිඩ්ජ් බීබී/120 | 12/14 ඝන යාර | අයිඩීබීඇස්. 50 (ෂීව් බී. 189 එකක් සමඟ) |
| 5. | එම | එම | අයිඩීබීඇස්. 51 එම |
| 6. | එම | එම | අයිඩීබීඇස්. 52 එම |
| 7. | එම | එම | අයිඩීබීඇස්. 53 එම |
| 8. | එම | එම | අයිඩීබීඇස්. 64 එම |

**යාන්ත්‍රික ශවල්**

| | | | |
|---|---|---|---|
| 9. | වේස්සයිඩ් | ½ ඝන යාර | අයිඩීඑම්ඇස්. 2 |
| 10. | එම | එම | අයිඩීඇම්ඇස්. 3 |

**කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ යන්ත්‍ර**

| | | | |
|---|---|---|---|
| 11. | රැන්සම් රේපියර් | 5/3 ඝන අඩි | අයිඩීසීඑම්. 12 (ද: 3 පුරුක් 2 සහ ස්ප්‍රොකට් 1 සමඟ) |
| 12. | එම | එම | අයිඩීසීඑම්. 13 එම |
| 13. | එම | එම | අයිඩීසීඑම්. 14 එම |
| 14 | එම | එම | අයිඩීසීඑම්. 22 එම |
| 15. | එම | එම | අයිඩීසීඑම්. 23 එම |
| 16. | එම | එම | අයිඩීසීඑම්. 31 එම |
| 17. | එම | එම | අයිඩීසීඑම්. 32 එම |
| 18. | එම | එම | අයිඩීසීඑම්. 35 එම |
| 19. | එම | එම | අයිඩීසීඑම්. 48 එම |
| 20. | එම | එම | අයිඩීසීඑම්. 52 එම |
| 21. | එම | එම | අයිඩීසීඑම්. 55 එම |
| 22. | එම | එම | අයිඩීසීඑම්. 56 එම |
| 23. | පාකර් | 14/10 | අයිඩීසීඑම්. 58 එම |
| 24. | එම | එම | අයිඩීසීඑම්. 63 එම |
| 25. | රැන්සම් රේපියර් 7එන්ටී | 10/7 | අයිඩීසීඑම්. 64 එම |
| 26. | පාකර් (10 එස්එන්ටී) | 14/10 | අයිඩීසීඑම්. 82 එම |

**වේ බැවර් යන්ත්‍ර**

| | | | |
|---|---|---|---|
| 27. | ඔටොමැටික් ට්වින් බකට් | | අයිඩීබීඩබ්. 2 |
| 28. | එම | | අයිඩීබීඩබ්. 8 |
| 29. | එම | | අයිඩීබීඩබ්. 9 |
| 30. | එම | | අයිඩීබීඩබ්. 10 |
| 31. | එම | | අයිඩීබීඩබ්. 15 |

**විදීමේ උපකරණ**

| | | | |
|---|---|---|---|
| 32. | ඩ්‍රිලින් සලිවන් නො. 12 ර්2 ස්කෘ පීඩ් | | අයිඩීඩීඩී. 1201 |
| 33. | එම | | අයිඩීඩීඩී. 1202 |
| 34. | ඩ්‍රිලින් සලිවන් නො. 2 හයිඩ්‍රොලික් | | අයිඩීඩීඩී. 1203 |
| 35. | ඩ්‍රිලින් සලිවන් සර්ෆේස් කෝර් නො. 7 හයිඩ්‍රොලික් ස්විවල් හෙඩ් සිම්පල් ඩබල් ඇක්ටින් පම්ප් සමඟ | | ඩී. 1204 |
| 36. | එම | | ඩී. 1205 |
| 37. | එම | | ඩී. 1207 |
| 38. | එම | | ඩී. 1208 |
| 39. | ඩයමන්ඩ් ඩ්‍රිල්—සිපී. 8 | | ඩී. 1209 |

**පොම්ප**

| | | | |
|---|---|---|---|
| 40. | ට්වින් සිලින්ඩර් නෝවා පම්ප් | | පී. 1006 |
| 41. | එම | | පී. 1007 |
| 42. | එම | | පී. 1008 |
| 43. | එම | | පී. 1009 |
| 44. | එම | | පී. 1013 |
| 45. | එම | | පී. 1014 |
| 46. | එම | | පී. 1011 |
| 47. | නෝවා පම්ප්—සිංගල් සිලින්ඩර් | | පී. 1012 |
| 48. | පම්ප් බුයකොට් | | පී. 1004 |
| 49. | එම | | පී. 1005 |
| 50. | ජේ. එච්. බෙන්ඩර් වෙහිකල් ප්‍රේම් ඇක්ෂල් ස්ට්‍රෙනිනිංග් මැෂින් | | 1 |
| 51. | ට්‍රැක් ඇසැම්බ්ලිස් (තොග 1) | | ඒකක 12 |
| 52. | එම (තොග 2) | | ,, 8 |

2. විෂය 1 සිට 31 දක්වා හා 50 සිට 52 දක්වා රත්මලානේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේදීද, විෂය 32 සිට 49 දක්වා කොළඹ 5, ජාවත්ත පාරේ අංක 34 දරණ විදුම් ගබඩාවේදීද පෙර පෝය දිනයන්හි හැර, ඕනෑම වැඩ කරන දිනක පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 අතර දී පරීක්ෂාකර බැලිය හැකිය.

3. පහත 4 වන ඡේදයේ සඳහන් පරිදි ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීමෙන් ලබාගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් 1970 ජනවාරි මස 4 වැනි ඉරිද පෙරවරු 11.00 වන තෙක් ලබා ගතහැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ, කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ, කොළඹින් පිටත ඕනෑම කච්චේරියක පහත දැක්වෙන පදනම අනුව ගණන් බලා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල් වෙනුවෙන් නිකුත් කරන ලද කුවිතාන්සි ඉදිරිපත් කළ විටය :—

(අ) විෂයයන් 1 සිට 31 සහ 50 සඳහා : ටෙන්ඩර්කරු ඉල්ලුම් කිරීමට කැමති එක් එක් විෂයයකට රුපියල් 100 බගින්.

(ආ) විෂයයන් 32 සිට 49 සහ 51 හා 52 සඳහා : ටෙන්ඩර්කරු ඉල්ලුම් කිරීමට කැමති එක් එක් විෂයයකට රුපියල් 25 බැගින්.

5. කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් (යාන්ත්‍රික ශාඛාව) හෝ රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැන ගෙන් වැඩි විස්තර ලබා ගත හැක.

එල්. ඕ. ද එස්. ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට,

බෞද්ධාලෝක මාවත,
කොළඹ 7,
1969 නොවැම්බර් මස 28 වැනි දිනදීය.

12–488—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—තිස්සමහරාමය උප කොටස

දකුණු කොට්ඨාශයේ, තංගල්ලේ ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් තිස්සමහාරාමය උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් 1970 ජනවාරි මස 6 වැනි අඟහරුවාදා පෙ.ව. 10 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරිම එවෙලේම එහිදී සිදුකෙරේ.

| වැඩෙහි නම | කොන්ත්‍රාත් කරුගේ ලියාපදිංචිය රු. ශ. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|
| 1. මහමිරිස්වත්ත වැව ප්‍රතිසංස්කරණය කිරිම | 50,000 0... | 50 0 |
| 2. බීරාගේ වැව ප්‍රතිසංස්කරණය කිරිම ... | 75,000 0... | 100 0 |

2. මෙම දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ඒ ඒ ගණ වලට ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවනට, සමූපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1969 දෙසැම්බර් මස 12 දින සිට 1970.1.2 දින දක්වා, සාමාන්‍ය කායඹාලියය වේලාවන් තුළදී, තිස්ස/හම්බන්තොට/මාතර සහ ගාල්ල යන උප කොට්ඨාශ වාරිමාර්ග කායඹාලයන්ගෙන් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝරට සඳහා ඉල්ලුම් කිරිමේදී, ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන සහතිකයක්, ඔවුන්ට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඉඩදිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා, වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් ගණ වලට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඹාලයයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට, ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩර් ගැන සියළු විස්තර කායඹාලියය වේලාවන් තුළදී තිස්සමහාරාම වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඹාලයයෙන් ලබාගත හැකිය. පස්වැඩ ඉටුකිරිම සඳහා සැතපුම් කාලක් පටණ දුර ප්‍රමාණයක් ඇදියහැකි යන්ත්‍ර පාවිච්චි කළ යුතුය. දෙපාර්තමේන්තුවෙන් කිසිවක් සපයනු නොලැබේ.

ඕ. සී. අබේසේකර,
වාරිමාර්ග ඉංජිනේරු, තිස්සමහාරාමය උප කොටස

1969 නොවැම්බර් මස 28 දින,
වාරිමාර්ග කාර්යාලයය, තිස්සමහාරාමය.

12–489—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහනුවර උප කොටස

මහනුවර උප කොටසේ " උඩුනුවර කුරගන් දෙණිය වැව ඉදිකිරීම " සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර කුන්ඩසාලේ වාසී, මධ්‍යම කොඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969.12.31 දින පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරිම එවේලේම සිදු කරනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 25,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට, සමූපකාර සමිති වලට හා ග්‍රාමසංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

3. 1969.12.28 දින දක්වා (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුල පමණක් මහනුවර, මාතලේ, හසලක, නුවරඑළිය යන වාරිමාර්ග කාර්යාලයකින් ලබාගතහැකි ආකෘති පත් වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘතිපත් ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ආකෘතිපත් නිකුත් කිරීමට පළමු රු. 25ක් ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් වාරිමාර්ග කාර්යාලයක හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර්පත් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතුවා මෙන්ම ලියාපදිංචි කළ සීල් තබන ලද කවරයක බහා එවිය යුතුය. " උඩුනුවර කුරගන් දෙණිය වැව ඉදිකිරීම " යනුවෙන් කවරයේ වම් උඩ කෙළවරේ පැහැදිලිවම සඳහන් කළ යුතුයි.

5. ටෙන්ඩරය පිළිබඳ වෙනත් අදාල විස්තර හා සැලසුම් ආදිය රාජකාරී වේලාවන් තුලදී මහනුවර වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් බලාගත හැක.

ඒ. පී. ජේ. ද පින්ටෝ,
මහනුවර වාරිමාර්ග ඉංජිනේරුතැන,
මහනුවර උප කොටස.

වාරිමාර්ග කාර්යාලය, මහනුවර උප කොටස,
1969 නොවැම්බර් මස 26 දින,
කුන්ඩසාලේ දීය.

12–463—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාගී දෙපාතීමේන්තුව—කල්මුනේ උප කොට්ඨාශය

අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනේ උප කොට්ඨාශයේ වාරිමාගී බඩු ගබඩාවට ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් පත් 1969 දෙසැම්බර් මස 26 වන සිකුරාදා පෙරවරු 10 දක්වා මඩකලපුව නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදිනම පෙරවරු 10.05 ට එම ස්ථානයේ දීම සිදු කරණු ලැබේ.

2. මෙම වැඩය සඳහා වාරිමාගී දෙපාතීමේන්තුවේ රු. 15,000 කට හෝ ඊට වැඩි ගණන්වලට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය. 1969 දෙසැම්බර් මස 21 වන ඉරිදා දින දවල් 12ත දක්වා කායඹාල වේලාවන් තුළ දී කල්මුනේ, අම්පාර සහ වෙන්කලඩි යන වාරිමාර්ග කායඹාලවලින් ලබාගත හැකි පෝර්ම්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝරම් ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාගී වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීමට වාරිමාගී තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝරම් නිකුත් කිරීමට ප්‍රථම රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් කල්මුනේ, අම්පාර සහ වෙන්කලඩි යන වාරිමාගී කායඹාලවල හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. වැඩිදුර විස්තර කායඹාල වේලාවන් තුළ දී කල්මුනේ වාරිමාගී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

සී. ෂන්මුගරාජා,
වාරිමාගී ඉංජිනේරු තැන,
කල්මුනේ උප කොට්ඨාශය.

වාරිමාගී කායඹාලය,
කල්මුනේ,
1969. 10. 28 වන දින.

12–473—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ගාලු උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර් අයදුම් පත්‍ර තංගල්ලේ ප්‍රාදේශීය ඉංජිනේරු තැන විසින් 1970 ජනවාරි 5 වැනි දින දහවල් 12 වනතෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

| වැඩ විස්තර | ලියාපදිංචි මුදල රු. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|
| 1. ගංඉම ඇල ප්‍රකෘතිමත් කිරීම ... | 40,000 ... | 50 |
| 2. මත්තක අමුන වැඩිදියුණු කිරීම ... | 15,000 ... | 25 |
| 3. අක්මීමන අමුන වැඩිදියුණු කිරීම ... | 15,000 ... | 25 |

ටෙන්ඩර් ඇප මුදල ඉහත සඳහන් වාරිමාර්ග කායඹාලයක හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරිමෙන් 3.1.70 වෙනි දින දාවල් 12 ට හෝ ඊට පෙර ටෙන්ඩර් පෝර්ම ගාල්ල/මාතර/හම්බන්තොට/තිස්ස වාරිමාර්ග කායඹාල වලින් ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරිමේදී ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් ඉදිරිපත් කළ යුතුයි.

මේ ගැන වැඩි විස්තර ගාල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඹාලයෙන් ලබාගත හැක.

ජේ. එම්. ඩී. එල්. සෙනෙවිරත්න,
වාරිමාර්ග ඉංජිනේරු, ගාල්ල උප කොටස.

වාරිමාර්ග කායඹාලය
1969 නොවැම්බර් මස 27 වැනි දින,
ගාල්ල.

12–448—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මාතලේ උප කොට්ඨාශය

මාතලේ උප කොට්ඨාශය යටතේ 1969/70 සහ 1970/71 යන මුදල් වර්‍ෂ දෙක තුළ ගබඩා ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් පත් 1970 ජනවාරි මස 7 වැනි දින පෙ. ව. 10 දක්වා නත්තරම්පොත කුණ්ඩසාලේ මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රු. 20,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සන් වේ. අයදුම්කරුවන් යටත් පිරිසෙයින් ලොරි දෙකකවත් හිමිකරුවන් විය යුතු අතර අවශ්‍ය වුවහොත් ලොරි ධාවනය කළ නොහැකි මාර්ග වල බඩු ප්‍රවාහණය කිරීම සඳහා ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් ලබාගත හැකි අයවලුන් විය යුතුය.

අයදුම්කරුවන් ටෙන්ඩර් ෆෝරම ලබාගැනීමට ප්‍රථම තමන් සතු ලොරි ලියා පදිංචි කිරීමේ කාඩ්පත් සහ 1969 වර්‍ෂයට ලබා ගත් වාහන බලපත්‍ර ඉදිරිපත් කළ යුතුය.

1969 දෙසැම්බර් මස 17 වැනි දින සිට 1970 ජනවාරි මස 6 වැනි දින දක්වා කාර්යාල වේලාවන්හිදී මාතලේ, මහනුවර, හසලක සහ නුවරඑළිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලින් ලබාගත හැකි ෆෝරම වලින් ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් සඳහා ඉදිරිපත්වන ඉල්ලුම්කරුවන් ඔවුන් කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝරම නිකුත් කිරීමට ප්‍රථම ඒ සඳහා රු. 25 ක මුදලක් තැන්පත් කළ යුතුය. තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ග්‍රාමසංවර්ධන සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් ෆෝරම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය.

ටෙන්ඩර් සඳහා වැඩිමනත් විස්තර මාතලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් කාර්යාල වේලාවන්හිදී ලබාගත හැක.

සී. කනගලිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මාතලේ උප කොටස.

1969 නොවැම්බර් මස 25 වැනි දින,
මාතලේ වාරිමාර්ග කාර්යාලයේදී ය.

12–457—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පානදුර බොල්ගොඩ වැඩ ඒකකයේ මාලමුල්ලේ සිට පානදුර මුහුදු වැටි තැනීමේ ස්ථානයට ටොන් ½ යේ සිට ටොන් 4 දක්වා බර ඇති කළු ගල් කියුබ් 400 පැටවීම, ප්‍රවාහණය කිරීම, බෑම සහ මුහුදු වැටියේ තැන්පත් කිරීමට ටෙන්ඩර් අයදුම් පත් 1969 දෙසැම්බර් 31 වැනි බදාදා පෙරවරු 11 දක්වා, කොළඹ 5, ජාවත්ත පාරේ, බස්නාහිර කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 40,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1969 දෙසැම්බර් 24 වැනි දින සිට 1969 දෙසැම්බර් 28 වැනි දින දක්වා කාර්යාල වේලාවන් තුළදී පානදුර බොල්ගොඩ වැඩ ඒකකයේ කළුතර/කොළඹ/ගම්පහ හෝ රත්නපුර වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකමද, ගල් පැටවීමට සහ බෑමට උවමනා කරන දෙඹකරද, ගල් ප්‍රවාහණය කිරීමට උවමනා බර වාහන ඇති බව ඔප්පු කිරීමට සෑහෙන සහතික සහ වැඩවල පල පුරුදුතාවය දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ෆෝර්ම නිකුත් කිරීමට පෙර එම වැඩය සඳහා රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදල් කළුතර/කොළඹ/ගම්පහ හෝ රත්නපුර වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලදී හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවට ලබා ගත් කුවිතාන්සිය 1969 දෙසැම්බර් මස 28 වැනි දින හෝ ඊට පෙර කාර්යාල වේලාවන් තුළදී ඉදිරිපත් කළ යුතුයි.

4. මෙම වැඩය ගැන සියළුම විස්තර, කාර්යාල වේලාවන් තුළදී පානදුර බොල්ගොඩ වැඩ ඒකකයේ කාර්යාලයෙන් ලබාගත හැක.

වී. ඇම්. රාජතුරෙයි,
වාරිමාර්ග ඉංජිනේරු,
බොල්ගොඩ වැඩ ඒකකය.

පානදුර,
**1969 නොවැම්බර් මස 29 වෙනි දින දීය.**

12–431—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### පුහුණුමාරු 1 නැමති පුහුණු කරවීමේ බෝට්ටුව විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

" පුහුණුමාරු 1 " නමැති බෝට්ටුව විකිණීම සඳහා, ටෙන්ඩර් පත්‍ර කොළඹ 3, ගාළුමුවදොර ධීවර දෙපාර්තමේන්තුවේ ධීවර අධ්‍යක්ෂ විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ලියකියවිලි හා වැඩි විස්තර 69.12.27 වැනි දින දහවල් 12 වනතෙක් පහත අත්සන් කර ඇති අයගෙන් ලබාගත හැකිය.

ටෙන්ඩර් පත්‍ර භාරගැනීම 69.12.28 වැනි දින පෙ. ව. 10.30 ට අවසන් කරනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල රු. 200 කි.

අයි. ඕ. කේ. පී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
කොළඹ 3.
1969 දෙසැම්බර් 2 වැනිද.

12–449—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හම්බන්තොට සහ අම්පාරේ 5බී වර්ගයේ නිවාස තැනීම

ඉහතින් සඳහන් ගොඩනැගිලි තැනීම සඳහා ටෙන්ඩර් පත් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.1.11 දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ. එක් එක් ගොඩනැගිල්ල සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. එක් ගොඩනැගිල්ලකට පමණක් හෝ ගොඩනැගිලි කිහිපයකටම ටෙන්ඩර් කිරීමට ටෙන්ඩර්කරුන්ට අවකාශ ඇත.

2. කොළඹ 5, නාරාහේන්පිට, අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ පලතුරු කම්හල් පාරේ, පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත් පිළියෙල කොට ඉදිරිපත් කල යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර්කරුවන් රු. 50,000කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කලවිට 1969.12.28 වැනි දින පස්වරු 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක් (සෑම ගොඩනැගිල්ලකටම.)

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙනුවට.

1969.12.4 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පලතුරු කම්හල පාර,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ 5.

12–477—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුණ්ඩසාලේ ජල යෝජනා ක්‍රමය

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් විදුලි බලයෙන් ක්‍රියා කරවිය හැකි කේන්ද්‍රා ප්‍රසාරී වතුර පොම්ප (Centrifugal Pump) 3 ක් සහ දියෙහි ගිල්විය හැකි වතුර පොම්ප (Submercible Pumps) 3 ක් සැපයීම හා ස්ථාපනය කිරීම සඳහා 1970 ජනවාරි මස 17 වෙනි දින් ප. ව. 2.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නෝරුවේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර්කරුවන් පළාත් පාලන අමාත්‍යාංශයේ ජල සම්පාදන සහ කශල කාණු දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක ජල සම්පාදක වැඩ සඳහා රු. 50,000 කට නොඅඩු මුදලකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. (අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියකිය විලිත්,

(ආ) රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970.1.15 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම පත්‍ර නිකුත් කරනු ලැබේ.

1969 අප්‍රේල් මස 29 දින දරණ අංක 14,852 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පල කළ මගේ 1969.4.17 දින දරණ දැන්වීම අනුව මෙම තැන්පත් මුදල මතම ඒ සඳහා ඉල්ලීමක් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ඇත.

මෙම වැඩ භාර ගැනීම සඳහා ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී සේවයට යොදවනු ලබන අය සෑම අතින්ම යෝජිත වැඩ ඉටු කිරීමට සුදුසුකම් ඇති බවත්, ඉල්ලුම්කරුවන් මීට පෙර මෙවැනි කටයුතු කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969 නොවැම්බර් මස 27 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ගන්නොරුව ඉංජිනේරු අංශයේදීය.
පේරාදෙණිය.

12-354—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මාහෝ කෘෂිකර්ම මධ්‍යස්ථානය සහ ගාල්ල සහ කඩවත පශු වෛද්‍ය මධ්‍යස්ථාන තැනීම

ඉහතින් සඳහන් ගොඩනැගිලි තැනීම සඳහා ටෙන්ඩර් පත් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.1.11 දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ. එක් එක් ගොඩනැගිල්ල සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. එක් ගොඩනැගිල්ලකට පමණක් හෝ ගොඩනැගිලි කිහිප යකටම ටෙන්ඩර් කිරීමට ටෙන්ඩර් කරුන්ට අවකාශ ඇත.

2. කොළඹ 5, නාරාහේන්පිට, අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ පලතුරු කම්හල් පාරේ, පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙක කින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කල යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබාගත හැකිය.

ටෙන්ඩර් කරුවන් රු. 30,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කලවිට 1969.12.28 වැනි දින පස්වරු 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රුපියල් 50 ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක් (සෑම ගොඩනැගිල්ලකටම).

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙනුවට.

1969.12.4 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
පලතුරු කම්හල පාර,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ 5.

12-476—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

| ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය | කර්මාන්තයේ නම |
|---|---|
| 1. කුරුවිට කෝරලය | |
| | 1. ඉද්දමල්ගොඩ පැලලියැද්ද වේල්ල |
| | 2. ඉල්දමල්ගොඩ උඩදෙසියගල අමුණ |
| | 3. කැන්දන්ගමුව වීදි ඇලේ අමුණට ලෑලි සැපයීම |
| | 4. පුස්සැල්ල හල්ගහ අමුණ වේල්ලට ලෑලි සැපයීම |
| | 5. කිරිඇල්ලේ මඩකඩයාය වේල්ල ලයිනින් කිරීම |
| | 6. අකුරණ අස්සැද්දුම අමුණට ලෑලි සැපයීම |
| 2. කොලොන්න කෝරලය | |
| | 1. ගොඩවෙල කෝන්ගහයට කඩත්තලය තැනීම |
| | 2. විජේරිය පංසල ලඟ වේල්ල සහ අමුණ දියුණු කිරීම |
| 3. කඩවත මැද කෝරලය | |
| | 1. වලකුඹුරේ දඹගහමුල්ලෙ අමුණ |
| | 2. නෙල්ලිවල මහ අමුණ ප්‍රතිසංස්කරණය කිරීම |
| | 3. අලුත්නුවර බෝගහ කුඹුර අමුණ ඇල ප්‍රතිසංස්කරණය |
| 4. නවදුන් කෝරලය | |
| | 1. බඹරබොටුවේ මීගහ ඇල අමුණ තැනීම |
| | 2. ඇන්ඔය මැද කුඹුර පැති බැම්ම තැනීම |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 දෙසැම්බර් මස 25 දින දවල් 12 දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ “ රත්නපුර දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය ” යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 දෙසැම්බර් මස 26 දින දවල් 12 ට පෙර රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති “ ටෙන්ඩර් පෙට්ටියට ” දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියලුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. “ ලාංකික ” යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. “ ගොවිජන සේවා සහකාර කොමසාරිස් ” යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 දෙසැම්බර් මස 27 දින පෙරවරු 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියලුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

පී. එච්. චන්ද්‍රදාස,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
රත්නපුර දිස්ත්‍රික්කය.

රත්නපුර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගේ
කාර්යාලය,
1969 නොවැම්බර් මස 29 දින දීය.

12-437—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

**උඩ හේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශය—**

(1) ඉඩමලන්ද බෝගහලන්ද ඇළ—ප්‍රතිසංස්කරණය.
(2) හපුවෙල අත්තනමැයේ ඇළ—ප්‍රතිසංස්කරණය.
(3) මල්උල්ල කොහොඹගානේ ඇළ—ප්‍රතිසංස්කරණය.
(4) බඹරගම පුස්සල ඇළ—ප්‍රතිසංස්කරණය.
(5) වැගම බණ්ඩාර ඇළ—ප්‍රතිසංස්කරණය.
(6) ඉඩමලන්ද ආදිකාරිගම මැද ඇළ—ප්‍රතිසංස්කරණය.
(7) උඩවත්ත තොටපොළ ඇළ—ප්‍රතිසංස්කරණය.
(8) වැගම කිතුල් අරාවේ ඇළ—ප්‍රතිසංස්කරණය.
(9) උනන්තැන්න උඩ ඇළ—ප්‍රතිසංස්කරණය.
(10) උනන්තැන්න ගෙදර වෙලේ ඇළ—ප්‍රතිසංස්කරණය.
(11) ඇකිරිය බුළුගහපිටිය එළමල්ලෑව ඇළ—ප්‍රතිසංස්කරණය.

**කොත්මලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය—**

(12) නියන්ගන්දර හල්මුල්ලෙ ඇළ—ප්‍රතිසංස්කරණය.
(13) කඩදොරපිටිය වනින්නදෙනිය ඇළ—ප්‍රතිසංස්කරණය.
(14) හරන්ගල ගලඋඩපතනේ ඇළ—ප්‍රතිසංස්කරණය.
(15) මොරපේ වැරනිය ඇළ නොහොත් කොස්ගහවෙල ඇළ—ප්‍රතිසංස්කරණය.
(16) හරන්ගල රත්මල් පිටිය ඇළ—ප්‍රතිසංස්කරණය.
(17) කලපිටිය-හැඳුනුවැව, නවංගම කපුගෙදර ඇළ—ප්‍රතිසංස්කරණය.

**වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය—**

(18) මාලියද්ද උඩාරාවේ ඇළ—ප්‍රතිසංස්කරණය.
(19) යටමාදුර ඇහැළගස්අරාව ඇළ—ප්‍රතිසංස්කරණය.
(20) රූපහ ගෝනපැලැල්ල ඇළ—ප්‍රතිසංස්කරණය.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 දෙසැම්බර් මස 27 වෙනි දින දවල් 12 දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින්ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩරකරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා සීල් තබන ලද ලියුම් කවරවල බහා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ. වම් කෙළවරේ “ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය ” යනුවෙන් සඳහන් කළ යුතුය

ටෙන්ඩර් පත්‍ර, 1969 දෙසැම්බර් මස 28 වෙනි දින දවල් 12 ට පෙර නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුලත දි එම ටෙන්ඩර්කරු විසින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමඟ ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර්පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමඟ හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුම කට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 දෙසැම්බර් මස 29 වෙනි දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල්. ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඇස්. ඕ. එච්. සුපියරත්න,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
නුවරඑළිය දිස්ත්‍රික්කය.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 නොවැම්බර් මස 28 දින දීය.

12–480—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් මෙහි පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

(1) මැදිකිඳ ප්‍රා. ආ. නි. කොටසේ කොස්ලන්ද ගම්පහ ගොවි කාරක සභා ප්‍රදේශයේ හිවල් කඳුර අමුණ ප්‍රතිසංස්කරණය කිරීම.

(2) මැදිකිඳ ප්‍රා. ආ. නි. කොටසේ කඳුරුගමුව ගොවි කාරක සභා ප්‍රදේශයේ ගල කුඹුර අමුණ ප්‍රතිසංස්කරණය කිරීම.

(3) යටිකිඳ ප්‍රා. ආ. නි. කොටසේ කුඹුක්වෙල ගොවි කාරක සභා ප්‍රදේශයේ කොස්ගහකුඹුරේ ඇලේ ජල හානි ප්‍රතිසංස්කරණය කිරීම.

(4) ඌව පරණගම ප්‍රා. ආ. නි. කොටසේ උඩ පේරුව ගොවි කාරක සභා ප්‍රදේශයේ වැලි උල්ල ඇල ප්‍රතිසංස්කරණය කිරීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 දෙසැම්බර් මස 24 දින දවල් 12 දක්වා බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "................................ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 දෙසැම්බර් මස 28 දින දවල් 12 ට පෙර බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම්දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමඟ ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමඟ හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ, බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 දෙසැම්බර් මස 31 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

නෙවිල් පියදිගම,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්
බදුල්ල දිස්ත්‍රික්කය.

බදුල්ල දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 නොවැම්බර් මස 30 දින දීය.

12–361—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටැන්ඩර්

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම පිණිස ප්‍රාදේශික නියෝජිත වරුන්ගෙන් ටැන්ඩර් 1970 ජනවාරි මස 17 වෙනි දින ප. ව. 2.30 වන තෙක් භාරගනු ලැබේ :—

| ටෙන්ඩර් අංකය | | සේවය | | ටැන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඇම්. ටී. 697001 | ... | ක්‍රෝලර් ට්‍රැක්ටර් එකයි | ... | 100 | 0 |
| ඇම්. ටී. 697021 | ... | අඟල් දෙකේ පොම්ප හතක් | ... | 25 | 0 |

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු අංශය) ගෙන් ලබා ගතහැකි ආකෘති පත්‍ර මගින් ටැන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ.

3. ටැන්ඩර් පිටපත් තුනක් බැගින් එවිය යුතු අතර සැම පිටපතක්ම අත්සන් තබා මුද්‍රා තබන ලද කවරයක බහා ඉදිරිපත් කළ යුතුයි. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති යනුවෙන් ලිපිනය සඳහන් එම මුද්‍රා තබන ලද කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "70.1.17 වැනි දින වසනු ලබන ක්‍රෝලර් ට්‍රැක්ටර්/පොම්ප සඳහා ටැන්ඩර් අංකය ඇම්. ටී. 697001/697021" යන්න ලකුණු කොට එවිය යුතුයි.

4. ටැන්ඩර් පෝර්ම 70.1.16 වෙනි දින පස්වරු 2.30 වන තෙක් නිකුත් කරනු ලැබේ. ඉන්පසුව ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

5. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියකදී හෝ කොළඹ ලංකා බැංකුවේ, යෝක් වීදියේ ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට හෝ එක් එක් ටැන්ඩරය සඳහා ඉහත සඳහන් ටැන්ඩර් තැන්පත් මුදල බැරකල බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට පමණක් ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

6. වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු අංශය) ගෙන් ලබාගත හැකිවේ.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

69.10.15 වෙනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
ඉංජිනේරු අංශයේ දී ය.

12–464/1—69.12.12 දින අංක 14,884 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටැන්ඩර්

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම පිණිස ප්‍රාදේශික නියෝජිත වරුන්ගෙන් ටැන්ඩර් 1970 ජනවාරි මස 17 වෙනි දින ප.ව. 2.30 වන තෙක් භාරගනු ලැබේ :—

| ටෙන්ඩර් අංකය | | සේවය | | ටැන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඇම්. ටී. 697002 | ... | නැප්සැක් ලෝ වොලියුම් ස්ප්‍රෙයර් (අ. බ. 2–3)—19 යි | ... | 25 | 0 |
| ඇම්. ටී. 697003 | ... | බූම් ස්ප්‍රෙයර්—3 යි | ... | 25 | 0 |
| ඇම්. ටී. 697005 | ... | ට්‍රැක්ටර් ට්‍රෙයිලර්—10 යි | ... | 100 | 0 |
| ඇම්. ටී. 697006 | ... | හැන්ඩ් විනෝවර්—3 යි | ... | 25 | 0 |
| ඇම්. ටී. 697007 | ... | ගයිරෝ මුවර්—2 යි | ... | 25 | 0 |

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු අංශය) ගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර මගින් ටැන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ.

